2

සුපිළිපන් දේශයක් කරා
සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ
වැඩමුළු මාලාව




# සුපිළිපන් පුහුණුකරුවන් සදහා සම්පත් අත්පොත


අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

## සුපිළිපන් දේශයක් කරා
## සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු මාලාව

# සම්පත් අත්පොත



CIABOC

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

# සුපිළිපන් දේශයක් කරා
# සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු මාලාව
# සම්පත් අත්පොත

ප්‍රථම මුද්‍රණය - 2020 මාර්තු

ISBN- 978-624-5040-19-3

ප්‍රකාශනය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
36, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
Tel: +94 112 596360 / 1954
Mob: +94 767011954
E-mail: ciaboc@eureka.lk

මුද්‍රණය

**SWIES PRINT PACK**
124 A, Negombo Road, Kadana.

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ ඇමරිකානු නියෝජිතායතනය **(USAID)** මගින් ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය **(SDGAP)** හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලීත්වය මත මෙම ප්‍රකාශනය එළිදැක්වේ. තවද මෙම සම්පත් අත්පොතෙහි අන්තර්ගතය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වගකීමක් වන අතර අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ ඇමරිකානු නියෝජිතායතනයහි හෝ ඇමරිකානු එක්සත් ජනපද රජයේ මතයයන් කිසි අයුරකින් පිළිඹිබු නොවන බව සැලකිය යුතුයි.

9 786245 040193

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පණිවුඩය

"දූෂණය හිම ගුලියක් වැනිය. එය පෙරළී යෑම ආරම්භ වූ විට අනිවාර්යයෙන්ම විශාල වේ" ("Corruption is like a ball of snow. once it's set a rolling it must increase") යැයි 19 වන සියවසේ විසූ ඉංග්‍රීසි ලේඛකයෙකු වන චාල්ස් කොල්ටන් පවසා තිබේ. මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධිය තරම්ම ඉපැරණි ඉතිහාසයකට හිමිකම් කියන දූෂණය නමැති සංසිද්ධිය පසුගිය වසර දහස් ගණනක කාල වකවානුව පුරා ලොව දියුණු -නොදියුණු රටවල් රැසක් වෙළාගනිමින් පැතිරෙමින් පවත්නා බව දූෂණයේ ප්‍රමාණය මැන බලන ජාත්‍යන්තර දර්ශක අනුව පෙනී යයි.

එහෙත් වත්මන් ලෝකයේ තවත් සමහර රටවල් දූෂණය නැමැති කළු හිම ගුලි පෙරළීම වැළැක්වීමට පමණක් නොව ඒවා සාර්ථකව දිය කර හරිමින් දූෂණය මැඩලිය හැකි සංසිද්ධියක් බව ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වීමටද මේ වන විට සමත් වී තිබේ.

පොදු ජන ජීවිත මත විනාශකාරී ලෙස බලපෑම් කරමින් තිබෙන දූෂණය මැඩලීමට වෙර දැරූ විවිධ මට්ටම්වලට අයත් දූෂණ විරෝධීන් පසුගිය වකවානුව පුරා වැඩි පරිශ්‍රමයක් දරන ලද්දේ දූෂණ ව්‍යසනය සීමා කිරීමට අවශ්‍ය ආයතනික හා නෛතික ව්‍යුහයන් ශක්තිමත් කිරීම කෙරෙහිය.

එහෙත් නූතන ලෝකය තුළ දූෂණය මැඩලීමේ ජයග්‍රහණයන් අත්කරගෙන ඇති රටවල් සිය සාර්ථකත්වයේ නිදසුන් මගින් පෙන්වා දෙන්නේ ආයතනික හා නෛතික ව්‍යුහයන් ශක්තිමත් කිරීම පමණක් දූෂණය මැඩලීමට සාර්ථක ප්‍රතිකර්මයක් නොවන බවය. දූෂණය ජය ගැනීම සඳහා ඊට අවශ්‍ය ආයතනික හා නෛතික ව්‍යුහයන් සවිමත් කිරීමට සමාන්තරව පොදු ජනතාව දූෂණය සම්බන්ධයෙන් දැනුම්වත්, සංවේදී සහ ක්‍රියාශීලී පිරිසක් බවට පත් කිරීම ඉලක්ක කරගත් අධ්‍යාපනික ක්‍රියාවලියක් පැවැතීමේ අවශ්‍යතාවද මේ වන විට ලොව පුරා දූෂණ විරෝධී අරගල තුළ ප්‍රමුඛ කරුණක් ලෙස පිළිගැනීමට ලක්ව තිබේ.

"ශ්‍රී ලංකාව ලොව විශිෂ්ටතම දේශයක් බවට පත් කිරීම උදෙසා, සුපිළිපන් හදැති අභිමානවත් ශ්‍රී ලාංකේය පරපුරක් බිහි කිරීම" පරමාදර්ශී අභිලාශය හා දැක්ම කොටගනිමින් සම්පාදනය කොට ඇති, ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමෙහිදීද දූෂණයට එරෙහි සටනට විශාල ප්‍රජාවක් දායක කර ගැනීම කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කර තිබේ. ඉදිරි පස් වසර තුළ (2019-2023) ක්‍රියාවට නැංවීමට නියමිත එම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දෙවන උපායමාර්ගය වන්නේ සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනයහා ප්‍රජා සහභාගීත්වයයි. සැලසුමේ සෙසු උපාය මාර්ග ලෙස නිවාරණ කටයුතු, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම සහ නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුනාගෙන තිබේ.

සාරධර්ම මත පදනම්වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වය යටතේ ළමුන් හා තරුණයින් සඳහා සුපිළිපන් අධ්‍යාපනය ලබාදීම, රාජ්‍ය අංශයේ දැනුම්වත්භාවය වැඩි කිරීම, වගවීම සම්බන්ධ මහජන ඉල්ලුමක් ඇති කිරීම ආදී විවිධ ක්‍රියාකාරකම් රැසක් හඳුනාගෙන ඇත. රාජ්‍ය නිලධාරීන් අතරින් තෝරාගත් 400ක් අල්ලස්-දූෂණ විෂයය පිළිබඳ පුහුණුකරුවන් වශයෙන් පුහුණු කර, ඔවුන් මගින් සමස්ත රාජ්‍ය සේවයෙන් 25ක් ඉක්මවන පිරිසක් දූෂණ විරෝධය පිළිබඳව දැනුම්වත් පිරිසක් බවට පත් කර ගැනීමේ ඉලක්කයද ජාතික ක්‍රියාකාරී සැලැස්මේ උපායමාර්ග අතර ප්‍රමුඛ අංගයකි. එම ඉලක්කය සපුරාලීමේ අරමුණින්, රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සම්පාදනය කරන ලද මෙම සුපිළිපන් පුහුණුකරුවන් සඳහා සම්පත් අත්පොත ශ්‍රී ලංකාව තුළින් අල්ලස දූෂණය මැඬලීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ කාර්යයට විශාල පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමු.

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය සහ තාක්ෂණික සහාය ලබාදෙමින් අපට සහාය වන අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු ඒජන්සිය මගින් ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ (SDGAP) ව්‍යාපෘතියටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ මෙම ග්‍රන්ථය සම්පාදනය කළ SDGAP වැඩසටහනේ උපදේශකවරයෙකු වන නීතිඥ ජගත් ලියන ආරච්චි මහතාට සහ එම කාර්යයට දායක වූ සැමටත් අපගේ ස්තුතිය හිමි වේ.

## සුපිළිපන් දේශයක් කරා
## සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු මාලාව
## සම්පත් අත්පොත

පෙළගැස්ම | පිටු අංකය


සුපිලිපන් දේශයක් කරා 06

**පලමුවන පරිච්ඡේදය - සුපිලිපන්භාවය**

01 පිවිසුම් දොරටුව 09
02 සුපිළිපන්භාවය 13
03 රාජ්‍ය සේවයේ සුපිලිපන්භාවය 19
04 රාජ්‍ය අංශයේ සුපිලිපන්බව ඉහල නැංවීම සඳහා ඇති මෙවලම් 23

**දෙවන පරිච්ඡේදය - දූෂණය හදුනාගැනීම**

05 දූෂණය යනු කුමක්ද? 26
06 දූෂණයේ විවිධ ප්‍රභේද 32
07 දූෂණයට හේතු 37
08 දූෂණයේ ප්‍රතිවිපාක 39

**තෙවන පරිච්ඡේදය- දුෂණයට එරෙහි ජාත්‍යන්තරය**

09 දුසැරියට එරෙහි ගෝලීය පෙලගැස්ම 45
10 දුෂණය පැරදූ හොංකොං දේශය 54

**සිව්වන පරිච්ඡේදය- දූෂණයට එරෙහි ශ්‍රී ලාංකික පෙලගැස්ම**

11 දුසැරිය පිටුදකින නීති 57
12 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 68
13 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථයට ගැනෙන වැරදි 73

**පස්වන පරිච්ඡේදය-දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම්**

14 ජාතික ක්‍රියාකාරී සැලැස්ම- හැඳින්වීම 81
15 ජාතික සුපිලිපන්න සැලැස්ම 89
16 ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිලිබද ජනාධිපතිලේකම් චක්‍රලේඛනය 97

**හයවන පරිච්ඡේදය-ඔබේ දැනුමට තවරදුටත්**

17 අල්ලස හා දූෂණය පිලිබඳ නිතර අසන ප්‍රශ්න 99
18 පුහුණුකරුවන්ගේ පරිශීලනය අදාල සම්පත් ලැයිස්තුව 102

# සුපිළිපන් දේශයක් කරා

සුපිරිසිදු රාජ්‍ය සේවයක්, සෞභාග්‍යමත් දේශයක් උදෙසා රාජ්‍ය සේවයේ සුපිළිපන් බව ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව.

01. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් අප සතුව නොතිබුණි. එය සාක්ෂාත් කර ගනු වස් දිවයින පුරා ගොස් සියලු පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගනිමින් සකස් කරන ලද ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019 පෙබරවාරි මස 05 වන දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදි. එම ක්‍රියාකාරී සැලැස්ම වසර 05ක කාලයක් සඳහා එනම් 2019 - 2023 කාලය සඳහා අප රට තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය. එය සියලු රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කළ යුතු බවට ජනාධිපති ලේකම්ගේ අංක PS/ACD/01/2019 දරන හා 2019.07.04 දිනැති චක්‍රලේඛය මගින් දක්වා ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළ අප රටේ අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා ප්‍රධාන උපායමාර්ග 04ක් හඳුන්වා දී ඇත. ඒවා නම්,

a. අල්ලස හා දූෂණය නිවාරණය ක්‍රමවේදය හඳුන්වා දීම
b. යහපත් ආකල්ප වර්ධනය කිරීම
c. විමර්ශනය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම
d. නීති හා ප්‍රතිපත්ති සංශෝධනය හා හඳුන්වා දීම

මෙම උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම එක් ආයතනයක හෝ එක් පුද්ගලයෙකුගේ කර්තව්‍යයක් නොවේ. ඉදිරි වසර 05ක කාලය තුළ අපගේ ඉලක්කය විය යුත්තේ මේ රටේ අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා සාමූහික හැඟීමෙන් යුතුව එකිනෙකාට පැවරී ඇති වගකීම හා කාර්යභාරය ඉටු කිරීමයි. අල්ලස හා දූෂණය තුරන් කිරීම එක් ආයතනයක හෝ පුද්ගල කණ්ඩායමකගේ උත්සහයකින් සිදු කළ නොහැකි අතර අප රටින් අල්ලස හා දූෂණය තුරන් කිරීමට සියලු පාර්ශ්වකරුවන්ගේ කැප වීම සහ උත්සාහය තිබිය යුතු වේ.

02. වර්තමානයේ දස වැදෑරුම් රාජ්‍ය ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන ප්‍රතිපත්තියක් වන්නේ සුපිරිසිදු රාජ්‍ය සේවයක් තුළින් සෞභාග්‍යමත් දේශයක් උදා කර ගැනීමයි. සුපිරිසිදු රාජ්‍ය සේවයක් ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන පුරා සහ රාජ්‍ය නිලධාරීන් වසා පැතිර තිබෙන අල්ලස හා දූෂණය තුරන් කර නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කරමින් මහජනතාව වෙත පහසු සහ විශ්වාසදායී රාජ්‍ය සේවයක ඉඩ හසර ලබා දිය යුතුය. ඒ සඳහා අල්ලස හා දූෂණ තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීමත් තුළින් එම අරමුණු පහසුවෙන් සාක්ෂාත් කර ගත හැකි වනු ඇත.

03. අප රටේ සියලු රාජ්‍ය ආයතන මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳවත් එහි ක්‍රියාවට නැංවීම පිළිබඳවත් දැනුවත්ව සිටීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම වර්තමානය වන විට අප සියලු දෙනාගෙන්ම ගිලිහී ගොස් ඇති යහපත් ආකල්ප හා හරයන් නැවත අප තුළ වර්ධනය කර ගනිමින් රාජ්‍යතන්ත්‍රය සියලු නිලධාරීන් යහපත් ආකල්පවලින් සන්නද්ධ කළ යුතුය. ඒ අනුව ඉහත කරුණු සපුරා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු රාශියක් පැවැත්වීමට සැලසුම් කර ඇත. විශේෂයෙන්ම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ පළමු සහ දෙවන උපාය මාර්ග වන නිවාරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමත් සාරධර්ම පදනම් කර ගත් ආකල්ප ප්‍රවර්ධනය කිරීමත් යන උපායමාර්ග යටතේ රාජ්‍ය අංශයේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පුහුණු වැඩසටහන් මාලාවක් සැලසුම් කර ඇත. එහි ප්‍රධාන අරමුණු 02කි.

i. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019 - 2023 ක්‍රියාවට නැංවීම පිළිබඳව රාජ්‍ය ආයතන සහ ආයතන ප්‍රධානීන් ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

ii. රාජ්‍ය නිලධාරීන්ගේ සුපිළිපන්භාවය වර්ධනය සඳහා රාජ්‍ය නිලධාරියා තුළ සාරධර්ම සහ යහපත් ආකල්ප ඉස්මතු කිරීමේ අරමුණින් අල්ලස් දූෂණ නිවාරණ පුහුණු වැඩමුළු පැවැත්වීම.

එම අරමුණු සම්පූර්ණ කර ගැනීම සඳහා ඒ පිළිබඳව දැනුවත්භාවයෙන් යුතු පුහුණු නිලධාරී පිරිසක් සිටිය යුතුය.

04. ඒ අනුව, අමාත්‍යාංශ, පළාත්, දිස්ත්‍රික් අනෙකුත් රාජ්‍ය ආයතන මට්ටමේ තෝරා ගන්නා රාජ්‍ය නිලධාරීන් 400දෙනෙකු තෙදින නේවාසික පුහුණුවක් ලබා දෙමින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමටත් ඉන්පසු එම පුහුණුකරුවන් මගින් එක් පුහුණුකරුවෙකු පුහුණු වැඩසටහන් 20 බැගින් වන සේ වැඩසටහන් 8,000ක් පවත්වා රාජ්‍ය නිලධාරීන් 400,000ක් වෙත දූෂණ විරෝධය පිළිබඳ දැනුම හා පුහුණුව ලබා දීමට අපේක්ෂා කෙරේ.

05. එකී පුහුණුකරුවන්ගේ පසුබිම් දැනුම වර්ධනය කිරීම සඳහා තෙදින පුහුණු වැඩමුළුවට අමතරව වෙනත් උපාය මාර්ගයන්ද භාවිත කරයි. ඒ අතරින් එක් උපාය මාර්ගයක් වන්නේ මෙම සම්පත් ග්‍රන්ථයයි. අල්ලස හා දූෂණය හා සබැඳි සරල ලිපි ලේඛන රැසකින් මෙම සම්පත් ග්‍රන්ථය සමන්විත වී ඇති අතර පුහුණුකරු විසින් පරිශීලනය කළ යුතු තවත් අණපනත් හා ලිපි ලේඛන රැසක ලැයිස්තුවක්ද මෙම ග්‍රන්ථයට ඇතුළත් කර තිබේ. මෙයට අමතරව

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රකාශනයන් 05ක්ද පුහුණුකරුවන්ට ලබා දෙනු ඇත. එමගින් අල්ලස් හා දූෂණ නිවාරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළ පියවරයන් පිළිබඳව අවබෝධයක් පුහුණුකරුට ලබා ගත හැකිය.

එයට අමතරව පුහුණුකරුවන් සඳහා අණපනත් ලේඛන හා වීඩියෝ වැඩසටහන් රැසක් සහිත පෙන්ඩ්‍රයිව් එකක් ලබා දෙනු ඇත.

පුහුණු වැඩසටහන් පැවැත්වීමට පෙර මෙම සියල්ල මැනවින් පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

# පළමුවන පරිච්ඡේදය

## සුපිලිපන්භාවය

### 1-පිවිසුම් දොරටුව

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍ය බලය මහජනතාව සතු වන බැවින් හා අන් සතු කළ නොහැකි බැවින්ද මහජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම සඳහා පත් කර ඇති ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු ආයතනයන්හි මහජන නියෝජිතයන් හා නිලධරයන් මහජනතව වෙත වගකීමට හා වගවීමට බැඳී සිටී.

නමුත් වර්තමානයේ මහජනතාව අවිශ්වාසයෙන් හා සැකයෙන් මෙම ආයතන හා නිලධරයන් දෙස බැලීමට පුරුදුව ඇත. එයට හේතු වී ඇත්තේ මහජනතාව ඔවුන් වෙත පැවරූ වගකීම මහජනතාව වෙනුවෙන් නිසි අයුරින් ඉටු නොවීමත් අවංකබව, විනිවිදබව හා වගවීම මෙන්ම සුපිළිපන්බව වැනි ලක්ෂණ ආයතනික මට්ටමින් හා පුද්ගල මට්ටමින් පිළිබිඹු නොවීමත් අල්ලස හා දූෂණයෙන් ආයතන හා නිලධරයන් වෙළාගෙන තිබීමත්ය. අනෙක් අතට තමා කවුද යන්නත් ජනතාව කවුද යන්නත් මෙම සියලු ආයතනවල ඇතැම් නිලධරයන්ට අමතකව ඇත. මහජනතාව අපගේ ස්වාමියා බවත්, අප මහජනතාවගේ සේවකයන් බවත් අමතකව ඇත.

මෙසේ වීමට ප්‍රධාන හේතු නම් අප තුළ පැවති හරයන් අපගෙන් ගිලීගි යෑමත් නිරන්තරයෙන් මුදල් පසු පස දිවයෑමත්ය. අතීත ශ්‍රී විභූතිය පිළිබඳ අද උදම් අනන අප, එම හරයන් අපගෙන් ගිලිහුණේ කවදාද? ඒ හේතුව නිසාම අපට අහිමි වුණේ මොනවාද? යන්න මඳක් සිතා බැලිය යුතු කාලය එළඹ ඇත. මුළු ලෝකයේ මෙන්ම අප රටේද වැසියන්ගේ යුතුකම සහ වගකීම ඔවුන්ට අමතකව ගිය සැටියක් පෙනේ. අනෙක් රටවලටත් වඩා අප රටේ වැසියන්ට එය වඩාත් අදාළ වේ.

පෙර දින අප මිනිසුන් ගැන පමණක් නොව සතා සිවුපාවා ගහකොළ, ඇළ දොළ, භූමිය මේ සියලු දේම රැක බලා ගත්තේ ඒ සියල්ලටම ගරු කරන ලද්දේ ඒ සියල්ලටම අපි හදවතින් බැඳී සිටි හෙයිනි. එදා අප අපගේ මේ මහපොළොව මත යම්කිසි කටයුත්තක් ආරම්භ කරන ලද්දේ පොළෝ මහී කාන්තාවට වැඳ නමස්කාර කර අවසර ගනිමිනි. ලෝකය පවතින්නේ හිරුගේ රැස්වලින් සහ මවගේ කිරිවලින්

යන අරුත සැබෑවටම වටහාගෙන සිටි අතීත වැසියන් හිරුට වැඳ අවසර ගනිමින් ගොවිතැන් කටයුතු ආරම්භ කළේ එම හේතුවෙනි. අපට වගේම ජීවත් වීමේ අයිතියක් සතා සිවුපාවාටත් ඇතැයි සිතු අපගේ පුරාතනයන් කුඹුරෙන් ලියද්දක් කුරුල්ලන්ට වෙන් කළේ එහෙයිනි. එදිනෙදා අපගේ ජීවිතයට අවශ්‍යම වන ජල බිඳ අපට දෙන වැවට, පොකුණට, ඇළට, දොළට, ළිඳට වැඳ නමස්කාර කර අවසර ගත්තේ එබැවිනි. අපට මේ ස්වභාව ධර්මයෙන් ලැබී තිබෙන සියලු දායාදයන් ගැන සේම මිනිස් සබඳතා පිළිබඳවද අප පුරාතනයන් සිතුවේ පරාර්ථකාමී හැඟීමෙන් යුතුවය. අනෙකා ගැන සහානුකම්පාවක් සැවොම තුළම තිබිණි. මා මෙන්ම අනෙකාටද මේ මහපොළොව මත අප දේශය තුළ එකාවන්ව එකට ජීවත්වීමේ ඇති අයිතිය ඔවුන් මනාව වටහා ගෙන තිබුණි.

## ආගන්තුක සත්කාරය

ආගන්තුක සත්කාරයෙන් අනෙකා ගැන උණුවන හදෙන් යුතුව සිටි අප අනෙකාගේ වැඩපොළට උදව් වූයේ යමක් ආපිට බලාපොරොත්තුවෙන්ම නොවේ. එකිනෙකාගේ වැඩට තම තමන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙමින් සහයෝගයෙන් වැඩ කළ අතීතයක් අපට තිබේ. අත්තම් ක්‍රමය ඊට හොඳම උදාහරණයයි.

මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම් පියතිස්ස රජතුමාට පහදා දුන්නේ රටක පාලකයා, රටේ අයිතිකරුවා නොව භාරකාරයා පමණක් බවයි. එක වැවකට එකතු වන ජලය ඇළ මාර්ග පොකුරක් හරහා ගොවීන් දස දහස් ගණනකගේ කුඹුරු අක්කර ලක්ෂ ගණනකට එකවර බෙදා දීමට ක්‍රමවේදයන් සකස් කළේ මේ රටේ සම්පත්වල අයිතිය එක් තැනැත්තෙකුට පමණක් නොව මුළු මහත් සමාජයටම සාධාරණව බෙදී යා යුතු බව අපට යළි යළිත් සිහි කරමිනි. එමෙන්ම එම වැවෙන්ම වැව් ඉහත්තාවෙන් ජලය පානය කළ අලි ඇතුන් මුව පොව්වන් අපට මතක් කර දුන්නේ මේ සියලු සම්පත්වල අයිතිය මිනිසුන්ට පමණක් නොව වන සිවුපාවන්ටද අයිති බවය.

## සුපිළිපන්බව

මේ සියල්ලම අද යළි යළිත් මතක් කරන්නට සිදුව ඇත්තේ මේ සියලු හරයන් අද අපට අමතකව ගොස් ඇති බැවිනි. එපමණක් නොව විටෙක වෙනත් රටකින් එම හරයන් ආනයනය කරන්නට සිදු වේ දැයි සිතෙන තරමටම මේ හරයන් අපගෙන් ඈත්ව ගොසිනි. සුපිළිපන් බව ඉහළින්ම තිබූ අප රටේ සුපිළින් බව අද ගිලිහී ගොස් ඇත. හරයන්ගෙන් තොර මිනිසුන්යැයි වෙනත් බටහිර ලෝකයේ රටවලට බැණ අඬ ගැසූ අපටම ඔවුන්ගෙන් අද සුපිළිපන්බව ආනයනය කරන්නට සිදු වී ඇත. විශ්වාසය, වගකීම, සහානුකම්පාව, නීතිගරුක බව, විනය, ඍජු බව, ප්‍රතිපත්තිගරුක බව යන ලක්ෂණ වලින් හෙබි සුපිළිපන් බව (Integrity) අද අප තුළ දක්නට නොමැත.

සමහර රටක පාර අයිනේ ඇති මුදලාලි කෙනෙකු නැති පත්තර රාක්ක ඇත. පත්තරයේ වටිනාකම ඒ සඳහා ඇති පෙට්ටියකට පත්තරයේ වටිනාකමට සරිලන මුදල දමා පත්තරය රැගෙන යා හැකිය. වෙනත් රටක සංචාරක අත්දැකීම් ඇති කෙනෙකුට

මෙවැනි බොහෝ කරුණු සිහිපත් වනු ඇත. උදාහරණයක් ලෙස තවත් සමහර රටවල විවේකාගාරයක් තුළ අමතකව ගිය රන් භාණ්ඩයක් දවස් ගණනක් ගත වුවද කිසිවෙකුත් රැගෙන නොයා එලෙසින්ම එහිම තිබෙනු දකින අත්දැකීම්ද නැතුවාම නොවේ.

කිසිවෙක් බලා සිටියද නොසිටියද වරදක් නොකිරීමට එම රටවල මිනිසුන් උත්සාහ ගනිමින් සිටිනු පෙනේ. මනා පිළිවෙතකට ඔවුන් පය තබා ඇත. එය සුපිළිපන් බවේ ආරම්භයයි.

## නීතිය පිළිපදින්නේ නීතියට ඇති බය නිසා පමණද?

අප රටේ අත්දැකීම්ද මෙවැනිදැයි අප අපගෙන්ම විමසා ගත යුතු කාලය එළඹ ඇත. අද අප නීතියට ගරු කරන්නේ හෝ නීතියට හිස නමන්නේ නීතිගරුක පුරවැසියන් වශයෙන් නීතිය පිළිපැදිය යුතු බව සිතන නිසාද, එසේ නොමැති නම් දඬුවමට ඇති බිය නිසාද යන්න අප තේරුම් බේරුම් කර ගත යුතුය. නීතිගරුක පුරවැසියන් වශයෙන් නීතිය පිළිපැදිය යුතු බව අප සිතන නිසා නීතිය පිළිගනී නම් නීතිය කඩ වූවාද යන්න සොයා බැලීමට නීතිය කඩ කළ අයට දඬුවම් දීමට නිලධාරීන් ආයතන හා අධිකරණ අවශ්‍ය නැත. නමුත් නීතියට ඇති බය නිසා නීතිය පිළිපැදීමට උත්සාහ කරන අය සිටින රටක හැම විටම නීතිය කඩ කරනවාදැයි ඇහැ ගහගෙන බලා සිටින්නට, එසේ කඩ කරන අයට දඬුවම් දෙන්නට නිලධරයන් හා ආයතන තිබිය යුතුම වේ.

## රතු පාට සංඥාව

නිදසුනක් ලෙස රාත්‍රී කාලයක පාරේ ගමන් කරන විට කිසිවෙකුම නොමැති පාරක රතු පාට සංඥාව දැල් වී ඇති අවස්ථාවක එම ස්ථානය පසු කරන්නට යන වාහන රියදුරෙකු කොළ එළිය දැල්වෙන තුරු බලා සිටිනවාද එසේ නොමැති නම් පොලිස් නිලධාරියෙකු හෝ කිසිවෙකුත් බලා නොසිටින නිසා රතු එළිය දැල්වී තිබියදීම එම ස්ථානය පසු කර යනවාද යන්න තීරණය වන්නේ එම පුද්ගලයා නීතියට ගරු කරනවාද එසේ නොමැති නම් දඬුවමට බය නිසා නීතිය කඩ නොකිරීමට උත්සාහ ගන්නවාද යන කාරණයයි. අප සුපිළිපන්භාවය ගැන කතා කළ යුතු වන්නේද මේ හේතුව නිසාය. සුපිළිපන්බවෙන් යුතු පුද්ගලයෙකු හැමවිටම නීතිගරුක වන්නේ, විනයගරුක වන්නේ, වගකීමෙන් යුතු පුද්ගලයෙකු ලෙස හැසිරෙන්නේ, අනෙකාගේ විශ්වාසය ආරක්ෂා කරන්නේ, රටට ආදරය කරන පුරවැසියෙකු වන්නේ නීතියට ඇති බය නිසාම නොව ඔහු හැම විටම කිසිවෙකු බලා සිටියත් නොසිටියත් නිවැරදි දේ කිරීමට පෙළෙඹෙන නිසාය.

## හෘද සාක්ෂිය

අද දිනයේදී මේ සුපිළිපන් බව ගැන අප කතා කළ යුතු වන්නේම එහි ඇති අගය නිමක් නොමැති නිසාමය. අතීත හරයන්, අතීත වටිනාකම් යළි කැඳවීම අවැසි වන්නේ ඒ නිසාමය. තමන්ට හිමි නොමැති, අනෙකාගෙන් ලබන තෑග්ගක් ගැනීමට තමන්ට පැවරී ඇති කටයුත්තක් ඉටු කර දීමට තුටු පඬුරක් බලාපොරොත්තු වන්නේ අනෙකා ගැන උණුවන හදක් සහ අප වෙත පැවරී ඇති මහා වගකීම සහ භාරය පිළිබඳ වැටහීමක් තේරුම් ගැනීමක් නොමැති නිසා ය. මේ නිසාම කිසිදු හිරිකිතයකින් තොරව සමස්ත රටකට හිමි සමස්ත සමාජයකට හිමි අනාගත දරු පරපුරට හිමි සම්පත් එක් පිරිසක් භුක්ති විඳිමින් පරිහරණය කරමින් තමන්ට වාසි සලසා ගනිමින් සිටී. පොදු දේපළවල හිමිකම රාජ්‍ය දේපළවල හිමිකම සමස්ත සමාජයටම තිබේය යන්න එපමණක් නොව අප මේ භුක්ති විඳින්නේ අනාගත පරපුරෙන් සම්පත් ණයට ඉල්ලා ගෙන බව අද වන විට සියලු තනතුරු ආවරණය වන පරිදි ඉහළ සිට පහළටම බොහෝ රජයේ නිලධාරීන්ට අමතකව ගොස් ඇත. පුරවැසියන්ට රටේ සම්පත් අප ආරක්ෂා කළ යුතු බව ඒ සියල්ලේම අයිතිය හැමෝටම ඇති බව අමතකව ඇත. සියල්ලෝ තම තමන් ගැන පමණක් සිතමින් ආත්මාර්ථකාමීබවෙන් යුතුව සියල්ල පොදි ගසමින් සිටිති. අල්ලපු ගෙදර පුද්ගලයාට වඩා ඉහළට යන්නට, ඒ ගෙදර දරුවාගේ පාසලට වඩා උසස් පාසලකට තම දරුවා යවන්නට, ඔවුන් මිල දී ගන්නා කාර් රථයට වඩා වටිනාකමින් ඉහළ කාර් රථයක් මිල දී ගන්නට මාන බලනවා මිස අද බොහෝ දෙනෙකුට හරයන්ගේ ඇති වටිනාකම නොදැනේ. මේ නිසාම හරයන් ඉහළ සිට පහළටත් පහළ සිට ඉහළටත් සමාජයේ හැම තරාතිරමකම පුද්ගලයෙකු තුළටම කාවැද්දිය යුතුව ඇත.

## 2-සුපිළිපන්භාවය

### බටහිර අර්ථය

සුපිළිපන් යනු ඉංග්‍රීසි භාෂාවෙන් Integrity යන වචනය අර්ථ දැක්වීම සඳහාම සම්පාදනය කර ඇති සිංහල වචනයයි. සුපිළිපන්භාවය යන්නෙහි වචනාර්ථය තව දුරටත් විග්‍රහ කළ විට ''මනා පිළිවෙතින් සපිරි" වැනි අරුතක් එයින් ගම්‍ය වේ.

Oxford ශබ්ද කෝෂය Integrity යන්න අර්ථ දක්වන්නේ "The quality of being honest and having strong moral principles" (අවංකවීම සහ ශක්තිමත් සදාචාරාත්මක මූලධර්ම පැවතීම) ලෙසය. මලලසේකර ශබ්ද කෝෂය Integrity යන්නට සිංහල අරුත් සැපයීමේදී සෘජුකම; ආර්ජවය; අවංකත්වය; සාධු ගුණය වැනි වචන කිහිපයක් භාවිත කර තිබේ.


සුපිළිපන්භාවය යනු කුමක්ද? යන්නට නිශ්චිත සම්මත නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත් වී නොමැති වුවද ඒ පිළිබඳව ඉදිරිපත් වී ඇති විවිධ නිර්වචන සහ පැහැදිලි කිරීම් ඇසුරින් එයින් ගම්‍ය වන අර්ථය තේරුම් ගැනීමට අපහසු නොවේ.

- සුපිළිපන්භාවය යනු තමාට සත්‍යවාදී වීමයි. අවංකභාවය වනාහී අන්‍යයන්ට සත්‍ය පැවසීමයි.
  (Integrity is telling myself the 'truth’ honestly is telling the truth to other people)
  -ඇමරිකානු ජාතික ලේඛක ස්පෙන්සර් ජොන්සන්

- සුපිළිපන්භාවය යනු පහසු විකල්පය සහ නිවැරදි ක්‍රියාව අතරින් එකක් තෝරා ගැනීමයි
  (Integrity – Choice between what is Convenient and what is right)
  -ටෝනි ඩන්ජි

- සුපිළිපන්භාවය යනු අන්‍යයන් ඔබගේ ක්‍රියාව පිළිබඳ බලා නොසිටින අවස්ථාවකදී පවා නිවැරදි දේ කිරීමයි
  (Integrity is doing the right things even no one is watching)
  -බ්‍රිතාන්‍ය විද්වත් ලේඛක සී.එස්. ලුවිස්

ඉහත නිර්වචන සහ පැහැදිලි කිරීම් වලින් ගම්‍ය වන අර්ථය අනුව සුපිළිපන්භාවය යනු අවංක වීම, සදාචාරාත්මක වීම, ආචාරධාර්මිකබව, යහගුණ මත පිහිටා ක්‍රියා කිරීම, සම්මුති විරහිතව සදාචාරාත්මක මූලධර්ම හා සාරධර්මවලට අනුකූලව ක්‍රියාත්මක වීම වැනි වටිනාකම් (Values) සහ ක්‍රියාවන්ගේ (Action) සම්මිශ්‍රිත තත්ත්වයක් ලෙස සැලකීම වඩාත් සාධාරණ බව පෙනේ.




සුපිළිපන්භාවය- පුද්ගලයෙකුගේ වටිනාකම් සහ ක්‍රියාවන් අතර සම්මිශ්‍රණයකි.
ඉංග්‍රීසි ජාතික ලේඛක සී.එස්. ලුවිස්

සුපිළිපන්භාවයෙන් යුතු පුද්ගලයෙකු, සමාජය ඉදිරියේ අන් අයට සත්‍යවාදී පුද්ගලයෙකු විය යුතුවා මෙන්ම තමාගේ හෘද සාක්ෂිය ඉදිරියේ තමාටද සත්‍යවාදී පුද්ගලයෙකු විය යුතුය.

## සුපිළිපන්භාවය හා බැඳුණු වටිනාකම්

සුපිළිපන්භාවය හා බැඳී ඇති වටිනාකම් ලෙස පහත ගුණාංග හඳුනාගත හැකිය.

- ධාර්මිකත්වය - RIGHTEOUS
- ගරුත්වය - HONORABLE
- සත්‍යවාදීබව - TRUTHFUL
- නිදොස්බව - BLAMELESS
- සුන්දරත්වය - GRACEFUL
- ඍජුබව - UPRIGHT
- විනීතබව - DISCIPLINED
- භක්තිමත් බව - FAITHFUL
- පවිත්‍රත්වය/ශුද්ධබව - HOLY

සුපිළිපන්බව යනු අවංක වීම සහ ශක්තිමත් සදාචාරාත්මක හා සදාචාරාත්මක මූලධර්ම හා සාරධර්මවලට අනුකූලව හා සම්මුති විරහිතව පිළිපැදීමයි. ආචාරධර්මවලදී, සුපිළිපන්බව කෙනෙකුගේ ක්‍රියාවන්හි අවංකභාවය සහ සත්‍යවාදී බව හෝ නිරවද්‍යතාව ලෙස සැලකේ. සුපිළිපන්බව කුහකකමට එරෙහිව නැගී සිටිය හැකිය. සුපිළිපන්බව ප්‍රමිතීන් සමඟ විනිශ්චය කිරීම යනු අභ්‍යන්තර අනුකූලතා ගුණධර්මයක් ලෙස සලකන අතර, තමන් තුළම ගැටුම්කාරී සාරධර්ම ඇති පාර්ශ්වයන් විෂමතාවට හේතු විය යුතු බව හෝ ඔවුන්ගේ විශ්වාසයන් වෙනස් කළ යුතු යැයි යෝජනා කරයි. Integrity යන වචනය පරිණාමය වූයේ සම්පූර්ණ හෝ සම්පූර්ණ යන අර්ථය ඇති ලතින් අක්ෂර වින්‍යාසයෙනි.

මෙම සන්දර්භය තුළ, සුපිළිපන්භාවය යනු අවංකභාවය සහ චරිතයේ අනුකූලතාව වැනි ගුණාංග වලින් ලබාගත් "සුපිලිපන්නභාවය" පිළිබඳ අභ්‍යන්තර හැඟීමයි. එනිසා, අනෙක් අය තමන් සතු යැයි කියා ගන්නා සාරධර්ම, විශ්වාසයන් සහ මූලධර්ම අනුව ක්‍රියා කරන තාක් දුරට "සුපිලිපන්නභාවය" ඇති බව කෙනෙකුට විනිශ්චය කළ හැකිය.

## සුපිළිපන්භාවයේ ප්‍රධාන කරුණු

සුපිළිපන්භාවයේ ප්‍රධාන කරුණු 6ක් පවතින බවට ලොව පුරා පිළිගැනීමකට ලක්ව ඇත. එකී ප්‍රධාන කරුණු හා එම කරුණුවල ලක්‍ෂණ පහත පරිදි විස්තර කළ හැකිය.

| සුපිලිපන්නභවේ කරුණු | ලක්‍ෂණ |
|---|---|
| 01. විශ්වාසවන්නතභාවය<br>TRUSTWORTHINESS | ■ අවංකබව හා විනයගරුකබව<br>■ වංචාවෙන් හා හොරකමින් තොරවීම<br>■ විශ්වාස කළ හැකිඅයෙකු වීම<br>■ නිවැරදි දේ කිරීමට ඇති ධෛර්ය හා කැමැත්ත<br>■ හොඳ පැවැත්මක් තිබීම හා ලද දෙයින් සතුටු වීම |
| 02. ගෞරවනීයත්වය<br>RESPECT | ■ අන්අයට ගෞරවකිරීම<br>■ වෙනස්වීම් වලදී ඉවසා සිටීම<br>■ ආචාරශීලීවීම හා නිවැරදි වචන භාවිතය<br>■ කායිකව හෝ මානසිකව අන්අය තළා පෙළීමෙන් වැළකීම<br>■ අන්‍යයන් සමච්චලයට ලක් නොකිරීම<br>■ අන්අය පහත් කොට නොසැලකීම හා නම්‍යශීලිබව<br>■ එකඟතාවයන් නොවුණු අවස්ථාවලදී තරහව පාලනය කර සාමයෙන් හැසිරීම |
| 03. වගකීම<br>RESPONSIBILITY | ■ කළයුතුදේ පමණක් කිරීම<br>■ පසුබට නොවී උත්සහවන්ත වීම<br>■ සැමවිටම හොඳම දේ පමණක් කිරීම<br>■ ස්වයං විනය<br>■ සැම විටම නිවැරදිව ක්‍රියාකිරීමට උත්සාහ කිරීම හා වැරදික්‍රියාවල ආදීනව ගැන සිතීම<br>■ ඔබගේ තේරීම සඳහා වගකීමක් තිබීම<br>■ වගවීමෙන් ක්‍රියාකරන්නෙකු වීම<br>■ තමා මෙන්ම තම අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම<br>■ තමා සිදුකරන කාර්යන් පිළිබඳ වගකීම තමා දැරීම<br>■ කරනදේ කියන කියන දේ කරන අයෙකු වීම<br>■ ප්‍රතිපත්තිගරුකබව |

| සුපිලිපන්නභවේ කරුණු | ලක්ෂණ |
|---|---|
| 04. සාධාරණත්වය/ සමාතාත්මතාව FAIRNESS | ■ නීතියට අනුව කටයුතු කිරීම<br>■ සෑමවිටම අවස්ථාවන් අනුන් සමග සමසේ බෙදා ගැනීම<br>■ විවෘත මනසක් තිබීම හා අන්අයට ඇහුම්කන් දීම<br>■ සෑමට එක හා සමානව සැලකීම<br>■ විශේෂ අවශ්‍යතාව ඇති අය කෙරෙහි අවධානය යොමු කිරීම |
| 05. සැලකීම CARING | ■ අනුකම්පා සහගතබව<br>■ ඔබේ සානුකම්පිත බව හා අන්අය පිළිබඳ ඇති අවධානය<br>■ කෘතඥ බව ප්‍රකාශ කිරීම<br>■ අන්අයට සමාව දීම<br>■ අවශ්‍යතා ඇති පුද්ගලයන්ට උදව් කිරීම |
| 06. පුරවැසිභාවය CITIZENSHIP | ■ ආයතනයට, අවට සමාජයට, රටට අවශ්‍ය වැඩ කොටස නොපිරිහෙළා ඉටුකිරීම<br>■ යුතුකම් ඉටු කරන්නෙකු වීම<br>■ සහයෝගයෙන් වැඩ කළ හැකිබව<br>■ යහපත් අසල්වැසියකු / මිතුරකු වීම<br>■ නීතියට යටහත් වීම<br>■ අධිකාරිත්වයට, නායකත්වයට ගරු කිරීම<br>■ රටට,සමාජයට ආදරය කරන්නෙකු වීම |

### සුපිළිපන්බව පිළිබඳ ලාංකික පිළිගැනීම-

'සුපිළිපන්' යන වචනය 'සුපටිපන්න' නැමති පාලි වචනයෙන් නිෂ්පන්න වූ වචනයකි. සුපටිපන්න යන්න සංඝරත්නයේ ගුණයක් වන 'මනා පිළිවෙතින් සපිරි' යන අර්ථය සඳහා යොදන පාලි වදනයි. මෙයින් අදහස් කරන්නේ දුසැරියෙන් තොර බවයි. ඒ අනුව සුපිළිපන් බව යනු චරිත ලක්ෂණයකි. සුපිළිපන් පුද්ගලයා වැරදි නොකරන්නේ වරද හසු වී දඬුවම් ලැබේ යැයි බියෙන් නොවේ. වරදක් නොකිරීමේ චරිත ලක්ෂණය නිසාය.

මෙම චරිත ලක්ෂණයන්ගෙන් හෙබි ශ්‍රී ලාංකිකයන් ගැන ඉතිහාසයෙන්ද අසන්නට ලැබේ. දුටුගැමුණු රජතුමා මහා ස්තූපය හෙවත් රුවන්වැලි සෑය ගොඩනැගීමෙන් අනතුරුව එකී ඉදිකිරීමට දායක වූ පුරවැසියන්ට ගෙවීම් සිදු කිරීම සඳහා උපයෝගී කරගත් උපක්‍රමය වූයේ සතර වාහල්කඩ කාසි කල්දේරම් 4ක් තබා තමන් මෙම ස්තූපය ඉදිකිරීමේදී කැප කළ ශ්‍රමයට අදාළ මුදල් එම කල්දේරම්වලින් ලබාගන්නා ලෙස ප්‍රචාරය කිරීමයි. එහිදී පුරවැසියන් පැමිණ නියමිත පරිදී මුදල් රැගෙන ගිය බව දක්වේ. ස්තූප කර්මාන්තයට දායක නොවූ අයෙකුට පවා මුදල් ලබාගැනීටම හැකියාව තිබුණද එසේ නොකළ බව වාර්තා වේ.


## අසීරු අවස්ථාවන්හිදී පවා සුපිළිපන්බව ආරක්ෂා කිරීම

අසීරු අවස්ථාවකදී පවා නිවැරදි දෙය කිරීමට හැකියාව කෙනෙකු සතු වේ නම් එය යහපත් මාවතට පිළිපන් පුද්ගලයෙකු සතු ලක්ෂණයකි. සුපිළිපන්බව ළඟා කර ගැනීම අපහසු බව, දුෂ්කර බව කෙනෙකුට හැඟී යා හැකි වුවද සුපිළිපන්බව දුෂ්කරතා මධ්‍යයේ වුවද ආරක්ෂා කර ගත හැකි නම් පුද්ගල පරිපූර්ණත්වය ළඟා කර ගැනීමේ මාවතට අප අවතීර්ණ වන අතර සෑම අංශයකම දිගුකාලීන පැවැත්ම ඇති වනු දැකිය හැකි වනු ඇත.




මුහුදෙහිත් ගොඩබිමෙහිත් එක සේ ජීවත් විය හැකි කැස්බෑවකුට දිගු කාලීන ජීවිතයක් හිමිය. කෙතරම් දුෂ්කරතා මධ්‍යයේ වුවද සිය ජීවන පැවැත්ම රැක ගනිමින් දිගු කාලීන ජීවිතයක් ගත කරයි. පරිසර වෙනස් වීම විඳ දරා ගනිමින් එයට මුහුණ දෙමින් සිය ජීවිතය රැක ගැනීමට උත්සහ ගනී. සුපිළිපන් මාවතට පිළිපන් පුද්ගලයාද කොතරම් දුෂ්කරතා මධ්‍යයේ වුවද ඍජු හා අචල පැවැත්මෙන් යුතුව සිය ගුණ දහම් නොනසා පවත්වා ගැනීමට උත්සාහ කරයි.

එමෙන්ම සත්‍යය හැම විටම සත්‍ය වේ. අසත්‍යය හැම විටම අසත්‍ය වේ. "අන් කිසිවෙක් විශ්වාස නොකළත් සත්‍යය සැම විටම සත්‍යයකි..... අසත්‍ය සැම විටම අසත්‍යයකි.."



විටෙක  W. Clement Stone නම් විද්වතා පවසා ඇත්තේ මෙසේය.

" Have the courage to say no.
Have the courage to face the truth.
Do the right thing because it is right.
These are the magic keys to living your life with integrity"

වැරදි දෙයට එරෙහි වන්නට, එයට බැහැ කියන්නට, සැම විටම සත්‍ය කතා කරන්නට, නිතරම නිවැරදි දේ කරන්නට හැකි නම් ඔබ සුපිළිපන් ජීවිතයකට පිළිපන් කෙනෙකු වේ.

බුදු හිමියන් විටෙක දේශනා කර ඇත්තේ පුද්ගලයා 'යථාවාදී තථාකාරී ගුණයෙන්' යුතු විය යුතු බවයි.

**'කියන දේ කරන, කරන දේ කියන අයෙකු'** විය යුතු බවයි.

## සුපිළිපන් විය යුත්තේ කවුරුන්ද?

සුපිළිපන් විය යුත්තේ කවුරුන්ද? යන ප්‍රශ්නයේදී පුද්ගලයා පමණක් සුපිළිපන් වීම ප්‍රමාණවත් නැත.

1. පුද්ගලයා සුපිළිපන් විය යුතුය
2. සමාජය සුපිළිපන් විය යුතුය
3. ආයතන සුපිළිපන් විය යුතුය
4. රටක් සුපිළිපන් විය යුතුය
5. ලෝකය සුපිළිපන් විය යුතුය

පුද්ගල කණ්ඩායම් එකතුව සැදුම් ලත් සමාජයත්, ඒ මතින් ආයතනත්, සමස්ත දේශයත්, දේශයන්ගෙන් සැදුම්ලත් ලෝකයත් සුපිළිපන් විය යුතුය.

විශේෂයෙන් දේශයක සුපිළිපන්භාවය ගැන අවධානය යොමු කිරීමේදී රටක සැම ස්ථරයක්ම, ආයතනයක්ම සුපිළිපන් විය යුතුය. එහිදී,

1. නීතිය හදන තැන
2. නිතිය ක්‍රියාත්මක කරන තැන
3. යුක්තිය පසිඳලන තැන
4. රාජ්‍ය අංශය
5. පුද්ගලික අංශය
6. ආගමික, මාධ්‍ය හා සිවිල් සමාජය ඇතුළු සියලු අංශ
7. මහජනතාව
8. අනාගත පරපුර වන තරුණයන් හා ළමුන් සුපිළිපන් විය යුතුය.

එම සියලු අංශයන්හි ආයතන මෙන්ම පුද්ගලයන් සුපිළිපන් විය යුතුය. සුපිළිපන් දේශයක් ළඟා කර ගත හැකි වන්නේ එවිටය.

## 3-රාජ්‍ය අංශයේ සුපිළිපන් බව

ඉහත සඳහන් අංශ අතරින් මෙහිදී විශේෂ අවධානයට යොමු කරන්නේ රාජ්‍ය අංශයයි. රාජ්‍ය අංශයේ සුපිළිපන් බව කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය.

1. රාජ්‍ය ආයතනයේ සුපිළිපන් බව
2. රාජ්‍ය නිලධාරියාගේ සුපිළිපන් බව

### රාජ්‍ය නිලධාරියාගේ සුපිළිපන් බව

රාජ්‍ය සේවය ඉහළ ප්‍රමිතීන්ගෙන් හා පහත දැක්වෙන සාරධර්මවලින් යුක්තව කටයුතු කළ යුතුය.

- සේවයට කැප වීම
- ආචාරශීලීත්වය
- අවංක බව
- විනීත හැසිරීම

මෙම සාර්ධර්ම සමග කටයුතු කරන රාජ්‍ය සේවකයකු සුපිළිපන්භාවයකින් යුක්තව කටයුතු කිරීමද අපේක්ෂා කරයි. රාජ්‍ය නිලධාරියෙකුගේ සුපිළිපන්බව කෙරෙහි අවධානය යොමු කිරීමේදී සිය ක්‍රියාව කෙරෙහි වගවීම, සිය කාර්ය කෙරෙහි ඇති නිපුණබව හා ආචාරශීලි පැවැත්ම ඇති අයෙකු විය යුතු අතර අල්ලසින් හා දූෂණයෙන් තොර අයෙකු විය යුතුය. එමෙන්ම අවංකබවත් විනිවිදබවත් විශ්වාසවන්ත බවත්, ගෞරවනීයබවත්, අන් අය කෙරෙහි සැලකිල්ලෙන් යුතු බවත්, අනිවාර්යයෙන්ම තිබිය යුතුම වේ.

**Integrity: I = a (A C E) – c**
**Integrity is the alignment (a) of Accountability (A) / Competence (C) / and Ethical behaviour (E), without corruption* (c)**

### සුපිළිපන් රාජ්‍ය නිලධරයකු ලෙස ඔබ කළ යුතු දේ

- ඔබගේ රාජකාරිය හා වගකීම් ඉටු කළ යුතුයි.
- ඔබත් සමග කටයුතු කරන සෑම අයෙකුගේම විශ්වාසය හා කැපවීම තහවුරු වන පරිදි ඔබ සෑම විටම වෘත්තීමය ගුණාත්මක බව පවත්වා ගත යුතුය.
- රාජ්‍ය දේපළ හා මුදල් නිසි හා කාර්යක්ෂම ලෙස යෙදවීමට වගබලා ගත යුතුයි.
- මහජනතාව සමග කටයුතු කරන විටදී හැකි උපරිම මට්ටමෙන් සාධාරණව කර්යක්ෂමව කලට වේලාවට සහ සංවේදී අයුරින් ක්‍රියා කිරීමට වගබලාගත යුතුය.

- පවතින නෛතික රටාවට පටහැනි නොවන පරිදි හැකිතාක් විවෘතව තොරතුරු මෙහෙයවිය යුතුයි.

- නීතියට අනුකූලව කටයුතු කරමින් යුක්තිය පසිඳලීම ප්‍රවර්ධනය කළ යුතුයි.

## සුපිළිපන් රාජ්‍ය සේවකයකු ලෙස ඔබ නොකළ යුතු දේ

- ඔබගේ නිල තත්වය පුද්ගලික ලාභ ප්‍රයෝජන පිණිස අයථා ලෙස පරිහරණය නොකළ යුතුය. උදාහරණයක් ලෙස නිල තත්වය හේතුවෙන් ලබාගන්නා තොරතුරු ස්වකීය පුද්ගලික වාසි පිණිස යොදා ගැනීම නොකළ යුතුය.

- ඔබගේ රාජකාරි මට්මටමේ වාසියක් හෝ බලපෑමක් අපේක්ෂා කිරීමට ඔබගේ තිරණයන්ට හෝ සුපිළිපනභාවයට බලපෑමක් වීමට ඉඩ ඇති පුද්ගලයන් වෙතින්, පුද්ගලික ත්‍යාග, සැලකීම් හෝ වෙනත් ප්‍රයෝජන ගැනීම නොකළ යුතුය.

- නිසි අවසරයක් නොමැතිව නිල තොරතුරු හෙළිදරව් නොකළ යුතුය. ඔබ රාජ්‍ය සේවයෙන් බැහැර වුවද මෙම වගකීමෙන් මිදෙන්නේ නැත.


- නිලධරයකු විසින් ස්වකීය පෞද්ගලික කටයුතුත් රාජකාරි කටයුතුත් අතර ගැටුමක් ඇති වන අන්දමේ කිසිම දෙයක් හෝ සිය නිල කටයුතුවලට අවහිර වන අන්දමේ කිසිම දෙයක් හෝ නොකළ යුතුය. ඔහු සෑම විටම හැසිරිය යුත්තේද එබඳු ගැටුම් මාත්‍රයක්වත්, අවහිරයක්වත් පැන නැගීමට ඉඩක් නොලැබෙන පරිද්දෙන් ඔහු විසින් විශේෂයෙන්ම ආයතන සංග්‍රහයේ XXIX වැනි පරිච්ඡේදයේ සහ තත්කාලයේ පවත්නා විධිවිධානයන් සුපරික්ෂාකාරීව පිළිපැදිය යුතුය.

## රාජ්‍ය නිලධාරියා තමා වෙත පැවරී ඇති මහාභාරයේ වගකීම් නිවැරිදිව ඉටු කරනවාද?

- රාජ්‍ය නිලධාරියා සේවයට අවතීර්ණ වන්නේ රාජ්‍ය සේවා ප්‍රතිඥාව ලබා දීමෙනි. ඉන් පසු වසරක් පාසා වසරේ පළමු වන දින එම ප්‍රතිඥාව නැවත නැවත ලබා දේ. අප ලබා දෙන දිවුරුම මතක් කොට ගත හොත් රාජ්‍ය නිලධරයා තුළ තිබිය යුතු සුපිළිපන් බව සිහියට නැගෙනු

> Don't be impressed by money, followers, degrees and titles. Be impressed by kindness, integrity, humility and generosity.

ඇත. මහජනතාවගේ බදු මුදලින් වැටුප් ලබන අප අවංකභාවයෙන් යුතුව, විශ්වාශයෙන් හා විනිවිදභාවෙන් යුතුව කාර්යක්ෂමව ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් කිරීමට කැප වී අල්ලසින් හා දූෂණයෙන් තොරව කටයුතු කරන බවට දිවුරුම් දේ.




- නමුත් අද අපට අප දෙන දිවුරුම අමතකව ඇති බවක් පෙනේ. මහජනතාව අප වෙත විශ්වාසය තබමින් අප වෙත පැවරූ කාර්යයන් අප ඔවුන්ගේ විශ්වාසය රැකෙන අයුරින් ඉටු කරනවාද යන්න අප අපගෙන්ම විමසා බැලිය යුතුය. තම ස්වාමියා වන මහජනතාව යම් කාර්යයක් ඉටු කර ගැනීමට පැමිණි විටක ඔවුන් වෙනුවෙන් ඉටු කිරීමට බැඳී සිටින කටයුත්තක් ඉටු කර දීමට තුටු පඬුරක් බලාපොරොත්තු වන්නේ සුපිළිපන්බව ගිලී ගොස් ඇති හෙයිනි.

- සේවාවක් ලබන්නට ආයතනයකට පැමිණෙන ජනතාවට බොහෝ විට සිය කාර්යය ඉටු කර ගැනීමට කිහිප වතාවක් පැමිණීමට සිදුව ඇත. වරු ගණන් දවස් ගණන් බලා සිටින්නට සිදුව ඇත. තම සේවකයා පිටුපස වැඳවැටෙමින් යන්නට සිදුව ඇත.

- අනෙක් අතට කෙනෙක් වෙත පැවරුණු රාජකාරිය නිවැරදිව කලට වෙලාවට ඉටු කරනවාද යන්න බලා සිටින්නට සුපරීක්ෂකවරු නිරන්තර දැමීමට සිදුව ඇත. කවුරු බලා හිටියත් නැතත් තමා තමාට පැවරී ඇති කාර්යය නිවැරදිව, අනලස්ව, කාර්යක්ෂම ඉටු කරයි නම් එසේ නිරන්තර සොයා බැලීමක් අවශ්‍ය නොවිය යුතුය.

- රාජ්‍ය ආයතනයකට පා තබන්නකුට තමාගේ දුක්ගැනවිල්ල විනිවිද දැකිය හැකි ප්‍රතිකර්මයක් තිබෙන බව පෙනී යා යුතුය. එමෙන්ම එම ප්‍රතිකර්මය සත්‍ය හා සාධාරණය ලෙස ඉෂ්ට කරන රාජ්‍ය නිලධාරීන් සැබෑ ඉටු දෙවියන් මෙන් රාජ්‍ය ආයතනවල වැඩ සිටින බවටත් මහජනතාවට විශ්වාස කළ හැකි විය යුතුය. සිය රාජකාරිය අභිමානවත් ලෙස නිපුණත්වයෙන් යුතුව ඉටු කළ යුතුය. එනමුදු එය විනිවිද පෙනෙන ලෙසට හා සාධාරණව නීතියට එකඟව පාවිච්චි කළ බවට ජනතාවට අවබෝධ විය යුතුය. සුපිළිපන්බවින් පිරී ඉතිරී ගිය විට රාජ්‍ය සේවකයාට ගෞරවයක් හිමි වන්නේ නිතැතිනි.

- අද බොහෝ දෙනෙකුට තමා වෙත පැවරී ඇති මහා වගකීම සහ භාරය පිළිබඳ වැටහීමක් නොමැත. මේ නිසාම කිසිදු හිරිකිතයකින් තොරව සමස්ත රටකට, සමස්ත සමාජයකට, අනාගත දරු පරපුරට හිමි සම්පත් එක් පිරිසක් භුක්ති විඳිමින් පරිහරණය කරමින් තමන්ට වාසි සලසා ගනිමින් සිටිති. පොදු දේපළවල හිමිකම රාජ්‍ය, දේපළවල හිමිකම සමස්ත සමාජයම සතුය යන්න

එපමණක් නොව අප මේ භුක්ති විඳින්නේ අනාගත පරපුරෙන් සම්පත් ණයට ඉල්ලා ගෙන බව අද වන විට සියලු තනතුරු ආවරණය වන පරිදි ඉහළ සිට පහළටම රජයේ නිලධාරීන්ට මතක් කරගත් යුතුය. අපේ මව්බිම සම්පත්වලින් හා ධන නිධානයන්ගෙන් අනූනය. එය රැක බලා ගන්නටත් පෝෂණය කරන්නටත් අප භුක්ති විඳ ඉතිරිය අපගේ මුනුපුරු මිනිපිරියන් වෙනුවෙන් ඉතිරි කර තබන්නටත් එහි භාරකරුවන් වන අප හට වගකීමක් ඇති බව වටහා ගත යුතුය.

# 4-රාජ්‍ය අංශයේ සුපිළිපන්බව ඉහළ නැංවීම සඳහා ඇති මෙවලම්

## 1. හැඳින්වීම

රටක සුපිළිපන්බව ඉස්මතු කිරීම කළ යුතු බව අප සියලු දෙනා අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. එය එසේ කළ යුතු බව දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍ය බලය මහජනතාව සතු වන අතර අන් සතු කළ නොහැක. මහජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම සඳහා පත් කර ඇති ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු ආයතනයන්හි මහජන නියෝජිතයන් හා නිලධරයන් මහජනතාව වෙත වගකීමට හා වගවීමට බැඳී සිටි.
එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියේ (UNCAC) හි 08 (01) වන ව්‍යවස්ථාව අනුව දූෂණයට එරෙහිව ක්‍රියා කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වයන් විසින් රාජ්‍ය නිලධාරීන් අතර විශ්වාසනීයත්වය, අවංකභාවය හා වගකීම යන ගතිලක්ෂණ වැඩිදියුණු කළ යුතු බවත් 08 (05) ව්‍යවස්ථාව අනුව රජයේ නිලධාරීන් විසින් සිය රාජකාරි ඉටු කිරීම සම්බන්ධයෙන් මත ගැටුමක් ඇති විය හැකි ඔවුන්ගේ බාහිර කටයුතු, රැකියාවන්, ආයෝජන, වත්කම් හා වටිනා ත්‍යාගයන් හෝ ප්‍රතිලාභ පිළිබඳ නිසි බලධරයන් වෙත ප්‍රකාශ කිරීම සඳහා ක්‍රමවේදයන් ඇති කළ යුතු බවත් දක්වා ඇත.

විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය (Open Government Partnership-OGP) නමැති බහුපාර්ශ්වික එකඟතාවට ඇතුළත් වූ රටක් ලෙස ශ්‍රී ලංකාව ජනතාවට වගකියන, විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුතු යහපත් රාජ්‍යපාලනයක් රට තුළ ඇති කිරීමට බැඳී සිටි.

තිරසාර සංවර්ධන ඉලක්ක තුළින් වර්ෂ 2030 වන විට සෞභාග්‍යමත් රටක් සඳහා අප යන ගමනේදී සියලු දෙනාට සංවර්ධනයේ ප්‍රතිලාභ ළඟා කර දිය යුතු වේ. සාමාජ සාධාරණත්වය යුක්තිය සැමට එක හා සමානව ඉටු විය යුතුය. එමණක් නොව අනාගත පරපුරේ සම්පත් නොනසමින් ඔවුන් සඳහා සම්පත් ඉතිරි කරමින් කටයුතු කරන ආර්ථික හා සමාජ සංවර්ධනයෙන් යුතු තිරසර සංවර්ධනයක් උදා කර ගත යුතුය. එහිදී රාජ්‍ය නිලධාරියාගේ සුපිළිපන්බව අත්‍යාවශ්‍ය සාධකයකි.

## 02. රාජ්‍ය අංශයේ සුපිළිපන් බව ඉහළ නැංවීම සඳහා වර්තමානයේ භාවිත කරන නීති රීති සහ ක්‍රමවේද

ඉහත පසු බිම තුළ අප රට තුළ ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සුපිළිපන්බව වැඩිදියුණු කිරීම සඳහා හඳුන්වා දී ඇති නීති රීති සහ ක්‍රමවේද රාශියක් ඇත.

a. අල්ලස හා දූෂණය සම්බන්ධයෙන් අදාළ වන නීති (මේ පිළිබඳව වෙනත් ලිපියකින් සාකච්ඡාවට බඳුන් කර ඇත)

b. අල්ලස හා දූෂණය පිටුදැකීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

c. ජාතික සුපිළිපන් සැලැස්ම

d. ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි

එහිදී රාජ්‍ය අංශයේ සුපිළිපන්බව කොටස් දෙකක් යටතේ හඳුනාගත හැක.

I. රාජ්‍ය ආයතනික සුපිළිපන්බව ඉහළ නැංවීම

II. රාජ්‍ය නිලධාරියාගේ සුපිළිපන්බව

## 03. රාජ්‍ය ආයතන තුළ සුපිළිපන්බව ඉහළ නැංවීම

රාජ්‍ය සේවා සැපයුම් ක්‍රියාවලිය පිළිබඳව ජනතාව සතු නොදැනුවත්කම සහ අපැහැදිලිකම ඉහළ යන විට අවභාවිතයට ඇති ඉඩකඩ වැඩි වේ. සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් තම ආයතනය තුළ අල්ලස හෝ දූෂණය සිදු වීමේ වැඩිම අවදානමක් තිබෙන ඒකක කවරක්ද යන්න සොයා බලා ඒ සඳහා හේතු පාදක වන දුර්වල චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමටත් මහජනතාවට කාර්යක්ෂමව හා ඉතාමත්ම පහසුවෙන් සේවය ලබා දීමටත් පියවර ගත යුතුය.

ඒ අනුව ජය ආයතන සුපිළිපන් කිරීම සඳහා අල්ලස හා දූෂණ පිටු දැකීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රමවේද රාශියක් දක්වා ඇත.

A. සුපිළිපන් නිලධාරියකු සියලු රාජ්‍ය ආයතන සඳහා පත් කිරීම

B. රාජ්‍ය ආයතන මට්ටමින් දූෂණ නිවාරණ කමිටු ඇති කිරීම

C. දූෂණ නිවාරණ ආයතනික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම

D. පහසුකම් සපයන නිලධාරියකු පත් කිරීම

E. පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම

F. තොරතුරු දැන ගැනීමේ මහජන අයිතිය බලාත්මක කිරීම

(මෙම කරුණුවලට අදාළ පුළුල් විස්තරයක් සුපිළිපන් අත්පොතෙහි දක්වා ඇති බැවින් එය පරිශීලනය කිරීමෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගත හැක.)

## 04. රාජ්‍ය නිලධාරියාගේ සුපිළිපන්බව ඉහළ නැංවීම

A. තෑගි ගැනීමට එරෙහි සිද්ධාන්ත (තෑගි රීති අත්පොත බලන්න)

B. බැඳියාවන් අතර ගැටුමට අදාළ සාරධර්ම (බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ අත්පොත බලන්න)

C. තමාගේ සියලු වත්කම්, ආදායම් හා බැරකම්වලට අදාළ විස්තර හෙළිදරව් කිරීමට ඇති බැඳීම (ආයතන සංග්‍රහය හා 1975 අංක 01 වත්කම් බැරකම් නීතිය)

D. රාජ්‍ය සේවකයන් සඳහා වූ අචාරධර්ම පද්ධතිය (ආයතන සංග්‍රහය)

E. සුපිළිපන් ගිවිසුමකට/ප්‍රතිඥාවකට සියලු රාජ්‍ය සේවකයන් යටත් කිරීම.

F. නිරන්තරයෙන් සුපිළිපන්බව පිළිබඳව දැනුවත්බව ඉහළ නැංවීම

# දෙවන පරිච්ඡේදය

## දූෂණය හඳුනාගැනීම

### 5-දූෂණය යනු කුමක්ද?

#### නිර්වචනය (ජාත්‍යන්තර)

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව **දූෂණය** (Corruption) යනු බලය වංක හෝ වංචාසහගත ලෙස යොදාගැනීමයි. ("dishonest or fraudulent conduct by those in power") මරියම්-වෙබ්ස්ටර් (Merriam-Webster) ශබ්දකෝෂයට අනුව දූෂණය යනු විශේෂයෙන්ම බලවත් පුද්ගලයන්ගේ නීති විරෝධී හෝ වංක චර්යාවයි. ("dishonest or illegal behaviour especially by powerful people".) කෙසේ නමුත් දූෂණය සඳහා ජාත්‍යන්තරව පිළිගත් නිශ්චිත තනි නිර්වචනයක් නොමැත. එයට එක් හේතුවක් වන්නේ දූෂණය පිළිබඳ නාමකරණයන් රටින් රටට මෙන්ම, සංස්කෘතියෙන් සංස්කෘතියටත් වෙනස් වීමයි. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය මගින්ද දූෂණය පිළිබඳව අර්ථ නිරූපනයක් ලබා දී නොමැත.

#### දූෂණය පිළිබඳ ශ්‍රී ලාංකික නීතිමය නිර්වචනය

"අල්ලස හා දූෂණය" යන්න බහුලව භාවිත වන යුගල පදයක් බවට පත් වී ඇත. දූෂණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ පිළිගත් නිශ්චිත නිර්වචනයක් නොමැති වුවද නීතිමය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකාවේ දූෂණය පිළිබඳ නිර්විත අර්ථ නිරූපනයක් ඇත. එම ප්‍රතිපාදනය පවතින්නේ 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් සංශෝධිත 1954 අංක 11 දරන අල්ලස් පනතේ 70 වන වගන්තිය වගන්තිය තුළය.

එකී වගන්තියට අනුව දූෂණය යනු "ආණ්ඩුවට අයතු සහගත ලෙස හෝ නීති විරෝධි ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තෙකු වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තෙකුට අයුතු ලෙස පාඩු සිදු විය හැකි බව නැතහොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්, එනම් :-

(අ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොළඹවන;

(ආ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන;

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයන් ගැනීමෙහිලා සහභාගි වන;

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන" ක්‍රියාවක් දූෂණයක් ලෙස අර්ථ නිරූපනය කර ඇත.

අල්ලස් පනතට අනුව එවැනි ක්‍රියාවක් අපරාධ වරදක් වේ. මෙම වරද සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විසින් විමර්ශන සිදු කිරීමට බලය පවරා ඇති අතර වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකි වරදක් ලෙස දූෂණ වරද සැලකේ. දූෂණය සඳහා 1994 අංක 20 දරන අල්ලස් සංශෝධන පනත අනුව මහේස්ත්‍රාත් අධිකරණයක පවත්වන ලඝු නඩු විභාගයකින් වරදකරු වූ විට රුපියල් ලක්ෂය දක්වා දඩයකට හෝ වසර 10ක් දක්වා සිරදඬුවමකට හෝ දඩය හෝ සිරදඬුම යන දෙකටම යටත් විය යුතුය. පසුව 2018 අංක 22 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් අල්ලස් නඩු පවත්වාගෙ යෑම මහාධිකරණයටද පවරන ලදි.

### දූෂණය පිළිබඳ ජනප්‍රිය හැඳින්වීම

- රජයේ තනතුරු තම පෞද්ගලික ලාභ ප්‍රයෝජනය සඳහා වැරදි ලෙස යොදා ගැනීම.

  -ලෝක බැංකුව

- රාජ්‍ය අංශයේ නිලධාරියකු (දේශපාලන/රාජ්‍ය සේවය) තමා වෙත ලබා දී ඇති බලතල ස්වකීය පෞද්ගලික වාසියට හෝ තමාට සම්බන්ධ යමෙකුගේ වාසියට වැරදි සහගත අන්දමින් හෝ නීති විරෝධී අන්දමින් යොදා ගැනීම.

  -ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්

- දූෂණය යනු පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ පුද්ගලයින් අතර සිදු වන පොදු භාණ්ඩ නීති විරෝධී ලෙස පෞද්ගලික භාණ්ඩ බවට පත් කිරීමේ ගනුදෙනුවකි.

  -ඊඩින් හෝම්ස්

- මහජන නිලධාරියෙකු පෞද්ගලිකත්වය ඥාතීත්වය, මිත්‍රත්වය, ධනය හෝ බලය වැනි පෞද්ගලික අරමුණු නිසා අවශ්‍ය වගකීම් උල්ලංඝනය වන පරිදි හැසිරීම.

  -කොලින් හේ

- අල්ලස් ලබා ගන්නා පුද්ගලයාගෙන් සිදු විය යුතු රාජකාරිය හෝ ඔහුගෙන් විය යුතු හැසිරීම් රටාවෙන් වෙනස් වන අන්දමින් ඍජුව හෝ වක්‍රව අල්ලසක් හෝ වෙන යම් වැරදිසහගත ලාභයක් ඉල්ලීම, පිළිගැන්වීම, දීම හෝ ලබාගැනීම දූෂණය නම් වේ.

  -යුරෝපා කවුන්සිලය


මෙම හැඳින්වීම් අනුව බලන කල 'දූෂණය' යන්නට ව්‍යාපාරික ජනතාව විසින් දේශපාලඥයන්ට හා රාජ්‍ය නිලධාරීන්ට අල්ලස් දීමේ සිට රජයේ ආයතනවලදී සිදු කරනු ලබන කුඩා සොරකම්ද රාජ්‍ය නිලධාරීන් ලබා ගන්නා සන්තෝෂම්ද දක්වා පැතිර පවත්නා සියලුම සැක කටයුතු ආර්ථික දේශපාලන කරුණු අයත් බව වටහා ගත

යුතුය. දූෂණය යනු එකම ස්වරූපයේ ක්‍රියාවක් හෝ ගනුදෙනුවක් නොව එක් එක් අවස්ථාවලදී එක් එක් ස්වරූපවලින් සිදු වන්නා වූ සංසිද්ධියකි.

### දූෂණයේ සූත්‍රය

දූෂණය පිළිබඳව අධ්‍යයනය කළ ආර්ථික විද්‍යාඥයකු වන රොබට් ක්ලිට්ගාර්ඩ් (Robert Klitgaard) විසින් දූෂණය සම්බන්ධ සූත්‍රයක් හඳුන්වා දී ඇත. දූෂණයට බලපාන සාධක හා දූෂණය අඩුවැඩි වීම කෙරෙහි බලපාන සාධක මොනවාද යන්න මෙම සූත්‍රය මගින් පැහැදිලි කෙරෙයි. එම සූත්‍රය ක්ලිට්ගාර්ඩ් සූත්‍රය (Klitgaard formula) ලෙස හඳුන්වනු ලැබේ.

### ක්ලිට්ගාර්ඩ් සූත්‍රය (Klitgaard formula)





මෙම සූත්‍රයට අනුව ඒකාධිකාරයට අභිමතානුසාරී බලය එකතු වීමෙන් හා වගවීම අඩු වීමෙන් දූෂණය නිර්මාණය වන බව පැහැදිලි වේ.

මේ සූත්‍රයට අනුව,

- ඒකාධිකාරය වැඩි වන විටත්
- අභිමතානුසාරී බලය වැඩි වන විටත්
- වගවීම අඩු වන විටත් දූෂණය වැඩි වන බව පැහැදිලිය.

## ක්ලිට්ගාර්ඩ් සූත්‍රය (Klitgaard formula)




සූත්‍රයට අනුව දූෂණය අඩු කිරීමේ එක් ක්‍රියාමාර්ගයක් වන්නේ අත්තනෝමතික ක්‍රියා සඳහා වන ඉඩකඩ ඇහිරීමයි, ඒ මගින් ඒකාධිකාරය මෙන්ම අභිමතානුසාරී බලයද අඩු කිරීමක් අපේක්ෂා කල හැකිය.

ඒකාධිකාරය අඩු කිරීම හා අභිමතානුසාරී බලය අඩු කිරීම සඳහා අත්තනෝමතික ක්‍රියා සඳහා වන ඉඩකඩ අඩු කළ යුතු වේ, එක් පුද්ගලයකු සතුව පවතින තීරණ ගැනීමේ අවස්ථාව වෙනුවට තීරණ ගැනීම සඳහා පුද්ගල මණ්ඩලයක් පත් කිරීම, තීරණ ගැනීමේ විවිධ අවස්ථාවන් විවිධ මට්ටම්වලින් සිදුකිරීමට අවස්ථාව සලසා තිබීම, තීරණ ගැනීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටීන් හා නිර්ණායක හඳුන්වා දීම, තීරණයන් ප්‍රතිශෝධනයට අවස්ථාව සලසා තිබීම, කිහිප මට්ටමකින් සිදු වන අධීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දීම ආදිය මගින් අත්තනෝමතික ක්‍රියා සඳහා වන ඉඩකඩ ඇහිරිය හැකිය.

ක්ලිට්ගාර්ඩ් සූත්‍රයට අනුව දූෂණය අඩු කිරීමේ තවත් උපක්‍රමයක් වන්නේ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමයි. නීතියයේ ආධිපත්‍ය ශක්තිමත් කිරීම මගින් අභිමතානුසාරී බලය අඩු කළ හැකිය. සාධාරණ හා ශක්තිමත් නීති සකස් කිරීම මෙන්ම එකී නීති හා නීතියේ ක්‍රියාවලිය සැමට සාධාරණ ලෙස ක්‍රියාවෙහි යෙදවීමෙන් තීරණ ගැනීම ක්‍රමානුකූල හා නීතියෙන් පිළිගත් ක්‍රමවේදයකට අනුව සිදු කළ යුතු වේ. එවිට තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පුද්ගලයාගේ අභිමතානුසාරී බලය සීමා වන අතරම එම සීමාවන් උල්ලංඝනය කර තීරණ ගත් අවස්ථාවලදී එකී පුද්ගලයන් නීතිය ඉදිරියට පැමිණවීමේ අවස්ථාව ලැබෙන බැවින් සෑම අයෙකුම තීරණ ගැනීමේදී සිය බලතල නීතියෙන් නියම කර ඇති සීමාවන් තුළ රැඳෙමින් හා නිසි ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කරනු ඇත.

ඒකාධිකාරය අඩු කිරීම හා අභිමතානුසාරී බලය අඩු කිරීම මෙන්ම වගවීම වර්ධනය කිරීම මගින්ද දූෂණය අවම කළ හැකිය. වගවීම වර්ධනය කිරීමේ එක් ක්‍රමෝපායක් වන්නේ තොරතුරු නිදහසේ ගලායෑමට සැලැස්වීමයි. බඳවා ගැනීම්, මිල දී ගැනීම්, සහනාධාර ක්‍රියාවලිය මෙන්ම තීරණායක හා පටිපාටීන් පිළිබඳ තොරතුරුද ජනතාවට දැනගැනීමට සැලැස්වීම ආයතනයක නීතියෙන් පැවරුණ වගකීමක් වන අවස්ථාවකදී එකී ආයතනයේ නිලධාරීන්ගේ වගකීම නිතැතින්ම වර්ධනය වේ. වගවීම වර්ධනය වන විට දූෂණයන් සිදුවීමට පවතින ඉඩකඩ අවම වේ. උදාහරණයක් ලෙස කාර්යමණ්ඩල බඳවාගැනීමක් සිදු වන අවස්ථාවකදී පවත්වන ලද තරග විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ප්‍රසිද්ධ කළහොත් හා අවශ්‍ය අයගේ ඉල්ලීම මත ලබාදුනහොත් විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් අඩු ලකුණු ලබාගත් පුද්ගලයන් බඳවා ගැනීමට පවතින ඉඩකඩ ඇහිරෙන අතර එමගින් ඥාති සංග්‍රහ මිත්‍ර සංග්‍රහ වැළකී යයි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිමය පිළිගැනීමක අවශ්‍යතාව දූෂණ මෙවලමක් ලෙස මතු වන්නේ මෙවැනි අවස්ථාවන්හිදීය.

වගවීම වර්ධනය කිරීම සඳහා භාවිතා කළ හැකි තවත් ක්‍රමෝපායක් වන්නේ ජනතා හඬ නැගීම වර්ධනය කිරීමයි. යම් අසාධාරණ ක්‍රියාවලියක් සිදු වන විට ජනතාව එයට එරෙහිව ප්‍රතික්‍රියා දක්වන්නේ නම් නිලධාරීන්ගේ වගවීම නිතැතින්ම වර්ධනය වේ. ඒ සඳහා ජනතාව තොරතුරු සොයන හා තොරතුරු පිළිබඳ විමසිලිමත් වන පිරිසක් මෙන්ම එම තොරතුරු මගින් හෙළිදරව් වන අසාධාරණ ක්‍රියාවලට එරෙහිව ප්‍රතිචාර දැක්වීමට තරම් ශක්තිමත් විය යුතුය. විශේෂයෙන්ම අසාධාරණයට එරෙහිව නැගී සිටීමට සූදානම් බව මෙන්ම ඒ සඳහා ඥානාන්විත උපක්‍රම තෝරාගැනීමේ හැකියාව සහිත පිරිසක් විය යුතුය.

### දූෂණයේ පාර්ශ්වයෝ

දූෂණ ක්‍රියාවලියක  මූලික පාර්ශ්ව දෙකක් ඇත.

1 ඉල්ලා සිටින පාර්ශ්වය

2 සපයන පාර්ශ්වය

ඉල්ලා සිටින පාර්ශ්වය ලෙස සලකන්නේ යම් පැවැරුණ රාජකාරියක් කිරීමට හෝ නොකිරීමට යම් අල්ලසක් ඉල්ලා සිටින හෝ තම නිලය අයුතු ලෙස යොදවන පාර්ශ්වයයි. දූෂිත නිලධාරීන්, දූෂිත දේශපාලන බලධාරීන් ආදිය මෙම පාර්ශ්වයට අයත් වේ.

සපයන පාර්ශ්වය ලෙස හඳුන්වන්නේ ඉහත විස්තර කළ ඉල්ලා සිටින පාර්ශවය ඉල්ලා සිටින අල්ලස හෝ ප්‍රතිලාභය සැපයීමට එකඟ වන පාර්ශ්වයයි. මෙම පිරිසට පොදු මහජනතාව, කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයන් ආදිය ඇතුළත් වේ.

මෙහිදී සැලකිය යුතු කරුණක් වන්නේ දූෂණයේදී සැමවිට දූෂණයට මුලපුරන්නේ ඉල්ලාසිටින පාර්ශ්වයම නොවන බවයි. සමහර අවස්ථාවන්හිදී සැපයුම්

පාර්ශ්වයම දූෂණය සඳහා මුල් යෝජනාව ඉල්ලා සිටින පාර්ශ්වය වෙත යොමු කරන අවස්ථා පවතී.

සරල උදාහරණයක් ලෙස නියමිත ප්‍රමිතියෙන් තොරව සාදන ලද කොන්ක්‍රීට් මාර්ගයක් නියමිත ප්‍රමිතියෙන් යුතුව පවතින බවට වාර්තාවක් ලබාදුනහොත් රුපියල් පන්දහසක මුදලක් ලබාදෙන බවට කාර්මික නිලධාරියකුට කොන්ත්‍රාත්කරුවකු විසින් යෝජනා කරනු ලබන අවස්ථාව දැක්විය හැකිය.

## 6-දූසැරියේ විවිධ මුහුණුවර

අල්ලස හා දූෂණය යන යුගල පදයක් ශ්‍රී ලංකාවේදී භාවිත වුවද අල්ලස යනුවෙන් හඳුන්වන්නේ දූසැරියේ එක් ප්‍රභේදයකි, නැතහොත් මුහුණුවරකි. දූසැරියක් සිදු වන සෑම විටම දක්නට ලැබෙන පොදු සිදුවීම් කිහිපයක් ඇත. එනම්,

- බලය අවභාවිතයක්
- නීත්‍යානුකූලව බලය හිමි රාජ්‍ය නිලධාරීන් (පරිපාලන /දේශපාලන)
- පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලැබීමක්

මෙම සාධක දක්නට ලැබෙන දූසැරියට අයත් වන බොහෝ අපරාධ විවිධ ස්වරූපයෙන් පවතී.

### එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අනුව දූසැරියේ ප්‍රභේද

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධි සම්මුතියට අනුව පහත සඳහන් දූෂණ ක්‍රියාවන්ට අපරාධ වගකීම් පැවරීම සඳහා රාජ්‍යයක් විසින් නීති සම්පාදනය කළ යුතු බව දක්වයි-

- අල්ලස
- නිලධාරියකු විසින් දේපළ අයථා ලෙස යොදාගැනීම
- බලපෑම් සිදු කිරීම
- නිලතල අයුතු ලෙස යොදාගැනීම
- අයුතු ධනවත් වීම
- අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය
- යුක්තිය පසිඳලීමට බාධා කිරීම

### අල්ලස

නිලධාරියෙකු ගනු ලබන තීරණයකින් හෝ කරනු ලබන ක්‍රියාවන් අනියම් ආකාරයේ ලාභ ප්‍රයෝජන ලබාදීමට කරන පොරොන්දුවක් ලෙස මෙය හැඳින්විය හැක. මෙය දෙපාර්ශ්වයේ අන්‍යෝන්‍ය අවබෝධය මත සිදු වේ. ක්‍රියාව සිදු කිරීමට පෙර අල්ලස් ලබාදීම සිදු කරයි. එය මුදලින්, ද්‍රව්‍යවලින්, සේවාවකින් විය හැක. විශේෂයෙන් නීති විරෝධී දේවල් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන පිරිස්වලට අල්ලස් ලබාදීම නිතරම දක්නට ඇත. ශ්‍රී ලාංකික නීතිය තුළ අපරාධයක් ලෙස හඳුනාගෙන ඇත්තේ රාජ්‍ය නිලධරියකු විසින් අල්ලස් ලබාගැනීම හෝ රාජ්‍ය නිලධාරියකුට අල්ලස් ලබාදීම පමණි. පුද්ගලික අංශයේ අල්ලස් අපරාධ නීතියේ කොටසක් බවට තවමත් පත් වී නොමැත.

ජාත්‍යන්තර දූෂණ විරෝධී සම්මුතියට අනුව රාජ්‍ය නිලධාරීන් ගේ අල්ලස, විදේශ රාජ්‍ය නිලධාරීන්ගේ අල්ලස මෙන්ම ජාත්‍යන්තර රාජ්‍ය සංවිධානවල නිලධාරීන්ගේ අල්ලසද අපරාධ වැරදි ලෙස හඳුනාගෙන ඇත.

## නිලධාරියකු විසින් දේපළ අයථා ලෙස යොදා ගැනීම

යම් රාජ්‍ය නිලධාරියකුගේ තනතුරට අනුව ඔහුට භාරදී ඇති යම් දේපළක්, රාජ්‍ය හෝ පුද්ගලික මුදල් හෝ ඇප හෝ වටිනාකමක් ඇති වෙනත් යම් දෙයක්, එම රාජ්‍ය නිලධාරියා විසින් ඔහුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයුතු ප්‍රතිලාභය සඳහා වංචා කිරීම, අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම දූෂණයකි.

## බලපෑම් සිදු කිරීම

යම් ක්‍රියාවක් සිදු කරන ලෙස මුලින් ඉල්ලා සිටි තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තෙකුට යම් අයුතු වාසියක් රාජ්‍ය පාර්ශ්වයේ පරිපාලනමය හෝ රාජ්‍ය අධිකාරියකින් ලබා ගැනීමේ අදහසකින් රජයේ නිලධරයෙකු හෝ වෙනත් තැනැත්තෙකු ඔහුගේ හෝ ඇයගේ බලපෑම පාවිච්චි කිරීම සඳහා එම රජයේ නිලධරයාට අයුතු ලාභයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ලබාදීමට පොරොන්දු වීම හෝ යෝජනා කිරීම හෝ ලබාදීම, යම් අයුතු ලාභයක් රාජ්‍ය පාර්ශ්වයේ පරිපාලනමය හෝ රාජ්‍ය අධිකාරියකින් ලබා ගැනීමේ අදහසින් රජයේ නිලධරයෙකු හෝ වෙනත් තැනැත්තෙකු ඔහුගේ හෝ ඇයගේ බලපෑම පාවිච්චි කිරීම සඳහා එම රජයේ නිලධරයාට අයුතු වාසියක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ලබා දීමට ඉල්ලා සිටීම හෝ භාර ගැනීම බලපෑම් සිදු කිරීම ලෙස හඳුන්වනු ලැබේ.

## නිලතල අයුතු ලෙස යොදා ගැනීම

යම් රාජ්‍ය නිලධාරියකු විසින් තම කාර්යභාරය හෝ ධුරය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම එනම් යම් රාජ්‍ය නිලධරයකු සඳහා හෝ වෙනත් තැනැත්තකු සඳහා හෝ යම් අයුතු වාසියක් ලබාගැනීමේ කාර්යය සඳහා ඔහුගේ හෝ ඇයගේ කාර්යභාරය ඉටු කිරීමේදී නීති කඩ කරමින් යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීමෙන් වැළකී සිටීම සිතාමතාම කරනු ලැබීම බලතල අයුතු ලෙස යොදාගැනීමකි.

## නීතිවිරෝධී ධනවත් වීම

නීති විරෝධී ධනවත් වීම, එනම් යම් රාජ්‍ය නිලධාරියකුගේ නීත්‍යානුකූල අදායමට අදාළව ඔහුට හෝ ඇයට සාධාරණ ලෙස පැහැදිලි කළ නොහැකි වත්කම්වලින් සැලකිය යුතු වැඩි වීමක් ඇති කර ගැනීම නිසා සිතා මතාම කරනු ලැබූ විට එය නීති විරෝධී ධනවත් වීම වේ.

## අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය

යම් දේපළක් නීති විරෝධී ක්‍රමයකට ලබාගෙන එහි නීති විරෝධී මූලාරම්භය සැඟවීම හෝ වසන් කිරීම සඳහා එම දේපළ පරිවර්තනය කිරීම හෝ පැවරීම මුදල් විශුද්ධිකරණය වේ.

ඉහත කී අකාරයන් හැරුණ විට පහත සඳහන් ස්වරූපයේ ක්‍රියාවන්ද දූසැරිය ලෙස හඳුන්වනු ලැබේ.

## වංචාව

යමෙකුගේ හෝ තෙවන පාර්ශ්වයකගේ වාසිය තකා තවත් පුද්ගලයකු රැවටීමට ක්‍රියා කිරීම මේ නමින් හඳුන්වයි. රෝගී පුද්ගලයින්ට රජයේ ආධාර ලබාදෙන අවස්ථාවකදී රජයේ වෛද්‍යවරයකුගෙන් ව්‍යාජ සහතිකයක් ලබාගෙන එම ආධාර ලබා ගැනීමට කටයුතු කිරීම මෙම ස්වරූපයේ වරදකි.

## බලහත්කාරය

යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර සිටීම සඳහා යම් වටිනා දෙයක් හෝ මුදලක් ලබා දෙන ලෙසට බල කිරීම බලහත්කාරයයි. මෙය නොකර සිටීම ශාරීරික වදහිංසා හා තුවාළ වීම් දක්වා බරපතළ විය හැකිය. රෝගාතුරව රෝහල්ගතව සිටින කාන්තාවක් වෛද්‍යවරයා කැඳවන ලෙස ඉල්ලූ විට තමාට ඒ සඳහා මුදලක් ගෙවන ලෙස භාර හෙදිය බල කිරීම මේ ස්වරූපයේ වරදක් වේ. එය නොකර සිටීමෙන් අදාළ කාන්තාව මියයෑමටද හැකිය.

## තීරණ ගැනීමේ බලය අනිසි ලෙස භාවිතය

යමෙකුට තම බලය භාවිත කරමින් කණ්ඩායමකට අනියම් අනුග්‍රහයක් දැක්වීම හෝ කණ්ඩායමෙන් වෙනස් කොට සැලකීම මෙම වරදට අයත්ය. නීතිය වැරදි ලෙස භාවිත කරන විට හෝ යම් සුවිශේෂී තීරණයන් සාධාරණීකරණය කිරීමට විධිමත් නීති හෝ ක්‍රමවේදයන් නොමැති විට නිතරම බලය අනිසි ලෙස භාවිත කිරීම් දක්නට ලැබේ.

## අවශ්‍යතා පිළිබඳ ගැටුමෙන් අයුතු ලාභ ඉපයීම / ඇතුළත වෙළඳාම

අයුතු ධනවත් වීමේ අරමුණින් යමෙකුගේ තිලයට අයත් නොවන්නා වූ ගනුදෙනුවක නිරත වීම, තත්ත්වයක් හෝ වෙළඳ ලාභයක් ලැබීම මින් අදහස් වේ. උදාහරණයක් ලෙස රාජ්‍ය නිලධාරියෙක් තමන්ට ලැබුණු තොරතුරු මත රජය යම් ප්‍රදේශයක විශාල සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යන බව දැන ගනී. ඔහු එම ප්‍රදේශයෙන් විශාල ඉඩමක් මිල දී ගෙන එම ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදීම සඳහා මුල් වී ක්‍රියා කරයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ සාමාන්‍ය ජනතාවට පහසුකම් සැපයීම වුවද රජයේ නිලධාරියා ඉන් අයුතු ලෙස විශාල ලාභක් ලබාගෙන ඇත.

## නීති විරෝධී සන්තෝසම්, පාරිතෝෂික, කොමිස් ලබා ගැනීම

රජය සමග යම් කටයුත්තක් කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වයකින් යම් වටිනාකමක්, මුදලක් ලාභයක් ලබාගැනීම මෙයින් අදහස් වේ. රජයේ නිලධාරියකු ටෙන්ඩර් අනුමත කිරීම සඳහා මුදල් හෝ කොමිෂන් ඉල්ලීම උදාහරණ වේ.

## අනිසි පක්ෂපාතීත්වය

පෞද්ගලික දැනීම, පක්ෂ හිතවත්කම්, ජාතිය, ආගම, කුලය, හෝ වෙනත් කැමැත්තක් හේතු කොටගෙන රජයේ නිලධාරියකු සේවාවක් හෝ සම්පත් ලබා දීමක් මෙයට අයත්ය. දේශපාලන සම්බන්ධතා මත රැකියා දීම සේවාවන් ලබා දීම මේ ගණයට වැටේ. මෙහි සුවිශේෂත්වය නම් සමාන්‍ය ජනතාවට නොලැබෙන ආකාරයේ සුවිශේෂ සැලකීමක් පෞද්ගලික කැමැත්ත මත රජයේ නිලධාරියාගේ හිතවතාට ලැබීමය. මහජන දේපළ අවිධිමත්ව හා අක්‍රමවත්ව බෙදී යෑම මේ නිසා සිදු වේ.

## ඥාති සංග්‍රහ

රජයේ නිලධාරියාට ඇති ඥාතීත්වය නිසාම රජයේ තනතුරුවලට පත් කිරීම හෝ වෙනත් වාසි අත් කර දීම මෙහි ස්වභාවයයි. දේශපාලඥයින් තම නෑදෑ හිතවතුන් තම අමාත්‍යංශවලට පත් කර ගැනීම මෙයට උදාහරණ වේ. මෙය රජයක ස්ථාවරත්වය හා සාමූහිකත්වයට අහිතකර ලෙස බලපායි.

## නීති විරෝධී ප්‍රදානයන්

දේශපාලන පක්ෂවලට හෝ ආණ්ඩු බලය හිමි පක්ෂවලට යම් යම් කටයුතුවලට මැදිහත් නොවීම වෙනුවෙන් ලැබෙන ප්‍රදානයන් මේ ගණයට අයත් වේ. රාජ්‍ය නිලධාරියකුගේ වගවීම පැහැරහැරීම වෙනුවෙන් ලැබෙන ප්‍රදානයකි. මෙයද එක් ආකාරයක අල්ලසකි.

## දූෂණයේ ප්‍රමාණය

දූෂණයේ ඉහත ස්වරූපයන්ට අමතරව දූෂණයේ පරිමාව, දූෂණය සිදු වන ස්ථානය ආදී කාරුණු සලකමින්ද දූෂණය වර්ගීකරණය හා තේරුම් ගැනීම සිදු කළ හැකිය. ඒ අතර වැදගත් වර්ගීකරණයක් ලෙස මහා පරිමාණ දූෂණ හා සුළු පරිමාණ දූෂණ ලෙස වූ වර්ගීකරණය පෙන්වා දිය හැක.

### මහා පරිමාණ දූෂණ

මහා පරිමාණ දූෂණය සමන්විත වන්නේ ප්‍රතිපත්ති හෝ රාජ්‍යයේ ඉහළ ක්‍රියාකාරීත්වය තුළය. අතිවිශාල ප්‍රමාණයෙන් සිදු වන රාජ්‍ය මුදල් සොරකම් හෝ රාජ්‍ය දේපළ අයථා පරිහරණය කිරීම්, විශාල පරිමාණයේ රාජ්‍ය ගනුදෙනුවලදී සන්තෝසම් හෝ කොමිස් ලැබීම් මෙම කොටසට අයත් වේ. ඉහළ දේශපාලන හා නිලධාරී පැලැන්තිය තුළ මෙවැනි දේ සිදු වේ. මෙවැනි ගනුදෙනු බොහෝ විට විදේශීය බැංකු හරහා සිදු වේ.

එවැනි මුදල් බොහෝ විට තැන්පත් වන්නේද විදේශ ගිණුම්වලය. මෙවැනි මහාපරිමාණ දූෂණයන්ගෙන් ලැබෙන ප්‍රතිලාභ මගින් දේපළ මිල දී ගැනීම් සිදු කරන්නේද විදේශවලය. එසේම මෙම දූෂණයන් නීතියේ රැහැනට හසු කර ගැනීමද ඉතාමත් අපහසුය.

### මහා පරිමාණ දූෂණ

රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේදී රාජ්‍ය නිලධාරීන් සලසන සේවය උදෙසා සාමාන්‍ය චර්යාවේ කොටසක් ලෙස බලාපොරොත්තු වන සන්තෝසම්, වෙනත් ප්‍රධාන වැනි දේ මේ යටතට වැටේ. තනිව ගත් කල කුඩා වුවද සමස්තයක් ලෙස ගත් කල විශාල වේ.

සුළු දූෂණය යනු පහළ හා මධ්‍යම මට්ටමේ රාජ්‍ය නිලධාරීන් විසින් එදිනෙදා කටයුතු සඳහා පවරා ඇති බලය අනිසි ලෙස භාවිත කිරීමයි.

කුමන ආකාරයකින් දූෂණය ක්‍රියාත්මක වුවද එහි පොදු ලක්ෂණය රාජ්‍ය නිලධාරියකු තම නිලයේ කටයුතු පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගැනීම වේ. එමෙන්ම එය සංවර්ධන ක්‍රියාවලියටද ආර්ථිකයටද බරපතළ හානි සිදු කරයි.

## 7- දුසැරියට හේතු හඳුනා ගනිමු

රටක දුසැරිය වර්ධනය වීමට නැතහොත් පුද්ගලයකු දුසැරියට බර වීමට හේතු විමසුව හොත් බොහෝ විට සමාජයෙන් ලැබෙන පිළිතුරු වන්නේ අඩු වැටප, අඩු ආදායම, පවුලේ ප්‍රශ්න ආදියයි. සැබවින්ම මේ දුසැරියට හේතු නොව දුසැරිය සඳහා දක්වන නිදහසට කාරණාය.

දුසැරියට සැබෑ හේතු හඳුනාගැනීමට නම් දුසැරිය පිළිබඳ ක්ලිඩ්ගාර්ඩ් සමීකරණය කෙරෙහි නැවත විමසිලිමත් විය යුතුය.

දුසැරිය = ඒකාධිකාරය + අභිමතානුසාරී බලය - වගවීම

ඕනෑම සමාජයක් තුළ දූෂණයට ඉඩ සලසන ප්‍රධාන හේතු කිහිපයක් සලකා බලමු.

මෙම සූත්‍රයට අනුව ඒකාධිකාරය හා අභිමතානුසාරී බලය වැඩි වන ක්‍රියාවන් හා වගවීම අඩු වන ක්‍රියාවන් දූෂණයට හේතු ලෙස හඳුනාගත හැකිය. අප සමාජය තුළ පවතින එවැනි හේතු කිහිපයක් පහත පරිදි ලැයිස්තු ගත කළ හැකිය..

### 1 අසීමිත බලාධිකාරය

යම් පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට විෂය ක්ෂෙත්‍රයක අසීමිත බලයක් ගොඩනැගී තිබේ නම් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට කිසිවකුට ඉඩක් නොතිබීම මත එම පුද්ගලයා හෝ කණ්ඩායම අතින් දූෂණය සිදු වීමට හොඳ ඉඩක් ලබා දෙයි.

### 2 සීමිත පාරදෘශ්‍යභාවය

රජයේ යම් ක්‍රියාකාරකමක් ජනතාවට නොපෙනන ක්‍රමවේදයක් මත සිදු වේ නම් ඒ තුළින් එම නිලධාරීන්ට දූෂණය සිදු කිරීමට පරිසරය නිර්මාණය කරයි.

### 3 සීමිත වගවීම

රජයේ ආයතනයෙන් සමාජයට වගකීමට බැඳීමක් නොමැති නම් එය ප්‍රශ්න කිරීමට සමාජයටද ඉඩක් නැත. මෙවැනි පරිසරයක් නිර්මාණය වී ඇති ආයතනයක

දූෂණය සිදු වීමට මනා පරිසරයක් නිර්මාණය වේ.

### 4 සීමිත දේශපාලන කැප වීම

දූෂණය පිටු දැකීම සඳහා දේශපාලනඥයින්ගේ කැප වීමක් නොමැති වීමෙන් රජයේ ආයතනවල නිලධාරීන් දූෂණයට නිර්භයව පෙළඹේ. එබැවින් දූෂණය පිටුදැකීමට නම් දේශපාලනඥයින් ඒ සඳහා කැප වීම අවශ්‍යය.

### 5 සංවරණ හා තුලන ක්‍රියාවලියේ සීමිත බව

විධායක ව්‍යවස්ථාදායක අධිකරණ යන පද්ධති තුළ එකක් අනික අභිභවා දැඩි ලෙස ප්‍රමුඛ වීම වැළැක්වීමේ ක්‍රමය සංවරණ හා තුළන ක්‍රමය ලෙස හැඳින්වේ. එක් ඒකකයක ක්‍රියාකාරීත්වය අනෙක් ඒකක දෙක මගින් පරීක්ෂාවට ලක් වීම මින් අදහස් වේ.

මේ මගින් නීතියේ ආධිපත්‍යය ශක්තිමත් වේ. යම් රටක සංවරණ හා තුලන ක්‍රමය බිඳ වැටෙයි නම් මේ විධායක ව්‍යවස්ථාදායක හා පරිපාලන ආයතන අතර අන්‍යෝන්‍ය පරීක්ෂාව බිඳවැටෙනු ඇත. එවිට එම ආයතන හා එවායේ පුද්ගලයන් කරනු ලබන දූෂණයන් සීමා කරන ක්‍රමවේදයක් නොමැති බැවින් එවැනි රටක දූෂණය බහුල වේ.

### 6 දුර්වල සිවිල් සමාජය

සිවිල් සමාජය සංවිධානගත වී නොමැති නම් එකී සමාජයේ සමාජිකයින් දැනුවත් හා එදිනෙදා ප්‍රශ්නවලට සංවේදී නොවේ නම් එවැනි සිවිල් සමාජය දුර්වල සිවිල් සමාජයක් ලෙස හඳුන්වයි. තමන්ට පමණක් නොව අනුන්ට සිදුවන අසාධාරණයේදීද එයට එරෙහිව සංවිධානය වී එරෙහි වීම ශක්තිමත් සිවිල් සමාජයේ ලක්ෂණයකි. එබැවින් දුර්වල සිවිල් සමාජය රජයේ ආයතන තුළ සිදු වන දූෂණයන්ට එරෙහි වීමක් සිදු නොවන බැවින් දුර්වල සිවිල් සමාජයක් සහිත රටවල දූෂණය බහුල වේ.

### 7 ක්‍රම විරෝධී චර්යාවන් (කාර්ය පටිපාටියට එරෙහි ක්‍රියාවන්)

රටක රජය විසින් පුරවැසියන් සඳහා සේවා සැලසීමේ ක්‍රමවේදයක් ඇත. මෙම ක්‍රමවේදය නීතියේ බලය මත සකස් වී ඇත. යම් පිරිසක් එම ක්‍රමවේදය බැහැර කරමින් රාජ්‍යයෙන් ලැබිය යුතු සේවාවන් හා ප්‍රමුඛතාවන් තම හිතවත්කම් හා ඥාතිත්වය මත වෙනස් කරයි නම් එහිදී දූෂණයක් සිදු වේ. එවැනි ක්‍රම විරෝධී චර්යාවන් අනුමත කරන සමාජයේ දූෂණ බහුල වේ.

## 8 දූෂණයේ ප්‍රතිවිපාක

දූසැරිය සමාජයෙන් පිටුදැකිය යුතු පිළලයක් බව සැම දෙනෙක්ම අවිවාදයෙන් පිළිගනු ඇත, විශේෂයෙන්ම සාධාරණ පුරවැසියන් සියලු දෙනාම දූසැරියට එරෙහි වන්නේ එමගින් තමන්ට පුද්ගලිකව අලාභයක් සිදු වන නිසාම නොව එයට වඩා විශාල හානියක් සමාජයට සිදු කරන බැවින්ය.

එක්සත් ජාතීන්ගේ අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාංශය (UNODC) විසින් පවත්නු ලබන දූෂණ විරෝධී පාඨමාලාවට අනුව දූෂණය නිසා ලොවට සිදු වන ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි සංක්ෂිප්ත කළ හැකිය.

### 1. තිරසර සංවර්ධන ඉලක්ක අවතක්සේරු වීම
### Undermining the Sustainable Development Goals

දූෂණය එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) සාක්ෂාත් කර ගැනීමට බාධා කරයි. තිරසර සංවර්ධන ඉලක්ක දූෂණයෙන් යටපත් වීමට ඉඩකඩ ඇත: ඒ මගින් "සැමට වඩා හොඳ සහ තිරසර අනාගතයක්" බොහෝ විට ස්වල්ප දෙනෙකුගේ අවශ්‍යතාවන්ට අනුව ක්‍රියාත්මක විය හැකි අතර බොහෝ දෙනකු විවිධාකාර දූෂණයන්ගෙන් පීඩා විඳිය හැකිය.

### 2. ආර්ථික අලාභය හා අකාර්යක්ෂමතාව
### Economic loss and inefficiency

දූසැරිය මගින් ආර්ථික අලාභයක් සිදු වීම අනිවාර්ය කරුණකි. දූෂණයේ ආර්ථික පිරිවැය පිළිබඳ නිශ්චිත සංඛ්‍යා ලබා ගැනීම දුෂ්කර වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) 2016 වාර්තාවෙන් ඇස්තමේන්තු කර ඇත්තේ අල්ලස් සඳහා පමණක් වසරකට ඩොලර් ට්‍රිලියන 1.5ත් 2ත් අතර මුදලක් වැය වන බවයි. මෙය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 2%ක සමස්ත ආර්ථික අලාභයක් නියෝජනය කරයි. මේ අනුව දූෂණය නිසා ලොවට අහිමි වන ධනය කෙතරම්දැයි අප කල්පනා කළ යුතුය.

### 3. දරිද්‍රතාව සහ අසමානතාව වර්ධනය වීම
### Poverty and inequality

දූෂණය නැමති ආයුධයෙන් දුප්පතුන්ට යහපතක් සිදු නොවේ. ජාත්‍යන්තර තෙල් සමාගමක් වන ෂෙල් සම්බන්ධව නයිජීරියාවේ, පැවති සුප්‍රසිද්ධ අල්ලස් නඩුවකදී හෙළි වූයේ ජාතික අයවැයටත් වඩා වැඩි මුදලක් දූෂිත නිලධාරීන්ට ෂෙල් සමාගම ගෙවා ඇති බවය. මෙම අල්ලස නිසා නයිජීරියානු ජනතාවට ඩොලර් බිලියන 1.1කට වඩා අහිමි විය. (ගෝලීය සාක්ෂිකරු, 2017) ඒ අනුව දූෂණය මගින් ජනතාව

දුප්පත් වන අතරම දූෂිත කුඩා කණ්ඩායමක් අසීමිත ලෙස ධනවත් වෙමින් සමාජය තුළ දැඩි ආර්ථික අසමාන බවත් වර්ධනය කරයි.

## 4. පුද්ගලික පාඩු, බියගැන්වීම් සහ අපහසුතා
## Personal loss, intimidation and inconvenience

මිනිසුන් දූෂණය අත්විඳින විට එය කලාතුරකින් ධනාත්මක අත්දැකීමක් වේ. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට, ගොඩනැගිලි බලපත්‍රයක් ලබා ගැනීමට, සහනාධාර ලබා ගැනීමට හෝ දුරකථන සේවා භුක්ති විඳීමට අල්ලසක් ගෙවිය යුතුය. අධිකරණ ක්ෂේත්‍රය දූෂිත වුවහොත් විනිසුරුවරයෙකු පක්ෂයකට එරෙහිව තීන්දු ලබා දෙන්නේ නඩුවේ කරුණු පදනම් කරගෙන නොව, ප්‍රතිවාදියා අල්ලසක් ගෙවීම, බලවත් තැරැව්කරුවකු දන්නා නිසා හෝ එකම වාර්ගික හෝ ජනවාර්ගික පසුබිමකින් පැමිණි නිසාය. මෙම නිසා දූෂණය මගින් බොහෝ දෙනෙකුට පුද්ගලික පාඩු සිදු වන අතර රාජ්‍ය පාලනය සාධාරණ නොවීම මගින් බොහෝ දෙනෙකුට බියෙන් හා අපහසුතාවයෙන් ජීවත්වීමට සිදු වේ.

## 5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අක්‍රියතාව
## Public and private sector dysfunctionality

තනි දූෂිත ක්‍රියාවන්ගේ සමුච්චිත බලපෑම අක්‍රියතාවයි. යම් සේවාවක් රාජ්‍යය මගින් සිදු කළද, පෞද්ගලික අංශ මගින් සිදු කළද, පොලිසියට, වෛද්‍යවරුන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට  අල්ලස් ලබා දිය යුතු නම්, එම භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය අඩු වන අතර ඒවා ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩා මිල අධික, කාලය ගතවන සහ අසාධාරණ බවට පත් වේ.

## 6. යටිතල පහසුකම් දුර්වල වීම
## Failures in infrastructure

රජය විසින් යටිතල පහසුකම් සඳහා වියදම් කරන මුදල් දූෂණයට ලක් වූ විට එහි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ එම යටිතල පහසුකම් ඉතාමත් දුර්වල තත්වයෙන් ගොඩනැගීමය. 2018 අගෝස්තු මාසයේදී ඉතාලියේ වරාය නගරයක් වන ජෙනෝවාහි පාලමක් කඩා වැටීමෙන් අවම වශයෙන් පුද්ගලයෝ 39 දෙනෙක් මියගියහ. මෙම පාලම කඩා වැටීම හා දූෂණය අතර එක්වරම පැහැදිලිව පෙනෙන සබඳතාවක් නොවූවද, පසුව කරන ලද පරීක්ෂණවලින් හෙළි වී ඇත්තේ 'මාෆියාව' පාලනය කරන ඉදිකිරීම් සමාගමක් ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රියාවලියේදී 'බාල සිමෙන්ති' භාවිත කර ඇති බවයි. (NZHerald, 2018).

## 7. දණ්ඩමුක්තිය සහ පක්ෂපාතී යුක්තිය
## Impunity and partial justice

දූෂණය අධිකරණ පද්ධතිය පුරා පැතිරී ඇති විට, මිනිසුන්ට තවදුරටත් තම රාජකාරිය ඉටු කිරීම සඳහා නඩු පවරන්නන් සහ විනිසුරුවන් කෙරෙහි විශ්වාසය තැබිය නොහැක. බලවත් අයට යුක්තියෙන් ගැලවිය හැකිය. පුරවැසියන්ට, විශේෂයෙන් මුදල් නොමැති හෝ මූල්‍ය හෝ දේශපාලන වශයෙන් බලවත් මිතුරන් නොමැති පුද්ගලයන් අසාධාරණ ලෙස අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබ, නිසි නඩු විභාග යකින් තොරව, වැරදි ලෙස සිරගත කළ හැකිය.

## 8. නිදහස් නොවන ජනප්‍රියවාදයේ නැගීම
## Rising illiberal populism

2017 වසරේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් වාර්තාවක් සහ විද්වත් ප්‍රකාශන කිහිපයක් පෙන්වා දෙන්නේ අධිකාරිත්වය වැඩි කිරීම අර්ධ වශයෙන් දූෂණයට හේතු වී ඇති බවයි. කෙටියෙන් කිවහොත්, දූෂණය අසමානතාව වැඩි කරයි, මහජන වගවීම සහ දේශපාලන ප්‍රතිචාර දැක්වීම අඩු කරයි, එමගින් පුරවැසියන් අතර ඉහළ යන කලකිරීම් සහ දුෂ්කරතා ඇති කරයි.

## 9. සංවිධානාත්මක අපරාධ සහ ත්‍රස්තවාදය වර්ධනය
## Organized crime and terrorism

මුදල් විශුද්ධිකරණය, රහසිගත මූලාශ්‍ර මගින් ලැබෙන ධනය සහ අල්ලස් මගින්, දූෂිත අධිකරණ නිලධාරීන් සහ දූෂිත දේශපාලනඥයින් සමාජයේ සාපරාධී කටයුතුවලට රැකවරණය ලබාදෙයි. මේ නිසා ප්‍රචණ්ඩත්වය, නීති විරෝධී මත්ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය, ලිංගික වහල්භාවය, පැහැරගෙන යෑම සහ බිය ගැන්වීම් ඉහළ යයි.

## 10. රාජ්‍යයේ ධාරිතාව අඩු වීම
## Diminished state capacity

ගැටලුවලට විසඳුම් ලබා දෙන ලෙස පුරවැසියන් දැඩි ලෙස ඉල්ලා සිටියද, දූෂණය දේශපාලනයේ බලය අඩපණ කරයි. නිදසුනක් වශයෙන්, අල්ලස්, බලපෑම් වෙළෙඳාම සහ රාජ්‍ය අල්ලා ගැනීම පුළුල් ලෙස පැතිරී ඇති තාක් දුරට, දේශපාලන පද්ධතිවලට සමාජීය ගැටලු විසඳීමට නොහැකි වනු ඇත.

## 11. ධ්‍රැවීකරණය හා නොසන්සුන්තාව වැඩි කිරීම
## Increasing polarization and unrest

දූෂණය, විශේෂයෙන් රාජ්‍යය බලය  අල්ලා ගැනීම සම්මතයක් බවට පත් වූ විට, එය පුරවැසියන් අතර ධ්‍රැවීකරණයට තුඩු දිය හැකිය: දූෂිත පාලන තන්ත්‍රයන්ට සහාය දක්වන අය සහ එකී පාලනයට විරුද්ධ අය වශයෙන් සමාජය දැඩි ලෙස බෙදීමකට ලක් වේ. මෙම විරුද්ධ කණ්ඩායම් අතර, සම්මුතිය හා තර්කානුකූල සාකච්ඡාව නොපවතී. ප්‍රතිපත්තිය විනිශ්චය කරනු ලබන්නේ දෘෂ්ටිවාදයේ පදනම මත හෝ ව්‍යාපෘතියක ආවේනික කුසලතා මත නොව, ප්‍රතිපත්ති යෝජනා කරන්නන් කවුරුන්ද යන්න සහ තරගකාරී පාර්ශ්වය වෙතින් ලැබෙන ප්‍රතිලාභ මොනවාද? යන්න සලකා බැලීමෙනි.

## 12. දේශගුණික විපර්යාස සහ ජෛව විවිධත්වයට වන හානිය
## Climate change and damage to biodiversity

දූසැරිය නිසා රාජ්‍යයන්ගේ පරිසර, වනජීවී හා වන සංරක්ෂණ නීති මගහැර යමින් පරිසර විනාශයන් සිදු කරයි. වන සංරක්ෂණය හා තිරසර වන කළමනාකරණ වැඩසටහන් පරාජය කරයි, වනජීවී හා ධීවර අපරාධවලට ඉන්ධන සපයයි. මේ හේතුවෙන් දූසැරිය ගෝලීය වශයෙන් දේශගුණ විපර්යාසයන් හා ජෛව විවිධත්ව හානිය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරයි.

## 13. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්
## Human rights violations-

දූසැරිය නිසා නිතැතින්ම සුදුස්සාට සුදුසු තැන නොලැබී යයි. යුක්තිය ඉටුවීමට බාධා ඇති කරයි. එසේම දූෂිත පාලකයින් සිවිල් නිදහස බලය තහවුරු කිරීමට බාධාවක් ලෙස සලකනු ලබයි. එබැවින් දූසැරිය දිගින් දිගටම පවත්වාගෙන යෑම සඳහා දූෂිත දේශපාලනඥයෝ සහ දූෂිත නිලධාරීහු එක්ව ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය කරති.

## 14. සන්නද්ධ ගැටුම් සහ කුරිරු අපරාධ
## Armed conflict and atrocity crimes

දූෂණය හේතුවෙන් ඇති වූ රාජ්‍ය ධාරිතාව හා සංවර්ධනය අඩු වීම අනාරක්ෂිතභාවයට හා සන්නද්ධ ගැටුමට පවා තුඩු දිය හැකිය (බලන්න, උදා: ලෝක බැංකුව, 2011; ලෝක බැංකුව, 2017). ඇත්ත වශයෙන්ම, දූෂණය රාජ්‍යයන් අස්ථාවර කිරීමේ සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

## 15. මහජන කලකිරීම සහ නුරුස්සනාබව
## Public frustration and cynicism

දූෂණය පුළුල්ව පවතින බවත් දූෂිත ක්‍රියාකාරීන් වගකිව යුතු නැති බවත් එමගින් මිනිසුන් නායකයින්, සමාජ පද්ධති (රාජ්‍ය ආයතන) සහ සමහර විට සමාජය හා ආචාරධර්ම කෙරෙහි පවා විශ්වාසය නැති කර ගනී. දේශපාලන වගවීම නොවන විට, එවැනි හැඟීම් දිග්ගැස්සුණු කාල පරිච්ඡේදයන් සඳහා පවතින අතර පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වය හීන වේ.

# නවවන පරිච්ඡේදය

## දූෂණය හා ජාත්‍යන්තරය

### 9-දූසැරියට එරෙහි ගෝලීය පෙළගැස්ම

"සොරකමින් සොයන මුදල්වලට රෝද තිබෙන අතර දූෂණයෙන් සොයන මුදල්වලට තටු තිබේ" යනුවෙන් ප්‍රවාදයක් පවතී. එහි අදහස වන්නේ එක් රටක දූෂණයෙන් උපයාගන්නා මුදල් වෙනත් රටක ආයෝජනය කරන බවයි. එසේම දූෂණය යනු ලොව සෑම රටකටම පිළිලයක් වූ දෙයකි. එසේම රටක දූෂණයේ බලපෑම එක් රටකට පමණක් නොව රටවල් කිහිපයකට බලපානු ඇත. එබැවින් දූෂණයට එරෙහිව ජාත්‍යන්තර පෙළගැසීමක් පවතී. ජාත්‍යන්තරය දූෂණය පිටුදැකීම සඳහා ගෙන ඇති උත්සාහයක් කිහිපයක් විස්තර කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

#### එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ක්‍රියාකාරිත්වය

දූසැරිය අවම කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විශාල මෙහෙයක් ඉටු කරමින් සිටියි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ඇති බොහෝ මානව හිමිකම් ලේඛනවල දූෂණය පිටුදැකීමට අනුබල දෙන විවිධ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත. ඒ හැරුණ විට දූෂණය පිටුදැකීම සඳහා වෙනම ජාත්‍යන්තර සම්මුතියක් සම්මත කරන ලදි. එසේම දූසැරිය පිටුදැකීම සඳහා වෙනම නියෝජිත ආයතනයක්ද පිහිටුවන ලදි.

#### එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ජාත්‍යන්තර සම්මුතිය (UN-UNCAC)

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 29 දින සම්මත කරන ලද මෙම සම්මුතියේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ලොව පුරා සිදු වන දූෂණය අවම කිරීමය. ඒ සඳහා අදාළ නිතිමය ප්‍රතිපාදන සැලැසීම හා දූෂණය මැඩලීම සඳහා ජාත්‍යන්තර වශයෙන් සහාය ලබාදීමේ වගකීමක් සාමාජික රටවල්වලට පැවරීම මෙම සම්මුතිය මගින් සිදු වේ.

අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට අමතරව දූෂණයට එරෙහිව ජාත්‍යන්තර නීතිමය මෙවලමක් අවශ්‍ය බව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2002 වසරේ අංක 55/61 දරන යෝජනාව මගින් පිළිගන්නා ලදි. ඒ අනුව 2002 ජනවාරි සිට 2003 ඔක්තෝබර් දක්වා සැසි වාර

හතකදී සාකච්ඡා කර 2003 ඔක්තෝබර් 1 වන දින මෙම සම්මුතිය මහා මණ්ඩලය විසින් සම්මත කරන ලදි. පසුව එය 2003 දෙසැම්බර් 09 වන දින රාජ්‍යයන් වෙත අත්සන් කිරීම සඳහා ඉදිරිපත් කරන ලදි. සෑම වසරකම දෙසැම්බර් 9 ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය ලෙස නම් කර තිබෙන්නේ මෙම සම්මුතිය අත්සන් කළ දිනය සිහි කිරීම වෙනුවෙනි. ඒ අනුව සම්මුතිය 2005 දෙසැම්බර් 14 වන දින සිට බලාත්මක විය. මේ වන විට එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් 181 ඇතුළුව පාර්ශ්වයන් 186ක් මෙම සම්මුතියේ පාර්ශ්වකරුවන් වී ඇත. ඒක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් 12ක් තවම මෙම සම්මුතිය අපරානුමත කර නොමැත.

ශ්‍රී ලංකාව මෙම සම්මුතිය සඳහා ආරම්භයේම අත්සන් කරන ලද රාජ්‍යයකි. සම්මුතියේ ප්‍රධාන කාර්යයන් 3කි. එනම්,

I. වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස දූෂණ වැළැක්වීමේ සහ මර්දනය කිරීමේ පියවර ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.

II. වත්කම් ආපසු ලබා ගැනීම ඇතුළු දූෂණ වැළැක්වීමේදී සහ ඊට එරෙහිව ක්‍රියාත්මක වීමේදී ජාත්‍යන්තර සහාය සහ තාක්ෂණික සහාය ප්‍රවර්ධනය කිරීම සහ ආධාර කිරීම.

III. රජ්‍ය කටයුතු සහ රාජ්‍ය දේපළ පිළිබඳ විනිශ්චාසනීයත්වය ප්‍රවර්ධනය කිරීම.

## දූෂණ විරෝධී ජාත්‍යන්තර සම්මුතියේ අන්තර්ගතය

දූෂණ විරෝධී සම්මුතිය ප්‍රධාන කොටස් 8කින් සමන්විත වේ.

### I. සාමාන්‍ය විධිවිධාන-

සම්මුතියේ කාර්යභාරය කුමක්ද යන්න විස්තර කිරීම, සම්මුතියේ විෂය පථය හා සම්මුතියට බැඳෙන රාජ්‍යයන්ගේ ස්වෛරීභාවය ආරක්ෂා වීම පිළිබඳ ප්‍රතිපාදන මෙම කොටසේ ඇතුළත් වේ. දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා පරිචයන් සැකසීම, දූෂණ විරෝධී ආයතන ගොඩනැගීම, රාජ්‍ය නිලධාරීන් සඳහා චර්යාධර්ම පද්ධති හඳුන්වා දීම, රාජ්‍ය ප්‍රසම්පාදනය හා රාජ්‍ය මුදල් කළමනාකරණය විධිමත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබාදීම, නඩු පැවරීම පිළිබඳ කාර්යයන් විධිමත් කිරීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, දූෂණ වැළැක්වීමට පෞද්ගලික අංශයේ හා සිවිල් සමාජයේ සහාය ලබා ගැනීම ආදිය සඳහා සාමාජික රාජ්‍යයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මෙම කොටස මගින් ප්‍රතිපාදන සලසා ඇත.

### II. වැළැක්වීමේ පියවර

දූෂණ වැළැක්වීම සඳහා සාමාජික රාජ්‍යයක් විසින් අනුගමනය කිරීමට බැඳෙන පියවරයන් මෙම කොටස තුළ අන්තර්ගත වේ.

## III. අපරාධකරණය සහ නීති ක්‍රියාත්මක කිරීම

සාමාජික රාජ්‍යයන් විසින් තම රාජ්‍යයන් තුළ දූෂණය පිටුදැකීම සඳහා තම නීති පද්ධතිය තුළට අපරාධ වැරදි ලෙස හඳුන්වා දිය යුතු අපරාධ වැරදි පිළිබඳ විස්තරයක්ද, එම වැරදිවලට අදාළව පරීක්ෂණ කිරීමේදී හා නඩු මෙහෙයවීමේදී අනුගමනය කළ යුතු පරිචයන් පිළිබඳව ප්‍රතිපාදනද මෙම කොටසේ ඇතුළත් වේ. මෙහි සඳහන් විශේෂ කරුණක් වනුයේ පුද්ගලික අංශයේ සිදු වන අල්ලසද අපරාධ වරදක් ලෙස නීතියට ඇතුළත් කළ යුතු බවයි.

## IV. ජාත්‍යන්තර සහයෝගීතාව

දූෂණය පිටුදැකීම සඳහා සාමාජික රාජ්‍යයන් විසින් තවත් සාමාජික රාජ්‍යයක සහයෝගය ලබාගැනීම, අපරාධ විමර්ශනයන් සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම, එකාබද්ධව විමර්ශන සිදු කිරීම සැකකරුවන් උදර්පනය, අන්‍යොන්‍ය නීති ආධාර, අපරාධ නීති කෘත්‍යයන් මාරු කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීමේදී සහයෝගය ලබා ගැනීම ආදී කරුණු පිළිබඳව ප්‍රතිපාදන මෙම කොටස තුළ ඇතුළත් වේ.

## V. වත්කම් ආපසු ලබාගැනීම

දූෂිත ආකාරයෙන් උපයාගන්නා ලද වත්කම් නැවත රජයට ලබාගැනීම පිළිබඳව සාමාජික රාජ්‍යයන් විසින් අනුගමනය කළ යුතු නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධ ප්‍රතිපාදන මෙම කොටසේ ඇතුළත් වේ. විශේෂයෙන්ම දූෂිත ක්‍රම මගින් උපයාගත් වත්කම් විදේශවල පවතින විට එම වත්කම් රාජසන්තක කිරීමකදී විදේශ රාජ්‍යයන්ගේ සහාය ලබාගන්නා ආකාරය පිළිබඳවද ප්‍රතිපාදන මෙම කොටස තුළ ඇතුළත් වේ.

## VI. තාක්ෂණික සහාය සහ තොරතුරු හුවමාරු කර ගැනීම

දූෂණය පිටුදැකීම සඳහා අවශ්‍ය තොරතුරු සාමාජික රාජ්‍යයන් අතර හුවමාරු කර ගැනීම හා දූෂණය පිටුදැකීම සඳහා අදාළ පුහුණු වීම් හා ක්‍රමවේද, අත්දැකීම් තාක්ෂණික සේවාවන් හුවමාරු කර ගැනීම පිළිබඳ ප්‍රතිපාදන මෙම කොටස තුළ අන්තර්ගත වේ.

## VII. ක්‍රියාත්මක කිරීම සඳහා වූ යාන්ත්‍රණය

මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික රාජ්‍යයන්ගේ සම්මේලනයක් ස්ථාපනය කර ඇති අතර එම සම්මේලනය මගින් සම්මුතිය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ ප්‍රතිපාදන මෙම කොටස තුළ අන්තර්ගත වේ.

## VIII. අවසාන විධිවිධාන-

සම්මුතියට සම්බන්ධ වීම්, සාමාජික රාජ්‍යයන් අතර ආරවුල් විසඳීම්, සම්මුතිය බලාත්මක වීම හා සම්මුතියට සංශෝධන එකතු කිරීම් ආදී ප්‍රතිපාදන මෙම කොටස තුළ අන්තර්ගත වේ.

## අපරාධ හා මත්ද්‍රව්‍ය සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය- UNODC

1997 වසරේදී ආරමභ වූ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය 2002 වසරේදී අපරාධ හා මත්ද්‍රව්‍ය සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය ලෙස නාමකරණය කෙරිණි.

දූෂණ නිවාරණය පිළිබදව නිලවශයෙන් වගකීම පැවරී ඇති එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනය වන්නේ මෙම අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳව වූ කාර්යාලයයි. නීතිවිරෝධී ජාවාරම් සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, අපරාධ වැළැක්වීම සහ අපරාධ යුක්තිය, ජාත්‍යන්තර ත්‍රස්තවාදය සහ දේශපාලන දූෂණය පිළිබඳ අන්තර් සම්බන්ධිත ප්‍රශ්න වඩා හොඳින් සම්බන්ධීකරණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහාය වීම සඳහා UNODC පිහිටුවන ලදි. මෙම අරමුණු මූලික කාර්යයන් තුනක් හරහා සිදු කරනු ලැබේ: එනම් **විවිධ අපරාධ**, මත්ද්‍රව්‍ය, **ත්‍රස්තවාදය**, සහ **දූෂණයට** සම්බන්ධ සම්මුතීන්, ගිවිසුම් හා ප්‍රොටෝකෝලයන් මෙන්ම තාක්ෂණික/මූල්‍යමය ආධාර ද සම්මත කර ක්‍රියාත්මක කිරීමේදී රජයන්ට පර්යේෂණ, මග පෙන්වීම සහ සහාය දීමයි.

මත්ද්‍රව්‍ය, අපරාධ, ත්‍රස්තවාදය සහ දූෂණයට සම්බන්ධ ගැටලු විසඳීම සඳහා රජයන් වඩා හොඳින් සන්නද්ධ කිරීම, රජයේ ආයතන සහ සෙසු ආයතන අතර මෙම කරුණු පිළිබඳ දැනුම උපරිම කිරීම සහ මහජනයා අතර ඉහත කරුණු පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම මෙම කාර්යාලයේ අරමුණයි.
එසේම මෙම කාර්යාලය එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයන්ගේ සම්මේලනයේ (Conference of the States Parties (CoSP) to the UNCAC) හි ලේකම් කාර්යාලය ලෙසද කටයුතු කරයි. දූෂණ විරෝධී මාර්ගගත පාඨමාලාවන් මෙහෙයවයි.

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය - Transparency International-TI

දූෂණයට එරෙහිව කටයුතු කරනු ලබන ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නොවන සංවිධානයකි. එකම දර්ශනයක් බෙදා ගන්නා ගෝලීය ව්‍යාපාරයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙහි දර්ශනය වන්නේ රජය ව්‍යාපාරය සිවිල් සමාජය සහ ජනතාවගේ දෛනික ජීවිතය දූෂණයෙන් තොර ලෝකයක් බවට පත් කිරීමයි.

1993 වසරේදී පුද්ගලයන් කිහිප දෙනෙකුගෙන් ආරම්භ කළ මෙම ව්‍යපාරය මේ වන විට රටවල් 100කට අධික රටවල් ගණනක් පුරා විහිදී ඇත.

## දූෂණ සංජානන දර්ශකය- Corruption Perception Index-CPI

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් 1995 වසරේ සිට වාර්ෂිකව ප්‍රකාශයකට පත් කරනු ලබන දර්ශකයකි. රටවල් පිළිබඳව සිදු කරනු ලබන සමීක්ෂණයන් මගින් දූෂණ අනුව රටවල් ශ්‍රේණිගත කිරීම මෙම දර්ශකය මගින් සිදු කරයි. මෙම දර්ශකය සකස් කිරීම සඳහා දූෂණය ලෙස සලකනු ලබන්නේ "මහජන බලය පුද්ගලික ප්‍රයෝජනය සඳහා අනිසි ලෙස යොදාගැනීම" යන්නයි.

මෙම දර්ශකය සකස් කිරීම සඳහා රාජ්‍ය අංශයේ දූෂණ මට්ටම පිළිබඳව ව්‍යාපාරිකයින්ගේ සහ රට තුළ සිටින විශේෂඥයින්ගේ මතය (සංජානනය) එකිනෙකට වෙනස් වූ ආයතන කිහිපයක් මගින් ලබාගනියි.

2020 ජනවාරියේ ප්‍රකාශයට පත් කරන ලද 2019 දූෂණ සංජානන දර්ශකයට රටවල් 180ක් ශේණිගත කර ඇත. එසේ ශ්‍රේණිගත කර ඇත්තේ ලකුණු 100 (ඉතා පිරිසිදු) සිට 0 (අතිශය දූෂිත) දක්වා පරිමාණයෙනි. ඩෙන්මාර්කය (ලකුණු 88) නවසීලන්තය (ලකුණු 87) සහ ෆින්ලන්තය (ලකුණු ?) ලෝකයේ දූෂණය අවම රටවල් ලෙස සැලකෙන අතර එම රටවල් ජාත්‍යන්තර මූල්‍ය විනිවිදභාවය අතින් අඛණ්ඩව ඉහළ මට්ටමක සිටියි. ලෝකයේ වඩාත්ම දූෂිත රට සෝමාලියාව වන අතර එය ලබාගත් ලකුණු ප්‍රමාණය 10කි.

ශ්‍රී ලංකාව 38ක අගයක් හිමි කරගෙන රටවල් 180 අතරින් අසූ නව වන (89) ස්ථානයේ පසුවෙයි. දකුණු ආසියාතික රටවල් අතරින් තුන් වන (03) ස්ථානය හිමි කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇතත් එය පසුවන්නේ පිළිවෙළින් ලෝකයේ විසි පස්වන (25) සහ හැත්තෑ අට (78) වන ස්ථාන හිමි කර ගන්නට සමත් වූ භූතානය සහ ඉන්දියාවට පසුපසිනි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය දක්වන ආකාරයට, රටක පවත්නා දූෂණ මට්ටමේ තරම සහ එම රට කොපමණ මට්ටමකට ප්‍රජාතන්ත්‍රවාදීද යන්න අතර සම්බන්ධයක් පවතී. එම ආයතනය දක්වන ආකාරයට, පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී රටවල්, දූෂණ සංජානන දර්ශකයේ ලබන සාමාන්‍ය අගය 75ක් වන අතර දුර්වල ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ලබා ගන්නා සාමාන්‍ය අගය 45ක් ලෙස වාර්තා වේ. ප්‍රජාතන්ත්‍රවාදී එහෙත් ඒකාධිපති ප්‍රවණතා සහිත දෙමුහුන් රාජ්‍යයන්වල සාමාන්‍ය අගය 35 වන අතර අවම සාමාන්‍ය අගයක් සහිතව නරකම තත්වයෙන් පසුවන්නේ ඒකාධිපති පාලනය සහිත රටවල් වේ. එම රටවල සාමාන්‍ය අගය 30ක් ලෙස දැක්වේ. ඒ අනුව මෙම විග්‍රහයෙන් යෝජිත ආකාරයට, ශ්‍රී ලංකාව දුර්වල ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී නමුත් ඒකාධිපති ප්‍රවණතා පෙන්නුම් කරන දෙමුහුන් පාලනයක් පවත්නා රටවල් අතර ස්ථානගත වී ඇත.

දූෂණය පිටු දැක ප්‍රජාතන්ත්‍රවාදය සැබෑ ලෙස තහවුරු කිරීම සඳහා, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය, සියලු රජයන් වෙත පහත දැක්වෙන ඉල්ලීම් යොමු කර සිටියි.

- දේශපාලන බලය සංවරණය සහ තුලනය කිරීමේ වගකීම සඳහා පිහිටුවා ඇති සියලු ආයතන ශක්තිමත් කර ඒවා බලපෑම් සහ බාධාවන්ගෙන් තොරව නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සහතික කිරීම;

- දූෂණ විරෝධී නීති සහ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අතර පවත්නා පරතරය දුරු කිරීම;

- දේශපාලන ක්‍රියාකාරකම් සහ රාජ්‍ය වියදම් පිළිබඳ දේශීය වශයෙන් අධීක්ෂණය කරන සිවිල් සංවිධාන සවිබල ගැන්වීම;

- මාධ්‍ය ආයතනවල ස්වාධීන පැවැත්මට සහය දීම සහ මාධ්‍යවේදීන්ට බියෙන් සහ හිරිහැරවලින් තොරව වාර්තාකරණය සිදු කළ හැකි පරිසරයක් සහතික කිරීම.

## ගෝලීය දූෂණ බැරෝමීටරය- Global corruption Barometer- GCB

ගෝලීය දූෂණ බැරෝමීටරය ලොව විශාලතම මහජන මත විමසුම ලෙස හඳුන්වනු ලැබේ. ලොව ප්‍රමුඛතම දූෂණ විරෝධී ව්‍යාපාරය වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් හි මෙහෙයවීමෙන් මෙම මහජන මත විමසුම සිදු කරනු ලැබේ.
එය ඡන්ද විමසීමක් වැනිය. ජාතික මට්ටමින් හා ජාත්‍යන්තර මට්ටමින් දූෂණය තනි පුද්ගලයන්ට බලපාන්නේ කෙසේද සහ ලොව පුරා දූෂණ මැඩපැවැත්වීම සඳහා ගන්නා උත්සාහයන් පිළිබඳ බිම් මට්ටමේ අදහස කුමක්ද යන්න දැනගැනීම සඳහා දර්ශකයන් සපයයි.

රටක පවතින දූෂණයේ විවිධ ස්වරූපයන් හා දූෂණයේ නැඹුරුතා පිළිබඳව මෙම බැරෝමීටරය හරහා අවබෝධයක් ලබාගත හැකිය.

## විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වය- OGP

විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වය 2011 වර්ෂයේදී ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ආරම්භ කරන ලදි. මෙහි අරමුණ වූයේ දේශීය ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරීන්ට සිය ආණ්ඩු වඩාත් විවෘතව, වගවීමෙන් යුක්තව හා ජනතාවට ප්‍රතිචාර දක්වන පරිදි සිදු කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර වේදිකාවක් සකස් කිරීමයි. ආරම්භයේදී මෙම සංධානය සඳහා රටවල් 8ක් සම්බන්ධ වූ අතර මේ වන විට රටවල් 65ක් මෙහි හවුල්කාරීන් ලෙස කටයුතු කරයි. එමෙන්ම ලොව පුරා විහිදී ඇති ජාතික හා ජාත්‍යන්තර සිවිල් සමාජ සංවිධාන 90ක් පමණද මෙහි සාමාජිකයින් ලෙස ක්‍රියාකාරීව කටයුතු කරයි. මෙම සියලු රටවල්වල ආණ්ඩුව හා සිවිල් සංවිධාන එක්ව විවෘත ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණ සැකසීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරයි. මෙම හවුල්කාරීත්වයේ අලුත්ම හවුල්කරු වන්නේ ශ්‍රී ලංකාවයි.

## සුදුසුකම් ලැබීම සඳහා වන උපමාන

යම් රටක් විවෘත ආණ්ඩුකරණය හවුල්කාරීත්වය සඳහා සාමාජික වීමට මූලිකව සුදුසුකම් ලබන්නේ එම රාජ්‍යය විසින් මූල්‍ය විනිවිධභාවය, තොරතුරු සඳහා ප්‍රවේශය, ආදායම් හා වත්කම් හෙළිදරව් කිරීම හා පුරවැසි සහභාගීත්වය යන අංග හතර නිසියාකාරව ක්‍රියාවට නගන්නේ නම් පමණි.

මේ අනුව මෙම එක් එක් අංග සඳහා ලකුණු ලබා දීමක් සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකාව මේ වන විට සමස්ත ලකුණු 16න් 14ක් ලබාගෙන ඇත.

## හවුල්කාරී ආණ්ඩුවල වගකීම

මෙම හවුල්කාරීත්වයේ සාමාජිකත්වය ලබන සෑම රාජ්‍යයක්ම සුදුසුකම් ලැබීමේ උපමාන වෙත ළඟා වීම, විවෘත ආණ්ඩුකරණ ප්‍රකාශනය වැළඳගැනීම, මහජන සංවාදයක් තුළින් සකස් කරන ලද සවිමත් විවෘත ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණ සහිත ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීම හා සිය ප්‍රගතිය ස්වාධීන ලෙස වාර්තා කිරීම සිදු කළ යුතුය.

## විවෘත ආණ්ඩුකරණ ප්‍රකාශනය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශය, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය හා මානව හිමිකම් හා යහපාලනයට අදාළ අනෙකුත් එක්සත් ජාතීන්ගේ ලේඛනයන්හි ඇතුළත් කරුණු පිළිගනිමින් සියලු ජනතාවට විවෘත ආණ්ඩුකරණයක් ඉල්ලා සිටීමේ අයිතිය මෙම ප්‍රකාශනය මගින් පිළිගනියි. එමෙන්ම විවිධ රාජ්‍යයන් විවෘත ආණ්ඩුකරණයේ විවිධ පියවරයන්හි පසු වන බවද හඳුනාගෙන ඇත. එමෙන්ම මෙම ප්‍රකාශනය මඟින් විනිවිදභාවය ඉහළ නැංවීම, දූෂණයට එරෙහිව සටහන් කිරීම, පුරවැසියන් ශක්තිමත් කිරීම, ආණ්ඩුව වඩාත් ඵලදායී හා වගවීමෙන් යුක්ත වීම සඳහා නව තාක්‍ෂණය වැළඳ ගැනීම අවශ්‍ය බව සියලු රාජ්‍ය විසින් පිළිගනියි. එමෙන්ම ආණ්ඩුකරණයේ විවෘතභාවය ඉහළ නැංවීමට පොරොන්දු වෙයි. එමෙන්ම ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ලබා දීම ඉහළ නැංවීමට, සිවිල් සහභාගීත්වයට සහය දැක්වීමට, පරිපාලන ක්‍ෂෙත්‍රය තුළ ඉහළ මට්ටමටමේ වෘත්තීය සුපිළිපන් බවක් පවත්වාගෙන යෑම හා විවෘතභාවය හා වගවීම වර්ධනය කිරීම සඳහා නව තාක්‍ෂණය යොදා ගැනීමට පොරොන්දු වේ.

## විවෘත ආණ්ඩුකරණ මූලධර්ම

විවෘත ආණ්ඩුකරණ මූලධර්ම 4ක් විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වය විසින් පිළිගැනීමට ලක් කර ඇත. එනම්

- විනිවිදභාවය
- වගවීම
- පුරවැසි සහභාගීත්වය
- තාක්ෂණය හා නව්‍යකරණය

## විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වය හා ශ්‍රී ලංකාව

රාජ්‍ය වගවීම ශක්තිමත් කිරීමට හා විනිවිදභාවය වර්ධනය කිරීමට ගනු ලැබූ පියවරක් ලෙස ශ්‍රී ලංකාව මෙහි සාමාජිකත්වය ලබා ගැනීමේ ඉල්ලීමක් 2015 ඔක්තෝබර් මස 21 වන දින අධිකරණ අමාත්‍යතුමා විසින් විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වයේ සම සභාපතිවරුන් වෙත යොමු කරන ලදි. ඒ අනුව මෙහි සාමාජිකත්වය ශ්‍රී ලංකාව සඳහා හිමි වූ අතර දකුණු ආසියානු කලාපය තුළ මෙම හවුල්කාරීත්වයෙහි සාමාජිකත්වය ලැබූ එකම රට ශ්‍රී ලංකාවයි.

## ජාතික ක්‍රියාකාරී සැලැස්ම

විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව පළමු වරට 2016-2018 සඳහා පළමු ජාතික සැලැස්ම සකස් කළ අතර දෙවන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2021 සඳහා මේවන විට සකස් කර කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. මෙහි බැඳීම් 15ක් ඇති අතර එහි අංක 1 ලෙස සඳහන් වන්නේ "රාජ්‍ය ආයතන තුළ සුපිළිපන් නිලධාරීන් යෙදවීම තුළින් අල්ලස සහ දූෂණය වැළැක්වීම සඳහා පුරවැසි සහභාගීත්වය වර්ධනය කිරීම"යි. බැඳීම් අංක 2 වන්නේ "කාර්යක්ෂම වත්කම් ප්‍රකාශන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම තුළින් වත්කම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සහ මහජන ප්‍රවේශය පහසු කරලීම"යි. මෙම බැඳීම් දෙකම සෘජුවම දූෂණය වැළැක්වීමට සම්බන්ධ ක්‍රියාකාරකම් වේ.

## තිරසර සංවර්ධන අභිමතාර්ථ - Sustainable Development Goals-SDG

දිළිඳුකම පිටුදැකීම, මිහිතලය රැකගැනීම සහ සැමට සෞභාග්‍යය උදා කර දීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයෙහි අංගයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2015 වර්ෂයේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ එළිදක්වන ලදි.

තිරසර සංවර්ධනය සඳහා න්‍යාය පත්‍රය "අපගේ ලෝකය වෙනස් මගකට යොමු කිරීම" ප්‍රකාශය මගින් තිරසර අභිමතාර්ථ 17ක් හඳුන්වාදෙන ලදි. එම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා ඉලක්ක 169ක්ද, එම ඉලක්ක කරා ළඟා වූ බව සහතික කිරීම

සඳහා නිර්ණායක 244ක්ද මේ වන විට හඳුනාගෙන ඇත.

ඒ අනුව තිරසාර සංවර්ධන අභිමතාර්ථ අතර 16 වන අභිමතාර්ථය වන්නේ "තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ල ඇතුළත් සමාජ ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම, සියලු මට්ටම්වල ඵලදායි වගවීම සහ ඇතුළත් ආයතන ගොඩනැගීම"යි. එහි මෙම අභිමතාර්ථය ඉටු කර ගැනීම සඳහා වන 5වන ඉලක්කය වනුයේ "සියලු ආකාරයේ අල්ලස හා දූෂණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීම"යි.

මෙම ඉලක්කය ඉටු වී තිබේද යන්න දැන ගැනීම සඳහා වන නිර්ණායක දෙක වනුයේ

- පසුගිය මාස 12 තුළ රජයේ නිලධාරියෙකු සමඟ අවම වශයෙන් එක් සම්බන්ධතාවයක් හෝ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලසක් ලබා දුන් හෝ අල්ලස් ඉල්ලා සිටි පුද්ගලයින්ගේ අනුපාතය.

- පසුගිය මාස 12 තුළ රජයේ නිලධාරියෙකු සමඟ අවම වශයෙන් එක් සම්බන්ධතාවයක් හෝ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලසක් ලබා දුන් හෝ එම රාජ්‍ය නිලධාරීන් අල්ලස් ඉල්ලා සිටි ව්‍යාපාරවල අනුපාතය.

මේ අනුව නීති රීති හා සම්මුති මෙන්ම සහයෝගය ලබාදෙන ආයතන ව්‍යුහයක්ද දූෂණයට එරෙහිව පෙළගැසී පවතී.

## 10-දූසැරිය පැරදවූ හොංකොංග දේශය

### හොංකොංහි පැවති දූසැරිය

හොංකොංහි 1960 සහ 70 දශකවල ශීඝ්‍ර වෙනසක් සිදු විය. ජනගහනයේ දැවැන්ත වර්ධනය සහ නිෂ්පාදන කර්මාන්තයේ වේගවත් ව්‍යාප්තිය, සමාජ හා ආර්ථික සංවර්ධනයේ වේගය වැඩි කළේය. නීතියේ පාලනය පවත්වාගෙන යන අතරම නිවාස හා වෙනත් සේවාවන්හි අත්‍යවශ්‍ය දෑ ලබා දීමේදී වර්ධනය වූ ජනගහනයේ අසීමිත අවශ්‍යතා සපුරාලීමට රජයට නොහැකි විය. මෙම වාතාවරණය ප්‍රතිපත්තියක් නොමැති දූෂිතයන්ට තෝතැන්නක් විය. මූලික සේවාවන් පමණක් නොව ජීවනෝපායක් සහ සුරක්ෂිතභාවයක් ලබා ගැනීම සඳහා බොහෝ දෙනෙකුට නිසි ක්‍රමවේදයෙන් බැහැරව ගොස් නිලධාරීන්ට අල්ලස් දී සිය කාර්යය කරවා ගැනීමට සිදු විය.

රාජ්‍ය අංශයේ දූෂණය පැතිරී තිබුණි. රෝගියෙකු රැගෙන යෑමට පෙර ගිලන්රථ කාර්ය මණ්ඩලය අල්ලස් ඉල්ලා සිටියි. රෝහල් සේවකයෝ පවා රෝගීන්ට ඇඳ ඇතිරිලි හෝ වතුර වීදුරුවක් ලබා දීමට පෙර අල්ලස් ඉල්ලා සිටියහ. පොදු නිවාස, පාසල් අධ්‍යාපනය සහ වෙනත් මහජන සේවාවන් සඳහා අයදුම් කිරීමේදී අදාළ නිලධාරීන්ට අල්ලස් දීමද අවශ්‍ය විය. පොලිස් බලකාය තුළ දූෂණය විශේෂයෙන් බරපතළ විය. දූෂිත පොලිස් නිලධාරීහු, සූදුව සහ මත්ද්‍රව්‍ය ක්‍රියාකාරකම්වලට ආරක්ෂාව සැපයූහ. නීතිය හා සාමය තර්ජනයට ලක් විය. පුරවැසියන් බොහෝ දෙනෙක් දූෂණයට ගොදුරු වී

### පීටර් ගොඩ්බර් සිදුවීම

1973 වසරේදී හොංකොංහි ප්‍රධාන පොලිස් අධිකාරිවරයා වූ පීටර් ගොඩ්බර් (Peter Godber)ට එරෙහිව විමර්ශනයක් ආරම්භ විය, චෝදනාවන් වූයේ හොංකොං ඩොලර් මිලියන 4.3කට අධික අයථා වත්කම් ඉපැයීමයි. ඔහු ඉතා දූෂිත ක්‍රම මගින් මෙම වත්කම් උපයාගෙන ඇති බව අනාවරණය කෙරෙමින් තිබියදී ගොඩ්බර් රටින් පැන ගියේය. ඒ සඳහා රජය ඉඩකඩ සැලසූ බවට ජනතාව විසින් චෝදනා කරන ලදි.

මෙම ක්‍රියාවට එරෙහිව විශාල ජනතා පෙළගැස්මක් ඇති විය. වික්ටෝරියා උද්‍යානයේ පැවති මහජන රැලියක් සඳහා සිසුන් පෙරමුණ ගත් අතර දූෂණ ගැටලුව විසඳීමට රජය අපොහොසත් වීම පිළිබඳව විරෝධය පළ කරමින් එය හෙළා දුටු උද්ඝෝෂකයෝ මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා රජයට බල කළහ. "දූෂණයට එරෙහිව සටන් කරන්න, ගොඩ්බර් අත්අඩංගුවට ගන්න" වැනි සටන් පාඨ සහිත විරෝධතාකරුවන් කියා සිටියේ නඩු විභාගයට පෙනී සිටීම සඳහා ගොඩ්බර් නැවත රටට ගෙන්වන ලෙසයි.

### ඇලෙස්ටෙයාර් විමර්ශනය

වැඩි වන මහජන උද්ඝෝෂණයන්ට ප්‍රතිචාර වශයෙන් රජයට කඩිනම් පියවර ගැනීමට සිදු විය. ගොඩ්බර් 1973 ජූනි 8 වන දින පැන යෑමෙන් පසු ගොඩ්බර්ගේ පලායෑම පිළිබඳව විමර්ශන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයෙකු වූ ශ්‍රීමත් ඇලෙස්ටෙයාර් බ්ලෙයාර්-කෙර් (Sir Alastair Blair-Kerr) පත් කරන ලදි. ඔහු වාර්තා දෙකක් සම්පාදනය කළේය. පළමුවැන්න ගොඩ්බර් පැන යෑමේ තත්වයන් විස්තර කරයි.

සිය දෙවන වාර්තාවේ ශ්‍රීමත් ඇලෙස්ටෙයාර් පෙන්වා දුන්නේ, දූෂණය වැළැක්වීම සඳහා ස්වාධීන ආයතනයක අවශ්‍යතාවයි. "දූෂණ විරෝධී කාර්යාලය පොලිසියෙන් වෙන් නොවන්නේ නම්, දූෂණයට එරෙහිව සටන් කිරීමට රජය සැබවින්ම අදහස් කරන බව වගකිවයුතු ආයතනවලට සාමාන්‍යයෙන් නොහැගෙනු ඇත." යනුවෙන් ඔහු සිය වාර්තාවේ මේ බව සඳහන් කළේය.

### අයිසීඒසී උපත

බ්ලෙයාර්-කෙර් වාර්තාවට අනුව යමින්, එවකට ආණ්ඩුකාර ශ්‍රීමත් මරේ මැක්ලෙහෝස් (Sir Murray MacLehose) 1973 ඔක්තෝම්බර් මාසයේදී ව්‍යවස්ථාදායක සභාවට කළ කථාවකදී ස්වාධීන දූෂණ විරෝධී සංවිධානයක ආරම්භ කිරීමේ වැදගත්කම ප්‍රකාශ කළේය.

රජයේ බොහෝ දෙනෙකුට මේ අවස්ථාවේ වෙනස් වීමට අවශ්‍ය බව දැනුණි. එලෙදායී දූෂණ විරෝධී තන්ත්‍රයක උපත සඳහා රජය වේදිකාව සැකසීම ආරම්භ කළේය.

### දූෂණයට එරෙහි ස්වාධීන කොමිෂන් සභාව (අයිසීඒසී)

දූෂණයට එරෙහි ස්වාධීන කොමිෂන් සභාව (අයිසීඒසී) 1974 පෙබරවාරි මාසයේදී පිහිටුවන ලදි. කොමිෂන් සභාව ආරම්භයේ සිටම නීතිය ක්‍රියාත්මක කිරීම, වැළැක්වීම සහ අධ්‍යාපනය යන ත්‍රිවිධ ප්‍රවේශයක් භාවිත කරමින් දූෂණයට එරෙහිව සටන් කිරීමට කැප වී සිටී. අයිසීඒසී හි පළමු වැදගත් කාර්යය වූයේ ගොඩ්බර් යුක්තිය ඉදිරියට ගෙන ඒමයි. නඩු විභාගය සඳහා 1975 මුල් භාගයේදී ගොඩ්බර් එංගලන්තයෙන් පිටුවහල් කරන ලදි. චෝදනා කුමන්ත්‍රණ වරදක් සහ අල්ලස් ලබා ගැනීමකි. ගොඩ්බර් මෙම කරුණු දෙකෙහිම වැරදිකරු වූ අතර වසර හතරක සිර දඬුවමක් නියම කෙරිණි.

එක් කොමසාරිස්වරයකුගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන අසීඒසී හි කාර්ය මණ්ඩලය 1400ක් පමණ වේ. මේ අතරින් හරි අඩක් පමණ වසර 10කට වඩා සේවා කාලයක් ඇති අයයි. ප්‍රාදේශීය කාර්යාල 10කි. ලොව ශක්තිමත්ව දූෂණය විරෝධී ක්‍රියාත්විතය ලෙස අයිසීඒසී හැඳින්විය හැකිය. (විස්තර සඳහා පිවිසෙන්න https://www.icac.org.hk/en/about/history/index.html) හොංකොං දේශය අද දූෂණයෙන් තොර රාජ්‍යයන් අතර ප්‍රමුඛ පෙළේ පසුවේ.

# සිව්වන පරිච්ඡේදය

## දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික පෙළගැස්ම

### 11-දූසැරිය පිටුදැකීම සඳහා පවතින නීතිමය ප්‍රතිපාදන

දූසැරිය හෙවත් දූෂණය (corruption) අවම කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන රැසක් ශ්‍රී ලාංකික නීති පද්ධතිය තුළ පවතී. එකී නීතිමය ප්‍රතිපාදන පිළිබඳව සංක්ෂිප්ත හඳුනාගැනීමක් සිදු කිරීම මෙම සටහනේ අරමුණයි. දූසැරිය අවම කිරීම සඳහා ශ්‍රී ලාංකික නීතියේ ප්‍රතිපාදන රැසක් පවතී. ඒ අතරින් ප්‍රධානම නීතිමය ප්‍රතිපාදන පහත පරිදි ලැයිස්තුගත කළ හැකිය.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1954 අංක 11 දරන අල්ලස් පනත
3. 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත
4. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත
5. දණ්ඩ නීති සංග්‍රහය (15 වන අධිකාරය)
6. 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත
7. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
8. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත
9. 2018 අංක 19 දරන ජාතික විගණන කොමිෂන් සභා පනත
10. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත
11. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත
12. මැතිවරණ පනත් (ජනාධිපතිවරණ/පාර්ලිමේන්තු මහ මැතිවරණ/පළාත් සභා ඡන්ද විමසීම්/පළාත් පාලන ඡන්ද විමසීම්)
13. 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත
14. 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත (393 වන අධිකාරය)

15. 1978 අංක 7 විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නීතිය
16. ආයතන සංග්‍රහය
17. මූල්‍ය රෙගුලාසි
18. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

## 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

දූෂණ වැළැක්වීමේ අරමුණින්ම නොවුවද දූෂණය වැළැක්වීමට අනුබල දෙන ප්‍රතිපාදන රැසක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ඇතුළත් වී ඇත.

### 1.1. මූලික යුතුකම්

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ IVවන පරිච්ඡේදය ජනතාවගේ මූලික යුතුකම් හා වගකීම් දක්වමින් එහි 28(1) වගන්තියේ "පොදු දේපළ සුරක්ෂිතව ආරක්ෂා කිරීමද පොදු දේපළ අයථා ප්‍රයෝජනයට ගැනීමට හා නාස්ති කිරිමට එරෙහිව ක්‍රියා කිරීමද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය" යනුවෙන් දක්වා තිබේ.

### 1.2. මූලික අයිතිවාසිකම්

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව III වන පරිච්ඡේදයේ සඳහන් වන මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපාදන තුළින් දූෂණ සිදුවීමට ඇති ඉඩකඩ අඩු වී යයි. එකී පරිච්ඡේදයේ සඳහන් යම් අයිතිවාසිකමක් රජයේ විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝනය වී ඇත්නම් හෝ උල්ලංඝනයට අත්‍යාසන්න නම් ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ ශ්‍රී ලංකාව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කර සහන ලබාගත හැකිය. ඒ නිසා දූෂිත ක්‍රියාවන් මගින් මෙම පරිච්ඡේදයේ සඳහා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් වැළැක්වීමට ප්‍රතිපාදන සැකසී ඇත.

උදාහරණ ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා 12 (1) ව්‍යවස්ථාව අනුව "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්වසාධාරණ විය යුත්තේය" යනුවෙන් සඳහන් කර ඇත. එසේම දූෂණ වැළැක්වීමට ඇති ප්‍රමුඛ අවශ්‍යතාව මත තොරතුරු දැනගැනීමට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇත.

### 1.3. රාජ්‍ය මූල්‍ය පාලනය

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා XVII පරිච්ඡේදයට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. මේ අනුව රජය සතුව ඒකාබද්ධ අරමුදලක් පවතින අතර එකී ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු පාලනය සතුව පවතී.ඒ අනුව පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කිරීම වාර්ෂික අයවැය මගින් සිදු කරන අතර එම මුදල් වියදම් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුව

සුපරීක්ෂාකාරී වේ. ස්ථාවර කමිටු මගින් එම වියදම් කිරීම් අනුමත නීතිරීතිවලට අනුව සිදු කර තිබේද යන්න විමසිලිමත් වේ.

## 1.4. විගණකාධිපති

රාජ්‍ය මූල්‍ය පිළිබඳව කටයුතු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයා පත්කරනු ලබයි. ඔහුගේ කාර්ය හා කර්තව්‍ය 154(1) ව්‍යවස්ථාවේ දක්වා ඇත. ඒ අනුව විගණකාධිපතිවරයාට පළාත් පාලන ආයතන ඇතුළුව රජයේ සියලු ආයතනවල හා රාජ්‍ය ගිණුම් සමාගම්වල විගණනය කිරීමේ බලය ඇත. ඒ සඳහා,

- සියලු පොත්පත්, වාර්තා, සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමටද
- ගබඩාවලට සහ වෙනත් දේපළවලට පිවිසීමටද
- එම කාර්යය කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු ලබා ගැනීමේදී කරුණු පැහැදිලි කරවා ගැනීමටද බලය ඇත.

විගණකාධිපතිවරයා මෙම ආකාරයට සිදු කරනු ලබන විගණන වාර්තා වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර එහිදී හෙළි වන දූෂණය පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ පැවැත්වීම හා නඩු පැවරීම සිදු කරනු ලබයි.

එසේම පාර්ලිමේන්තුව මගින් සිය ස්ථාවර කමිටු දෙක වන රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව (COPE) හා රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) මගින් රාජ්‍යය ආයතන පිළිබඳව විමර්ශන සිදු කරන්නේද විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කර ගෙනය.

## 1.5. ස්වාධීන කොමිෂන් සභා

රාජ්‍ය සේවයේ විවිධ ක්ෂේත්‍රයන් නියාමනය හා විමර්ශනය සඳහා වන කොමිෂන් සභා 10ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වාධීන කොමිෂන් සභා ලෙස හඳුනාගෙන ඇත. මේ අතරින් කොමිෂන් සභා 8ක්ම සෘජුම දූෂණ අවම කිරීම සඳහා අදාළ වේ. එනම්:-

අධිකරණ සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණන කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවයි.

## 1.6. ඔම්බුඩ්ස්මන්වරයා

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්' යන දීර්ඝ නාමයෙන් හඳුන්වන ඔම්බුඩ්ස්මන්වරයා පිළිබඳව ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ 156 ව්‍යවස්ථාව තුළ දක්වා ඇත. ඒ අනුව රජයේ ආයතනවලින් සිදු වන මූලික අයිතිවාසිකම් කඩවීම් හා වෙනත් අසාධාරණ ක්‍රියාවන් පිළිඳව සිදු කරනු ලබන පැමිණිලි චෝදනා විමර්ශනය කර නිර්දේශ ලබා දීමට ඔම්බුඩ්ස්මන්වරයාට බලය ඇත.

## 2. 1954 අංක 11 දරන අල්ලස් පනත

1954 අංක 11 දරන අල්ලස් පනත මගින් අල්ලස් හා දූෂණ වැරදි කුමක්ද යන්න අර්ථ නිරූපණය කර ඇති අතර එම වැරදි සිදු වන ආකාර පිළිබඳව හා අදාළ දඬුවම් හඳුන්වා දී ඇත. අල්ලස් හා දූෂණ පිටුදැකීම සඳහා ඇති ප්‍රමුඛතම පනත අල්ලස් පනත ලෙස හැඳින්විය හැකිය. අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරද වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක් ලෙස මෙම පනත දක්වා ඇත.

**2.1. අල්ලස**

අල්ලස් පනතේ 90 වන වගන්තියට අනුව අල්ලස යන්නෙන් පනතේ II වන කොටසේ යම් විධානයක් උල්ලංඝනය කරමින් යම් තුටු පඬුරක් පිරිනැමීම, අයැදීම හෝ භාර ගැනීම නැතහොත් එබඳු යම් විධානයක් උල්ලංඝනය කරමින් කරනු ලබන වෙන යම් ක්‍රියාවක් අදහස් වේ.

**2.2.අයථා වත්කම් ඉපැයීම**

යම් තැනැත්තකුගේ දැනගත් ආදායම් හෝ ලැබීම් මාර්ගයකින් හැර වෙනත් ආකාරයෙකින් මුදල් හෝ දේපළ රැස් කරන්නේ නම් එම තැනැත්තා විසින් ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් එකී මුදල් හෝ දේපළ අල්ලස් මාර්ගයෙන් රැස් කළ බවට සලකනු ලැබේ.

**2.3. දූෂණය-**

1954 අංක 11 දරන අල්ලස් පනතට එක්කරන ලද 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් ශ්‍රී ලාංකික නීතියට දූෂණය නැමති වරද හඳුන්වා දී ඇත. ඒ අනුව එකී දූෂණය යනු,

"ආණ්ඩුවට අයතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තෙකු වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තෙකුට අයුතු ලෙස පාඩු සිදු විය හැකි බව නැතහොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්, එනම්:-

(අ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොළඹවන,

(ආ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන,

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයන් ගැනීමෙහිලා සහභාගි වන,

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන යම් රජයේ සේවකයකු, දූෂණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වරදකරු

## 3. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

1975 අංක 1 දරන මෙම වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත මගින් තම වත්කම් හා බැරකම් රජයට ප්‍රකාශ කිරීම වගකීම ඇති තැනැත්තන් පිළිබඳව දක්වා ඇත. ඒ අනුව රාජ්‍ය ආයතනවල නිලධාරීන් මෙන්ම මහජන නියෝජිතයින්ද අදාළ තනතුරට පත් වී මාස 3ක් ඇතුළත,

1. තමාගේ සියලු වත්කම් හා බැරකම්
2. තම විවාහක පාර්ශ්වයේ සියලු වත්කම් හා බැරකම්
3. දරුවන්ගේ වත්කම් හා බැරකම් (අවිවාහක)

නියමිත ආකෘතියෙන් යුතුව ඉදිරිපත් කළ යුතුව ඇත.
එය පළමු වත්කම් හා බරකම් ප්‍රකාශය සිදු කිරීමෙන් පසු වසරක් පාසා ප්‍රකාශය සිදු කිරීමට වගකීමක් ඇත.

නියමිත කාලය තුළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම, සාවද්‍ය ප්‍රකාශ ලබාදීම, නිසි පරිදි තොරතුරු ලබා නොදීම මෙම පනත යටතේ වරදක් වන අතර, එක් පුද්ගලයකුගේ මුල් වත්කම් හා බැරකම් ප්‍රකාශය ඊළඟ වත්කම් බරකම් ප්‍රකාශය අතර ඇති වෙනස පැහැදිලි කිරීමට ඔහුට වගකීමක් ඇත.

මේ අනුව අල්ලස් හා දූෂණ ක්‍රියාවලින් උපයාගත් ධනය ඇත්නම් මේ පනතේ ප්‍රතිපාදන අනුව ඔහු වරදකරුවකු බවට පත් වේ.

## 4. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත

අල්ලස හා දූෂණය පිළිබඳව විමර්ශනය කිරීම හා නඩු පැවරීම සඳහා පූර්ණ බලැති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීම මෙම 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත මගින් සිදු විය. අල්ලස් පනතේ සඳහන් අල්ලස හා දූෂණය පිළිබඳ වැරදි පිළිබඳව මෙන්ම වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වන වැරදි පිළිබඳව විමර්ශන සිදු කිරීම හා නඩු පැවරීමද මෙම කොමිෂන් සභාවේ මූලික කාර්යයන් වේ.

## 5. දණ්ඩ නීති සංග්‍රහය (15 වන අධිකාරය)

අල්ලස අපරාධ වරදක් බවට හඳුන්වාදුන් පලමු නීතිය වන්නේ 1889 වර්ෂයේදී සම්මත කරන ලද දණ්ඩ නීති සංග්‍රහයයි. එහි IX වන පරිච්ඡේදය වෙන්ව ඇත්තේ "රජයේ සේවකයන් විසින් කරනු ලබන වැරදි හෝ රජයේ සේවකයන් සම්බන්ධ වැරදි" වෙනුවෙනි.

දණ්ඩ නීති සංග්‍රහයේ 158 වගන්තියට අනුව රජයේ සෙවකයකු නිල ක්‍රියාවක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල නොවන ගෙවීම් හැර කුඩු පඩුරක් ගැනීම වරදක් ලෙස දක්වා තිබේ. එය වසර තුනක සිරදඬුවම් හා දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකි.

එසේම එහි 159 වන වගන්තිය දක්වන්නේ දූෂිත හෝ නීති විරෝධි මාර්ගවලින් රජයේ සේවකයකුට බලපෑම් සඳහා තුටු පඩුරක් ගැනීම වරදක් වන අතර වසර තුනක සිරදඬුවම් හා දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදක් බවයි.

එසේම දණ්ඩ නීති සංග්‍රහයේ 160 වන වගන්තියෙන් දැක්වෙන්නේ රජයේ සේකවයකු කෙරෙහි පෞද්ගලික බලය පාවිච්චි කිරීම සඳහා තුටු පඩුරක් ගැනීම වරදක් වන අතර වසරක කාලයක සිරදඬුවම් හා දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදක් බවයි.

1954 අංක 11 දරන අල්ලස් පනත නිතීගත වීමෙන් පසුව දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන භාවිත නොකර අල්ලස් පනතේ ප්‍රතිපාදන භාවිත කරනු ලබයි.

රාජ්‍ය නිලධාරීන්ට සම්බන්ධ මෙම ප්‍රතිපාදනවලට අමතරව මැතිවරණයකදී ඡන්දය දීම සඳහා හෝ මන්ත්‍රීධුර අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමේ කාර්යයට බලපෑම් කිරීම සඳහා අල්ලස් දීම වරදක් බව දණ්ඩ නීති සංග්‍රහයේ 169 ආ වගන්තියේ දැක්වේ.

## 6. 1982 අංක 12 දරණ පොදු දේපළ විශයෙහිලා සිදුකරනු ලබන වැරදි පිළිබඳ පනත

මෙම පනතට අනුව පොදු දේපළ විෂයෙහි අනර්ථය සිදු කිරීම, පොදු දේපළ සොරකම් කිරීම, පොදු දේපළ කොල්ලකෑම, පොදු දේපළ විෂයෙහි වංක ව්‍යාපහරණය සාපරාධී විශ්වාසය කඩකිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ ගිණුම් වරදවා පෙන්වීම අපරාධ වැරදි ලෙස හඳුනාගෙන ඇත.

පනතට අනුව පොදු දේපළ යන්නෙන් "ආණ්ඩුවේ දේපළද, යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩයලයක, රාජ්‍ය සංස්ථාවක, සමූපකාර සමිතියක හෝ සමූපකාර සංගමයක දේපළද අදහස් වේ."

චෝදනාවට අදාළ දේපළහි වටිනාකම රුපියල් 25,000කට වඩා වැඩි වන අවස්ථාවකදී මෙවැනි වරදකට අත්අඩංගුවට පත්වූ අයකුට ඇප ලබා දිය හැක්කේ සුවිශේෂී කරුණු මත පමණි.

## 7. 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත

අල්ලස හා දූෂණය මගින් උපයා ගන්නා ලද ධනය සෘජුවම ඉදිරිපත් කිරීමේදී සමාජයේ සැකසංකා මතු වන බැවින් බොහෝ දෙනෙක් අල්ලස හා දූෂණයෙන් උපයා ගන්නා ධනය වෙනස් ගනුදෙනුවලට භාජනය කර සමාජයට ඉදිරිපත් කරනු ලැබේ. එය මුදල් විශුද්ධිකරණය ලෙස හඳුන්වනු ලැබේ. දූෂණය වැළැක්වීමේදී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ප්‍රමුඛ අවශ්‍යතාවක් වේ.

මෙම පනතට අනුව මුදල් විශුද්ධිකරණය අපරාධ වරදක් ලෙස හඳුනාගෙන ඇත. එවැනි වැරදි පිළිබඳව මහාධිකරණයදී නඩු විභාග කළ යුතු අතර වරදකරු වන තැනැත්තෙකුට විශුද්ධිකරණය කළ දේපළහි වටිනාකම මෙන් තුන්ගුණයක දඩයක්ද වසර පහ සිට විස්ස දක්වා සිරදඬුවම්ද නියම කරනු ලැබේ. එසේම මුදල් විශුද්ධිකරණයෙන් උපයාගත් දේපළ රාජසන්තක කරනු ලැබේ.

පනතේ 3වන වගන්තියට අනුව මුදල් විශුද්ධිකරණය යනු,

"යම් දේපළක් සෘජුවම හෝ වක්‍රව යම් නීති විරෝධි ක්‍රියාකාරකමකින් හෝ යම් නීතිවිරෝධි ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ බව දැනුවත්ව හෝ දැනගනු ලැබීමට හේතු ඇතිව-

(අ) එසේ සෘජුවම හෝ වක්‍රව යම් නීති විරෝධි ක්‍රියාකාරකමක් නැතහොත් යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් ලක් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ හෝ යම් දේපළක් පිළිබඳ ගනුදෙනුවක සෘජුවම හෝ වක්‍රව යෙදෙනඃ

(ආ) සෘජුවම හෝ වක්‍රව යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් නැතහොත් යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධ වූ යම් දේපළක් භාරගන්නා, සන්තකයේ තබා ගන්නා, සඟවා ගන්නා, බැහැර කරන හෝ ශ්‍රී ලංකාවට ගෙන එන, ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලබන හෝ ශ්‍රී ලංකාවේ ආයෝජනය කරනු ලබන" අවස්ථාවකි.

## 8]. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත

විනිවිධභාවය වර්ධනය කිරීම දූෂණය වැළැක්වීමේ ප්‍රමුඛ අවශ්‍යතාවකි. පොදු අධිකාරීන්ගේ විනිවිධභාවය හා වගවීම වර්ධනය කිරීම සඳහා සම්මත කරන ලද තොරතුරු අයිතිවාසිකම් පනත මගින් සියලු පුරවැසියන්ට පොදු අධිකාරීන්ගේ භාරයේ සන්තකයේ හෝ පාලනයේ පවතින තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වා දී ඇත. එසේම පනත මගින් පුරවැසියන්ට පොදු අධිකාරීන්ගේ තොරතුරු ඉල්ලා ලබා ගැනීමට අයිතියක් සඳහා ප්‍රතිපාදන සලස්වා ඇති අතර පුරවැසියන්ට නිරන්තරයෙන් අවශ්‍ය වන තොරතුරු ප්‍රගාමීව ප්‍රසිද්ධ කිරීමේ වගකීම් පොදු අධිකාරීන් වෙත පවරා ඇත.

බඳවාගැනීම් උසස්වීම් ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් සහනාධාර ක්‍රියාවලිය වැනි තොරතුරු බාධාවකින් තොරව ජනතාවට ලැබෙන විට දූෂණය අවම කිරීමේ හැකියාව ඇත, එසේම පනත මගින් යම් ආකාරයකට දූෂණ විරෝධී හඬනගන්නන්ගේ ආරක්‍ෂාව සලසා තිබීමද සැලකිය යුත්තකි.

## 9]. 2008 අංක 19 දරණ ජාතික විගණන කොමිෂන් සභා පනත

විගණන ක්‍රියාවලිය වඩාත් ස්වාධීන කිරීම සඳහා විගණන පනත නීතිගත කර ඇත. එමගින් විගණන සේවාව සඳහා ස්වාධීනව කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහා අවස්ථාව සලසා දී ඇති අතර විගණන ක්‍රියාවලිය සඳහා වඩාත් බලාත්මක කර ඇත. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති විගණකාධිපතිවරයාගේ බලතල හා කාර්යභාරය වඩාත් නිශ්චිත කර තිබේ. එසේම මහජන පැමිණිලි මත විගණකාධිපතිවරයාගේ විමර්ශන පිළිබඳව නිශ්චිත ප්‍රතිපාදන සලස්වා ඇති බැවින් දූෂණ විරෝධී ක්‍රියාවලියට ජනතාව වඩාත් සමීප කරගත හැකිය. විගණන ක්‍රියාවලිය සාර්ථක හා ස්වාධීන වීම මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ හා පාලන ක්‍රියාවලියේදී සිදු විය හැකි දූෂණයන් අවම වීම සිදු වේ.

## 10]. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම, අනාවරණය කිරීම හා සැකකටයුතු මූල්‍ය ගණුදෙනු පිළිබඳව දත්ත එකතු කිරීම සඳහා අදාළ ආයතනවලට වගකීම් පැවරීමත් ඒ සඳහා විශේෂ වූ මූල්‍ය බුද්ධි ඒකකයක් පිහිටුවීමත් මෙම පනත මගින් ප්‍රතිපාදන සලසා තිබේ.
ඒ අනුව දූෂිත ආකාරයේ මූල්‍ය ගනුදෙනු බැංකු හා වෙනත් මූල්‍ය ආයතන හරහා සිදුවීම මෙම පනත මගින් වළක්වා තිබේ.

## 11]. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත

රාජ්‍ය අංශයේ සිදුවන අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් මගින් පුද්ගලයකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් සිදු වන්නේ නම් හෝ සිදු වීමට අත්‍යාසන්න වන්නේ නම් එවැනි අවස්ථාවක ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීමට මෙම පනත මගින් අවස්ථාව සලසා ඇත. එමගින් දූෂණ ක්‍රියාවන් සිදු කරන රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නිර්දේශ ලබාදීම හා අගතියට පත් පාර්ශ්වයන්ට වන්දි හා සහන නියෝග දෙනු ලැබේ.

## 12) මැතිවරණ පනත්

1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මහ මැතිවරණ පනත, 1988 අංක 2 පළාත් සභා ඡන්ද විමසීම් පනත හා 1946 අංක 55 දරන පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත අනුව ඡන්ද විමසීමකදී නිදහස්ව ඡන්දය භාවිතා කිරීම වැළැක්වීම සඳහා අල්ලස් දීම, සංග්‍රහ කිරීම හා අයුතු බලපෑම වරදක් ලෙස දක්වා ඇත. මෙම වැරදි එම පනත්වල දක්වා ඇති දූෂණ ක්‍රියා නැමති වැරදි ගණයට වැටෙන අතර එවැනි වරකට වරදකරු වුවහොත් සිර දඬුවමට හා දඩයට අමතරව වසර හතක කාලයක් ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීම ඡන්දය භාවිත කිරීම හා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම තහනම් වේ.

## 13). 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන ධුරයක් වන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා හෙවත් ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යය පිළිබඳ පටිපාටියට අදාළ කරුණු මෙම පනතේ අඩංගු වේ.

රාජ්‍ය ආයතනවලින් සිදු වන මූලික අයිතිවාසිකම් කඩවීම් හා වෙනත් අසාධාරණකම්වලට එරෙහිව ඔමබුඩ්ස්මන්වරයාට පැමිණිලි කර සහන ලබාගත හැකිය.

## 14). 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත (393 වන අධිකාරය )

පනතේ දෙවන වගන්තියට අනුව යම් රාජ්‍ය ආයතනයක සිදු වූ ක්‍රියාවලියක් සම්බන්ධව තොරතුරු ලබාගැනීම මහජන සුබසාධනය හා ආරක්ෂාවට අදාළ බවට ජනාධිපතිවරයාට හැඟී යන අවස්ථාවකදී ඒ පිළිබඳව සොයා බලා ජනාධිපතිවරයාට වාර්තා කිරීම පිණිස කොමිෂන් සභාවක් පත් කිරීමට ජනාධිපතිවරයාට බලය පවරා ඇත.

මෙම ප්‍රතිපාදන භාවිත කරමින් දූෂණ සිදුවීම් වූ බවට ප්‍රසිද්ධ වූ අවස්ථාවන්හිදී ජනාධිපතිවරුන් විසින් කොමිෂන් සභා පත් කර වාර්තා කැඳවා තිබේ.
මෙම පනතට 2019 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධනයට අනුව කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා සොයාගැනීම් මත අල්ලස් පනත යටතේ හෝ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වරදක් සිදු වී ඇති බව අනාවරණය වූ විට එකී නීති ප්‍රකාරව අපරාධ නඩු පවරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය හැකිය.

මෙම සංශෝධනය මගින් ජනාධිපති කොමිෂන් සභාවන් මගින් අනාවරණය කරනු ලබන දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම් කඩිනම් කෙරේ.

## 15]. 1978 අංක 7 විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නීතිය

රාජ්‍ය ආයතනවල හෝ රාජ්‍ය නිලධාරියකුගේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම මහජන ආරක්ෂාවට හෝ මහජන සුබසාධනයට අදාළ බව ජනාධිපතිවරයාගේ මතය වන අස්ථාවකදී ඒ පිළිබඳව සොයාබලා වාර්තා කිරීම පිණිස විශේෂ විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීමට මෙම පනතේ දෙවන වගන්තිය යටතේ ජනාධිපතිවරයාට බලතල පවතී.

## 16]. ආයතන සංග්‍රහය

රාජ්‍ය ආයතනවල මානව සම්පත කළමනාකරණය පිළිබඳ වූ පටිපාටිමය කරුණු ආයතන සංග්‍රහය තුළ ඇතුළත් වේ. රාජ්‍ය සේවකයකු රාජකාරි සිදු කිරීමේදී කළ යුතු දේ නොකළ යුතු දේ මෙන්ම අනාවරණය කළ යුතු කරුණුද මේ තුළ ඇතුළත් වේ.

විශේෂයෙන්ම XXIX පරිච්ඡේදයේ එනම් ඉඩම් අත්පත් කර ගැනීම හා උකස් පිළිබඳ පරිච්ඡේදයේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාදීම ඉඩම් අත්පත් කරගැනීම හා ආයෝජනය කොටස් සහ වෙනත් අයිතිවාසිකම් පිළිබඳව දක්වන ප්‍රතිපාදන මගින් රජයේ නිලධාරියකු දූෂණයන් මගින් දේපළ අත්පත් කර ගැනීම වළක්වා ඇත.

එසේම XLVII වන පරිච්ඡේදයේ ප්‍රතිපාදන මගින් රාජ්‍ය සේවකයින් ට අදාල ත්‍යාග ලබාගැනීම් පිළිබඳව සීමාවන් පනවා තිබේ.

එමෙන්ම ආයතන සංග්‍රහය අනුව රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන ආකාරයේ ක්‍රියාවක් සිදු කිරීම දඩුවම් දිය හැකි වරදක් ලෙස දක්වා ඇත

## 17]. මූල්‍ය රෙගුලාසි

රාජ්‍ය අංශයේ භෞතික සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීමට අදාළ ක්‍රියාවලිය විස්තර වන්නේ මූල්‍ය රෙගුලාසි මගිනි. එමගින් රාජ්‍ය ආයතන සතු භෞතික සම්පත් අයථා ලෙස පරිහරණය සඳහා වන ඉඩකඩ අවම කර ඇත.

## 18]. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් 2019 ඔක්තෝබර් මස 12 වැනි සෙනසුරාදා දින හා අංක 2144/68 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ -2019 පළ කර ඇත.

රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ, වැඩ, සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරගනු ලැබීමේදී, කාර්යක්ෂමබව, සාධාරණබව, යුක්ති සහගතබව, විනිවිදභාවය, තරගකාරිත්වය සහ වියදම් සඵලතාව තහවුරු කරන ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින්

මුදලට සරිලන වටිනාකම තහවුරු කරනු ලබන මූලධර්ම සහ පටිපාටි ස්ථාපිත කිරීම මෙම මාර්ගෝප සංග්‍රහයේ අරමුණ බව එහි දක්වා ඇත.

සමස්තයක් ලෙස ගත් කල රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු විය හැකි දූෂණ අවම කිරීම මෙහි ප්‍රධාන අරමුණකි.

## වෙනත් නීතිමය ප්‍රතිපාදන

ඉහත සදහන් අණපනත්වල හා මාර්ගෝපදේශයන්හි සඳහන් ප්‍රතිපාදන හැරුණ විට 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, 423 වන අධිකාරය වූ විනිමය පාලන පනත වැනි තවත් අණ පනත් රැසක් මගින් දූෂණය අවම කිරීම සදහා නීතිමය ප්‍රතිපාදන සලසා ඇත,

එයට අමතරව භාණ්ඩාගාර චක්‍රලේඛන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන හරහාද දූෂණය අවම කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා තිබේ.

ඒ හැරුණ විට ශ්‍රී ලංකා නීති ක්ෂේත්‍රය තුළ පවතින බොහෝ පනත් මගින් පිහිටුවා ඇති ආයතනවල නිලධාරීන් අල්ලස් පනත යටතේ රජයේ නිලධාරීන් ලෙස සලකන බවට සඳහන්ව පවතී. එමගින් උත්සාහ කරන්නේද එම ආයතන තුළ දූෂණය අවම කිරීම සදහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමයි.

මෙම නීතිමය ප්‍රතිපාදන හැරුණු විට අපරාධ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත මගින්ද දූෂණ පිළිබඳව විමර්ශන සිදුකිරීමේදී වින්දිතයින්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සැලසීමක් අපේක්ෂා කරන බැවින් දූෂණය මැඩලීම සඳහා එම පනතද උපකාරී වේ.

මේ අනුව දූෂණය අවම කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන රැසක් ශ්‍රී ලංකා නීතිරාමුව තුළ පවතින බව පැහැදිලි වේ.

# 12- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### බලතල හා කාර්යභාරය පිළිබඳ හැඳින්වීමක්

## ඉතිහාසය


අල්ලස නැමති වරද 1883 වසරේදී සංගෘහිත කරන ලද දණ්ඩනීති සංග්‍රහයට ඇතුළත් වරදක් වූ අතර ඒ පිළිබඳව මුල් කාලයේ විමර්ශන කටයුතු පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නඩු පැවරීම නීතිපතිවරයා විසින් සිදු කරන ලදි. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ අල්ලස නැමති වරදට මහජන නියෝජිතයිනට එරෙහිව චෝදනා නැගිය නොහැකි විය. ඒ ඔවුන් රාජ්‍ය නිලධාරීන් සේ නොසැලකෙන බැවිනි. එබැවින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයන් හා කොළඹ මහ නගර සභාවේ නියෝජිතයින් සිදු කළ අල්ලස් වැරදි පිළිබදව සොයා බැලීම සඳහා විමර්ශන කොමිෂන් සභා පත් කරන ලදි. එම්.එන් ද සිල්වා කොමිෂන් සභාව, පීටර් කෙනමන් කොමිෂන් සභාව හා එම්.ඩබ්ලිව්.එන් ද සිල්වා කොමිෂන් සභාව යන කොමිෂන් සභා 3ක් වරින් වර පත් කරන ලදි.

අල්ලස පිළිබඳව පුළුල් නීතියක අවශ්‍යතාව මතු වූ බැවින් 1954 වසරේදී අල්ලස් පනත රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් සම්මත කළ අතර එකී පනතට අනුව අල්ලස් කොමසාරිස්ධුරයක් ඇති කරන ලදි. පසුව 1958 අංක 40 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් අල්ලස් පනතට සිදුකරන ලද සංශෝධනයකට අනුව අල්ලස් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. ඒ අනුව අල්ලස පිළිබඳ විමර්ශන කටයුතු අල්ලස් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ අතර නීතිපතිවරයා විසින් නඩු පැවරීම සිදු කෙරිණි. පසුව 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය සම්මත වූ පසු එකී පනත යටතේ වැරදි පිළිබඳ විමර්ශනයද අල්ලස් දෙපාර්තමේන්තුවට පැවරිණි.

පසුව 1994 වසරේදී 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සම්මත කිරීමත් සමගම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්ථාපනය විය. 1994 වසරේදී අල්ලස් පනත සංශෝධනය වී දූෂණය නැමති නව වරද හඳුන්වා දුන් අතර දූෂණය පිළිබඳව විමර්ශන හා නඩු පැවරීමේ බලයද කොමිසමට හිමි විය.

17 වන හා 19 වන ආණ්ඩක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් කොමසාරිස්වරුන් පත් කිරීම සඳහා වඩාත් ස්වාධීන ක්‍රමවේදයන් හඳුන්වා දෙන ලදි. 2015 වසරේදී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අල්ලස සම්බන්ධ ස්ව මෙහෙයවීම මත නඩු පැවරීමේ බලතල කොමිෂන් සභාවට පැවරිණි. 2018 වසරේදී සම්මත කරන ලද 2018 අංක 22 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් දූෂණය නැමති වරද සඳහා මහාධිකරණයේ නඩු පැවරීමේ බලතල කොමිෂන් සභාවට ලැබිණි. 2019 වසරේදී සම්මත වූ 2019 අංක 03 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතට සිදු කරන ලද සංශෝධනයන් අනුව ජනාධිපති කොමිෂන් සභාවක සාක්ෂි මත නඩු පැවරීමේ බලතල කොමිසමට පවරන ලදි.

## කොමිෂන් සභාවේ සංයුතිය




## කොමසාරිස්වරුන්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතට අනුව කොමිෂන් සභාව කොමසාරිස්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වසර පහක නිලකාලයක් සඳහා කොමසාරිස්වරුන් පත් කරනු ලැබේ. මෙම කොමසාරිස්වරුන් අතරින් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරුන් විය යුතු බවද එක් කොමසාරිස්වරයකු අපරාධ විමර්ශන හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පළපුරුද්දක් ඇති අයෙකු විය යුතු බවද පනත දක්වා සිටියි. මෙම තිදෙනා අතරින් විශ්‍රාමික විනිසුරුවරයකු ජනාධිපතිතුමා විසින් සභාපති ලෙස පත් කරනු ලැබේ.

## අධ්‍යක්‍ෂ ජෙනරාල්

පනත යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට කොමිසමට සහය වීම පිණිස අධ්‍යක්‍ෂ ජෙනරාල් ධුරයක් ස්ථාපනය කර ඇත. කොමසාරිස්වරුන් විමසා ජනාධිපතිතුමා විසින් අධ්‍යක්‍ෂ ජෙනරාල්වරයා පත් කරනු ලැබේ.

## කොමිෂන් සභාවේ විෂය පථය

කොමිෂන් සභාවේ මූලිකම කාර්යයන් වන්නේ සිය විෂයපථයට අදාළ වැරදි සම්බන්ධව විමර්ශන සිදු කිරීම හා නඩු පැවරීමය.

කොමිෂන් සභාවේ විෂය පථය මූලික වශයෙන් කොටස් හතරකින් සමන්විත වේ.

1. අල්ලස් පනත යටතේ **අල්ලස්** ලබාගැනීම ඉල්ලීම හෝ ලබාදීම
2. අල්ලස් පනතේ යටතේ වන **දූෂණ**
3. අල්ලස් පනත යටතේ **අයථා වත්කම් ඉපයීම** (රාජ්‍ය නිලධාරියකු විසින්)

## විමර්ශනයන් සිදු කිරීම හා නඩු පැවරීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ලබා දී ඇති බලතලවලට අමතරව 2015 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 19 වන සංශෝධනය මගින් විශේෂී බලයක් ලබා දී ඇත.

එනම් "ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර, සඳහා විධිවිධාන සැලැස්වීම" වේ.

### කොමිෂන් සභාවේ බලතල

ඉහත කී අල්ලස් හෝ දූෂණ වැරදි හෝ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හා නඩු පැවරීමේ බලය කොමිෂන් සභාවට ඇත. පැමිණිල්ලක් නොමැතිව වුවද තමාගේම මෙහෙයවීමෙන් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳ මූලික පරීක්ෂණ පැවැත්වීමේ බලය කොමිසමට ඇත. විමර්ශන කටයුතු සඳහා,

- වාචික හෝ ලිඛිත සාක්ෂි ලබාගැනීම හා ප්‍රශ්න කිරීම
- ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පුද්ගලයන් කැඳවීම
- අසනු ලබන යම් ප්‍රශ්නයකට අදාළව දිවුරුම් ප්‍රකාශ ලබාදෙන ලෙස නියම කිරීම
- තමා සන්තකයේ හෝ භාරයේ පවතින ලේඛන හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා තැනැත්තෙකු කැඳවීම

- අල්ලස් චෝදනාවකට ලක්වූ අයකුගේ පවුලේ සාමාජිකයින්ගේ හෝ ඔහු අධ්‍යක්ෂධුරය දරණ සමාගමක අධ්‍යක්ෂවරයකුගේ බැංකු ගිණුම්වලට අදාළ විස්තර ලබාදෙන ලෙස බැංකු කළමනාකරුවන්ට විධාන කිරීම
- අල්ලස් චෝදනාවකට ලක්වූ අයකුගේ පවුලේ සාමාජිකයින්ගේ හෝ ඔහු අධ්‍යක්ෂධුරය දරන සමාගමක අධ්‍යක්ෂවරයකුගේ ආදායම් විස්තර ලබාදෙන ලෙස දේශීය ආදායම් කොමසාරිස් වෙත දැනුම්දීම
- යම් ලේඛනයක සහතික පිටපත් සපයන ලෙස රාජ්‍ය ආයතනයක ප්‍රධානීන්ට දැනුම්දීම
- අල්ලස් චෝදනාවක් ලක් වූ අයගේ පවුලේ අයට යම් දේපළක් අත්පත්කරගත් දිනය සඳහන් කරන ලෙස විධාන කිරීම
- අල්ලස් චෝදනා ලැබූවකුගේ පවුලේ අයගේ දේපළ පිළිබඳව විස්තර සහිත දිවුරුම් ප්‍රකාශ ලබාදෙන ලෙස විධාන කිරීම
- යම් චූදිතයකුට මාස තුනක කාලයක් දක්වා විදේශගත වීම වළක්වන ලෙස ආගමන විගමන පාලකවරයාට දනුම්දීම
- වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වූ වැරදි සම්බන්ධව විමර්ශනය කිරීම
- ස්ථාන පරීක්ෂා කිරීමේ බලය
- ගිණුම් වාර්තා ලේඛන ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීම

## කොමිෂන් සභාවේ බලතල

කොමිසම විසින් ආකාර 4ක පැමිණිලි භාරගනු ලබයි.

1. අල්ලස් ඉල්ලීම හෝ අල්ලස් දීමට පෙළඹවීම පිළිබඳ පැමිණිලි
2. දූෂණ පිළිබඳ පැමිණිලි
3. අයථා වත්කම් ඉපයීම පිළිබඳ පැමිණිලි
4. වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම හෝ සාවද්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳ පැමිණිලි

කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමඃ

1. සෘජු දුරකථනයෙන්
2. කොමිසම වෙත පැමිණ (1954 මගින්)
3. තැපැල් මගින්
4. ෆැක්ස් මගින්

5. ඊමේල් මගින්
6. කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය මගින්
7. කෙටි පණිවිඩ මිගින්
8. ජංගම දුරකථන මගින් සිදු කළ හැකිය.

## පැමිණිල්ලක ඇතුළත් විය යුතු කරුණු

අල්ලස් ඉල්ලීම හෝ ලබාදීම සම්බන්ධ පැමිණිල්ලකදී පැමිණිලිකරුගේ නම සදහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. අනෙකුත් වැරදි පිළිබඳව පැමිණිලි කිරීමේදී නිර්නාමිකව වුවද සිදු කළ හැකිය. ඒ අනුව සෑම පැමිණිල්ලකම සිදුවීම, චෝදනා ලබන පුද්ගලයාගේ නම, තනතුර හා ලිපිනය, වරද සිදු වන ස්ථානය, දිනය, තොරතුරු ලබාගත හැකි පුද්ගලයන්ගේ විස්තර ආදිය සදහන් කළ යුතුය.

## කොමිෂන් සභාවේ කටයුතුවල රහස්‍යභාවය

කොමිෂන් සභාවේ සාමාජිකයින් හා අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු සියලු නිලධාරීහු පනත යටතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හැර පනත යටතේ කටයුතු කිරීමේදී තමන්ට ලැබෙන තොරතුරු කිසිවක් අනාවරණය නොකිරීමේ දිවුරුමකින් බැඳී සිටිති.

## අසත්‍ය පැමිණිලි සිදු කිරීම වරදක් බව

අසත්‍ය කරුණක් බව දන දනම කොමිෂන් සභාව වෙත අසත්‍ය චෝදනාවක් සිදු කිරීම, පනත යටතේ වරදක් වන අතර එවැනි පුද්ගලයකුට වසර දහයක් දක්වා සිරදඬුවම් හෝ රුපියල් ලක්ෂ දෙකක දඩයක් හෝ එම දඬුවම් දෙකම නියම කළ හැකිය.

## කොමිෂන් සභාවට සිදු කරන වැරදි

අල්ලස දූෂණය හා වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ විමර්ශන සිදු කරන අවස්ථාවකදී එයට බාධාකාරී ලෙස සිදු කරන පහත ක්‍රියාවන් වැරදි ලෙස හඳුනාගෙන ඇත.

- සිතාසියකට අවනත නොවීම
- කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීම පැහැර හැරීම
- කොමිෂන් සභාව වෙත අසත්‍ය පැමිණිලි කිරීම
- කොමිෂන් සභාව වෙත දිවුරුම්පිට අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම
- කොමිෂන් සභාවේ කටයුතුවලට ප්‍රතිරෝදය පෑම
- කොමිෂන් සභාවේ කටයුතුවලට අයතු ලෙස මැදිහත් වීම
- අධිකරණයක සාක්ෂි දීම හෝ නොදීම සඳහා යම් අයෙකු පෙළඹවීම

## 13-අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වැරදි

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වැරදි පනත් 2ක් ඔස්සේ දක්වා ඇත. එනම්,

1. 1954 අංක 11 දරන අල්ලස් පනත.
2. 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ වගකීම් පනත.

### 1. අල්ලස් පනත යටත් වැරදි

අල්ලස් පනත යටතේ වැරදි 3ක් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශන කිරීම හා නඩු පැවරීම සිදු කරනු ලබයි. එනම්,

- අල්ලස
- අයථා වත්කම් ඉපයීම
- දූෂණය

#### 1. 1. අල්ලස

අල්ලස් පනතේ 90 වන වගන්තියට අනුව අල්ලස යනුවෙන් හඳුන්වන්නේ පනතේ II වන කොටසේ යම් විධානයක් උල්ලංඝනය කරමින් යම් තුටු පඬුරක් පිරිනැමීම, අයැදීම හෝ භාර ගැනීම නැතහොත් එබඳු යම් විධානයක් උල්ලංඝනය කරමින් කරනු ලබන වෙන යම් ක්‍රියාවකි.

මෙම කොටස යටතේ වැරදි රාජ්‍ය නිලධාරීන්ගේ ස්වභාවය අනුව විස්තර කර තිබේ.

- අධිකරණ නිලධරයකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට, තම තත්ත්වය අනුව යම් ක්‍රියාවක් කිරීම හෝ වැළැක්වීම සඳහා තුටු පඬුරක් පිරිනැමීම හෝ එවැනි නිලධරයකු ඉහත කාර්යයක් සඳහා තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැදීම වරදකි. (14වන වගන්තිය)

- යම් තැනැත්තෙකු වෙනුවෙන් රජයේ සේවකයකු හෝ අධිකරණ හෝ අර්ධ අධිකරණ කාර්යක් සිදු කරන රජයේ නිලධාරියකු සමග සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා යම් තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි. (15 වන වගන්තිය)

- වරදකරුවන්ට නඩු පැවරීම, ඔවුන් සොයාගැනීම හෝ ඔවුන්ට දඬුවම් දීම පිණිස යම් තත්ත්වයකින් සේවයේ යොදවා සිටින යම් පොලිස් නිලධාරියකු, සාම නිලධාරියකු විසින්, යථා පරිදි වූ යුක්තිය පසිඳලීමකට බාධා කිරිම හෝ යම් වරදක් කරවීමට හෝ කිරීමට පහසුකම් ලබාදීම හෝ යම් වරදක් කරන්නා සොයා ගනු ලැබීමෙන් හෝ දඬුවම් කරනු ලැබීමෙන් ආරක්‍ෂා කිරීම හෝ තම බලතල යම් තැනැත්තෙකුට හානිකරව නැතහොත් පීඩාදායකව අයුතු ලෙස යෙදීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් ඒ නිලධාරියාට හෝ සේවකයාට යම් තුටු පඬුරක් පිරිනැමීම හෝ එකී නිලධාරියා විසින් තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි. (16 වන වගන්තිය)

- යම් වැඩක් ඉටු කිරීම, යම් සේවයක් සැපයීම, යම් දෙයක් කිරීම, හෝ යම් භාණ්ඩයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සැපයීම පිණිස රජය සමග කර ගනු ලබන යම් ගිවිසුමක් ලබාදීම, අනුග්‍රහය කිරීමේදී හෝ එබඳු යම් ගිවිසුමක මුදලක් ගෙවීමේදී රජයේ සේවකයකුගේ සහාය ලබාගැනීම සඳහා තුටු පඬුරක් ලබාදීම හෝ එවැනි කාර්යයක් සඳහා රජයේ නිලධාරියකු විසින් තුටු පඩුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදක් වේ (17 වන වගන්තිය).

- රජයේ ගිවිසමක් හෝ ටෙන්ඩරයක් ලබාගැනීමේ අරමුණින් එවැනි ගිවිසුමක් ටෙන්ඩරයක් ඉදිරිපත් කළ තැනැත්තෙකුට එම ගිවිසුම හෝ ටෙන්ඩරය ඉල්ලා අස් කර ගැනීම සඳහා තුටු පඬුරක් පිරිනැමීම හෝ එවැනි ටෙන්ඩරයක් ඉල්ලා අස් කර ගැනීම සඳහා තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි (18 වන වගන්තිය).

- රජයේ සේවකයකු විසින් යම් නිල කාර්යයක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ එකී රජයේ සේවකයා විසින් හෝ වෙනයම් රජයේ සේවකයකු විසින් යම් නිල කාර්යයක් ඉක්මන් කිරීම, ප්‍රමාද කිරීම, එයට බාධා කිරීම නැතහොත් එය වැළැක්වීම සඳහා හෝ රජය සමග යම් කටයුත්තක් කිරීමේදී යම් තැනැත්තෙකුට ආධාර කිරීම,

- පක්‍ෂග්‍රාහී වීම, බාධා කිරීම හෝ ප්‍රමාද කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් ඒ රජයේ සේවකයාට පිරිනැමීම හෝ එවැනි කාර්යයක් සඳහා රජයේ නිලධාරියකු විසින් තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි (19 වන වගන්තිය).

- ආණ්ඩුවේ කාර්යාලයකින් ඉල්ලීම්, ගෙවීම්, පත්කිරීම්, සේවයේ යෙදවීම්, ප්‍රදාන, බදු දීම් සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ

කාර්යයන් ඉටු කරගැනීම සඳහා හෝ වැළැක්වීම සඳහා තුටු පඬුරක් පිරිනැමීම හෝ එවැනි කාර්යයක් සඳහා තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි (20 වන වගන්තිය).

- ආණ්ඩුව සමග යම් ගනුදෙනුවක් පවතින පුද්ගයකු විසින් එම කාර්යාලයේ සේවකයකුට තුටු පඬුරක් පිරිනැමීම හෝ එවැනි ආයතනයක සේවකයකු විසින් එවැනි ගනුදෙනුවක් පවතින පුද්ගලයකුගෙන් තුටු පඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි (21 වන වගන්තිය).

- තමන්ට පක්ෂපාතී ලෙස ඡන්දය ලබාගැනීම සඳහා, විපක්ෂව ඡන්දය දීම වැළැක්වීම සඳහා, යම් ගිවිසුමක් ප්‍රදානය කිරීම සඳහා, යම් නිලකාර්යයක් ඉටු කිරීම වැළැක්වීම සඳහා, ඉක්මන් කිරීම සඳහා හෝ බාධා කිරීම සඳහා ආධාර කිරීමට පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකු හෝ එබඳු ආයතනයක නිලධාරියකු හෝ සේවකයකුට තුටු පඬුරක් පිරිනැමීම හෝ එවැනි ආයතනයක එවැනි අයකු විසින් ඉහත කී කාර්යයන්ට ආධාර කිරීම සඳහා තුටුපඬුරක් ලබාගැනීම හෝ අයැද සිටීම වරදකි (22 වගන්තිය).

- පළාත් පාලන ආයතනයක හෝ උපලේඛගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකුගේ ඡන්දය කෙරෙහි බලපෑම් කිරීම පිණිස තර්ජනය කිරීම හෝ වංචා කිරීම වරදකි (23 වගන්තිය).

### අල්ලස් වරද

ඉහත විස්තර කර ඇති අවස්ථාවකදී අල්ලස් ගැනීම අල්ලස් දීම මෙන්ම අල්ලස් ඉල්ලීම (අයැදීම) හා අල්ලස් දීමට යෝජනා කිරීමද වරදකි. එසේම ඉහත වැරදි සඳහා තැත් කිරීමද වරදකි. එසේම එම වැරදි සඳහා අනුබල දීමද වරදකි. එසේම යම් කාර්යයක් ඉටු කර දීමේ පොරොන්දුව මත අල්ලසක් ලබාගත් නිලධාරියකු එම පොරොන්දු වූ කාර්යය ඉටු කර නොතිබුණද තුටුපඬුර ලබාගෙන තිබේ නම් අල්ලස් ලබාගැනීමේ වරදට වරදකරු වේ.

### අතරමැදියකු මගින් අල්ලස් ලබාගැනීම

අතරමැදියෙකුගේ දැනුම හෝ එකගතාව ඇතිව එකී තැනැත්තා හෝ වෙනයම් තැනැත්තෙකු වෙනුවෙන් කෙළින්ම හෝ අන් අයුරකින් ඕනෑම අල්ලස් වරදක් කළහොත් එකී වරද මුල් තැනැත්තා කරන ලද කරන ලද වරදක් ලෙස නීතිය සලකයි (89 වන වගන්තිය).

### අල්ලස් වරදකට දඬුවම්

මෙම වැරදි වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකි වැරදි වන අතර නඩු පැවරීම කොළඹ මහාධිකරණයේදී සිදු වේ. නඩු විභාගයෙන් පසුව වරදකරු වුවහොත් වසර 7ක් දක්වා සිර දඬුවම් හෝ රුපියල් පන්දහසක් දක්වා දඩ හෝ එම දඬුවම් දෙකම හෝ නියම කළ හැකිය. එයට අමතරව ලබාගත් තුටු පඬුරේ වටිනාකම දඩයක් ලෙස ගෙවන ලෙස අධිකරණයට නියෝග කළ හැකිය. එසේම මෙම වරදකට වරදකරු වූ පුද්ගලයකු මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම හෝ අපේක්ෂකත්වය ලැබීම සඳහා වසර 7ක් දක්වා නුසුදුස්සෙකු වෙයි. ඔහු රාජ්‍ය සේවයට නැවත ඇතුළු වීමටද නුසුදුස්සකු වෙයි.

### තුටු පඬුර

අල්ලස යන වරද සංයුක්ත වීමේදී ලබාගන්නේ හෝ ලබාදෙන්නේ තුටු පඬුරකි. තුටු පඬුර යන්න අල්ලස් පනතේ 90 වන වගන්තිය දක්වා ඇත්තේ මෙසේය:

(අ) මුදල් හෝ යම් තෑග්ගක්, ණයක්, ගාස්තුවක්, පාරිතෝෂිකයක්, කොමිස් මුදලක්, වටිනා ඇපයක්, නැතහොත් යම් වර්ගයකට අයත් චංචල හෝ නිශ්චල දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක්,

(ආ) යම් ධුරයක්, රක්ෂාවක් හෝ ගිවිසුමක්

(ඇ) යම් ණයක, ගැතිකමක හෝ වෙනත් කවර හෝ බැඳීමක සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් වූ යම් ගෙවීමක්, මිදීමක්, නිදහස් කිරීමක් හෝ ඇවර කිරීමක්

(ඈ) පමුණුවා ඇති හෝ පැමිණවිය හැකි යම් දණ්ඩනයකින් හෝ නොහැකියාවකින් නැතහොත් එවකටත් ආරම්භ කර තිබෙන විනයමය හෝ දණ්ඩනමය ස්වභාවයකින් යුතු නඩුවකින් හෝ නඩු කටයුත්තකින් ආරක්ෂාව ඇතුළු සහ යම් අයිතිවාසිකමක් හෝ යම් නිල බලයක් හෝ යුතුකමක් ක්‍රියාවේ යෙදවීම හෝ ක්‍රියාවෙහි යෙදවීමෙන් වැළකී සිටීම ඇතුළු, කවර වර්ගයක හෝ අයත් වෙන යම් සේවාවක්, උපකාරයක් හෝ වාසියක් සහ,

(ඉ) ඉහතින් වූ (අ),(ආ),(ඇ),(ඈ) සහ (ඈ) ඡේදයන්හි අර්ථානුකූල වූ යම් තුටු පඬුරක් පිරිනැමීම, දීමට හෝ බැඳීම හෝ පොරොන්දු වීම " අනුව අල්ලසේදී හුවමාරුවන "තුටු පඬුර" යන්නට භෞතික දෙයක් මෙන්ම භෞතික නොවන දෙයක්ද අදාළ වන බව පැහැදිය. මෑතකාලීන නඩු තීන්දු අනුව ලිංගික පහසුද තුටුපඬුරක් සේ සලකා ඇත.

### අල්ලස හා ත්‍යාගය

අල්ලස හා ත්‍යාගය අතර පැහැදිලි වෙනසක් ඇත. ත්‍යාගයක් පිරිනැමීමේදී හෝ භාර ගැනීමේදී එහි කිසිදු වරදකාරී අදහසක් නොමැත. නමුත් අල්ලසක් පිරිනැමීමේදී සැමවිටම වරදකාරී අදහසක් ඇත.

### 1. 2. අයථා වත්කම් ඉපැයීම

පනතේ 23(1)1 අ වගන්තියට අනුව යම් තැනැත්තකුගේ දැනගත් ආදායම් හෝ ලැබීම් මාර්ගයකින් හැර වෙනත් ආකාරයෙකින් මුදල් හෝ දේපළ රැස් කරන්නේ නම් එම තැනැත්තා විසින් ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් එකී මුදල් හෝ දේපළ අල්ලස් මාර්ගයෙන් රැස් කළ බවට සලකනු ලැබේ.

ඒ අනුව එවැනි අයථා වත්කම් ඉපයීම හා එවැනි වත්කම් දැරීම වරදක් වන අතර මෙවැනි වරදක් සිදු කළ පුද්ගලයකුට වසර 7ක් දක්වා සිර දඬුවමක් සහ රුපියල් පන්දහසක දඩයක් නියම කළ හැකිය. එසේම එම දේපළ රාජසන්තක කිරීමේ නියෝග යක් නිකුත් කළ හැකිය.

### 1. 3. දූෂණය

1954 අංක 11 දරන අල්ලස් පනතට එක් කරන ලද 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් ශ්‍රී ලාංකික නීතියට දූෂණය නැමති වරද හඳුන්වා දී ඇත. ඒ අනුව එකී දූෂණය යනු "ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තෙකු වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තෙකුට අයුතු ලෙස පාඩු සිදු විය හැකි බව නැතහොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දක්වෙන යම් ක්‍රියාවක්,

එනම් :

(අ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොළඹවන;

(ආ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන;

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයන් ගැනීමෙහිලා සහභාගි වන;

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන යම් රජයේ සේවකයකු, දූෂණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වරදකරු විය යුතු අතර...."

දූෂණය නැමති වරද සිදු කරනු ලබන පුද්ගලයකු මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ මහාධිකරණයේ නඩු විභාගයකින් පසුව වරදකරු වුවහොත් වසර 10ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එම දඬුවම් දෙකටම යටත් වේ.

## රාජ්‍ය සේවකයා

අල්ලස් පනත යටත් අල්ලස් ගැනීම සම්බන්ධයෙන් හා දූෂණය සම්බන්ධයෙන් වරද පැවරෙන්නේ රාජ්‍ය සේවකයන්ටය. අල්ලස් පනතේ 90 වන වගන්තියේ රාජ්‍ය සේවකයා යන්න මෙසේ අර්ථ නිරූපණය කර ඇත.

"රජයේ සේවකයා යන්නට අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයකු, කථානාකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයකු, පළාතක ආණ්ඩුකාරවරයකු පළාතක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, රජයේ සෑම නිලධරයකු, සේවකයකු හෝ සේවා නියුක්තිකයකු හෝ පාරිශ්‍රමිකයක් ලැබුවාවූද නොලැබුවා වූද පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ආණ්ඩුව විසින් දරනු ලබන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක යම් සභාපතිවරයකු, අධ්‍යක්ෂවරයකු, අධිපතිවරයකු, සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියක්තිකයකු, පළාතක රාජ්‍ය සේවයේ සාමාජිකයකු, ජූරි සභිකයකු, සෑම බලයලත් මිනින්දෝරුවරයකු සහ යම් අධිකරණයක් විසින් හෝ වෙනත් යම් රජයේ නිසි බලධරයකු විසින් යම් කටයුත්තක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වාර්තා කිරීම පිණිස යොමු කර ඇති සෑම බේරුම්කරුවකු හෝ වෙනත් තැනැත්තකුද ඇතුළත් වේ.

එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හැර ඇති හා ඒ ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම යම් තැනැත්තකු වෙත පැවරී ඇති අවස්ථාවක, ඒ ආයතනය විසුරුවා හැරීමට ඉහතින් එම සේවයෙහි නියුක්තව සිටියා වූ සහ එය විසුරුවා හැරීමෙන් පසුව තවදුරටත් සේවයෙහි නියුක්තව සිටින්නා වූ ඒ පළාත් පාලන ආයතනයේ සෑම සේවා නියක්තිකයකුම මේ පනතේ කාර්යය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතුය."

මේ අනුව ඉහත සඳහන් පුද්ගලයන් හා අල්ලස් පනතේ උපලේඛයේ ඇතුළත් ආයතනවල සේවකයන් අල්ලස් පනත යටතේ රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබේ. මෙයට අමතරව පනත් මගින් රාජ්‍ය ආයතන පිහිටුවන අවස්ථාවලදී එම පනත මගින්ම එම ආයතනයේ සේවකයින් අල්ලස් පනතේ අර්ථානුකූලව රජයේ සේවකයන් වන බවට ප්‍රතිපාදන සලසා ඇත. උදාහරණයක් ලෙස 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 27වන වගන්තිය දක්වන්නේ "කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතුය" යනුවෙනි.

## 2. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි

### 2. 1. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ වගකීම

1975 අංක 1 දරණ මෙම පනත මගින් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත තමන්ට ඇති වත්කම් හා බැරකම් රජයට ප්‍රකාශ කිරීම වගකීම ඇති තැනැත්තන් පිළිබඳව දක්වා ඇත. ඒ අනුව රාජ්‍ය ආයතනවල නිලධාරීන් මෙන්ම මහජන නියෝජිතයින්ද අදාළ තනතුරට පත් වී මාස 3ක් ඇතුළත.

1. තමාගේ සියලු වත්කම් හා බැරකම්
2. තම විවාහක පාර්ශ්වයේ සියලු වත්කම් හා බැරකම්
3. දරුවන්ගේ වත්කම් හා බැරකම් (අවිවාහක)
   නියමිත ආකෘතියෙන් යුතුව ඉදිරිපත් කළ යුතුව ඇත.

එය පළමු වත්කම් හා බැරකම් ප්‍රකාශය සිදු කිරීමෙන් පසුව අදාළ තනතුර හෝ ධුරය දරනතාක් දුරට සෑම වසරකටම මාර්තු 31 වන දිනට අදාළ වත්කම් හා බැරකම් පිළිබඳව ජූනි 31 දිනට පෙර වත්කම් බැරකම් ප්‍රකාශයක් සිදු කළ යුතුය. (1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත අනුව) එක් පුද්ගලයකුගේ මුල් වත්කම් හා බැරකම් ප්‍රකාශය ඊළඟ වත්කම් බැරකම් ප්‍රකාශය අතර ඇති වෙනස පැහැදිලි කිරීමට ඔහුට වගකීමක් ඇත.

### 2. 2. වත්කම් හා බැරකම් ප්‍රකාශ පිළිබඳ වැරදි

- වත්කම් හා බැරකම් ප්‍රකාශයක් කිරීම යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හැරීම,
- වත්කම් හා බැරකම් ප්‍රකාශයක අසත්‍ය කරුණු සඳහන් කිරීම
- වත්කම් හා බැරකම් ප්‍රකාශයකට අදාළව අතිරේක තොරතුරු සපයන ලෙස අල්ලස් කොමිෂන් සභාව විසින් නියම කළ අවස්ථාවකදී යුක්තිසහත හේතුවක් නොමැතිව එම නියෝගය පැහැර හැරීම
- පනත යටතේ පනවන ලද නියෝගයක් පැහැර හැරීම වරදක් වන අතර මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පවත්වන නඩු විභාගයකින් වරදකරු වූ විට රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගත කිරීමකට හෝ දඩය හා බන්ධානාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් වන්නේය.

මේ අනුව අල්ලස් හා දූෂණ ක්‍රියාවලින් ධනය උපයාගෙන ඇත්නම් මේ පනතේ ප්‍රතිපාදන අනුව ඔහු වරදකරුවකු බවට පත් වේ.

# පස්වන පරිච්ඡේදය

## දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම්

## 14-ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම

**ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමට අදාළ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019 - 2023 ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් වෙත පැවරී ඇති වගකීම හඳුනා ගැනීම**

### 01. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට පදනම් වූ පසුබිම

a. ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර සාධක ගණනාවක් පදනම් විය.

b. අල්ලස හා දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් දේශීය වශයෙන් විවිධ නීතිරීති සම්මත කර ගෙන ඇත. කෙසේ නමුත් අල්ලස හා දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීම හා අල්ලස දූෂණය වැළැක්වීම අරමුණු කොට ගත් ප්‍රතිපත්ති ඇතුළත් ජාතික සැලැස්මක් අප සතුව නැත. අල්ලස හා දූෂණය තුරන් කිරීමට නම් රාජ්‍ය අංශයේ සියලු ආයතන සහ අනෙකුත් ආයතන සම්බන්ධයෙන් පොදුවේ ක්‍රියාත්මක වන එවැනි ජාතික සැලැස්මක් තිබීම අත්‍යවශ්‍ය වේ.

c. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියට 2004 මාර්තු මස 15 වෙනි දින අත්සන් තබා 2004 මාර්තු 31 වෙනි දින සහතික කොට ඇත. ඒ අනුව දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික පසුබිමක් හා ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීමට එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි ප්‍රඥප්තියේ 05 ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ජනරජය බැඳී සිටී.

d. එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක වීම පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් සිදු කරන ලද දෙවන සමාලෝචන සැසියේදී ශ්‍රී ලංකාව

තුළ දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම විශේෂ අවධානයට ලක් කොට ඇත.

e. එසේම විවෘත රාජ්‍ය පාලන හවුල්කාරිත්වය (Open Government Partnership) යටතේ සකස් කරන ලද ජාතික සැලැස්මෙහිද ශ්‍රී ලංකාව තුළ දූෂණයට එරෙහිව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු කොට ඇත.

f. GSP+ සහනය ලංකාවට ලබා දීමේදී යුරෝපා සංගමය (European Commission) විසින් ශ්‍රී ලංකාව අල්ලස දූෂණයට එරෙහිව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගන්නේද යන්න සලකා බලන ලද අතර එහි දී විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට අනුගත වන්නේද යන්න සලකා බලන ලදි. තවද ඔවුන් විසින් අවධාරණය කරන ලද කාරණයක් වූයේ අල්ලස දූෂණය තුරන් කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු බවයි.

g. අන්තර්ජාතික මූල්‍ය අරමුදලද (IMF) සිය ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉහත අවශ්‍යතා අවධාරණය කර ඇත.

h. තිරසාර ඉලක්කවල 16 (5) වන ඉලක්කය වන්නේ වර්ෂ 2030 වන විට අල්ලස හා දූෂණය තුරන් කොට තිරසාර ඉලක්කයන් සපුරා ගන්නා බවයි. ඒ සඳහා අප සතුව ජාතික සැලැස්මක් තිබිය යුතු වේ.

### 02. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය

a. ඉහත අවශ්‍යතා හඳුනා ගනිමින්, 2017.10.11 දිනැතිව 731/2325/17 අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

b. තවද මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම, අදාළ නියෝජිත ආයතනවල උපදෙස් ලබා ගනිමින් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන මාර්ගෝපදේශ යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සම්පාදනය කළ යුතු බව අමාත්‍ය මණ්ඩලය වැඩිදුරටත් තීරණය කර තිබුණි.

### 03. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

a. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ මාර්ගෝපදේශ යටතේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය ඇතිව දිවයින පුරා අදහස් යෝජනා ලබා ගැනීමේ වැඩසටහන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දියත් කරන ලදි.

b. එහිදී විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි එනම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, අනෙකුත් මහජන නියෝජිතයන්, රාජ්‍ය අංශය, ආගමික නායකයන්, පුද්ගලික අංශය, කලාකරුවන්, සිවිල් සමාජය, මාධ්‍ය, වෘත්තිකයන්, විදේශ නියෝජිතයන් ඇතුළු කණ්ඩායම්වලින් අදහස් හා යෝජනා ලබා ගන්නා ලදි. විශේෂයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාගේ අදහස් ලබා ගැනීම සඳහා සැසිවාර 04ක් සංවිධානය කරන ලදි. මෙලෙස දිවයින පුරා පවත්වන ලද වැඩසටහන් ලක්ෂ 15ක් පමණ වන රාජ්‍ය නිලධාරීන්ගෙන් යුතු රාජ්‍ය සේවය තුළ සිදු කරන ලද සංගායනාවක් බඳු විය.

c. රට පුරා යමින් ලබා ගත් අදහස් ඒකරාශී කරමින් සුපිළිපන් දේශයක් ගොඩනැගීමේ අරමුණ පෙරදැරිව කෙටුම්පත් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම ලංකාවේ සියලු පාර්ශ්වයන්ගේ අදහස් පිළිඹිබු කරන්නකි.

d. මෙසේ සියලු අදහස් ඒකරාශී කර ගැනීමේ ජාතික සැලැස්මේ අවසාන කෙටුම්පත එම රාජ්‍ය හා අනෙකුත් ආයතනවල ජ්‍යෝෂ්ඨතම නිලධාරීන්ගෙන් සැඳුම්ලත් ක්‍රියාකාරී කමිටුවක් සහ විධායක කමිටුවක් මගින් පරීක්ෂාවට භාජනය කරන ලදි.

### 04. සුපිළිපන් දේශයක් ගොඩනැගීමේ අරමුණ පෙරදැරිව කෙටුම්පත් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්මට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබීම

දිවයින පුරා ගොස් ලබා ගන්නා ලද අදහස් ඇතුළත් කරමින් සකස් කරන ලද සැලැස්ම 2019 පෙබරවාරි මස 05 වන දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදි. එම ක්‍රියාකාරී සැලැස්ම ඉදිරි වසර පහ තුළ එනම්, 2019 - 2023 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 05. ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනාගෙන ඇති අල්ලස දූෂණය වැළැක්වීමේ ප්‍රධාන උපාය මාර්ග

a. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම අප රටින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ප්‍රධාන උපාය මාර්ග 04 ක් හඳුනාගෙන ඇත. එම උපායමාර්ග 04 නම්,

- නිවාරණය
- යහපත් ආකල්ප වර්ධනය කිරීම
- විමර්ශනය සහ ආයතන ශක්තිමත් කිරීම
- නීති සහ ප්‍රතිපත්ති හඳුන්වා දීම

b. අල්ලස දූෂණය තුරන් කිරීමෙහිලා ඉතාමත්ම තීරණාත්මක සාධකයක් වන කරුණු සම්බන්ධයෙන්ද සකස් කරන ලද ග්‍රන්ථ 04ක් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමඟ නිකුත් කරන ලදි. මෙම ග්‍රන්ථ 04 නම්,

I. ත්‍යාග රීති අඩංගු යෝජනා කෙටුම්පත
II. බැඳියාවන් අතර ගැටුමට අදාළ රීති අඩංගු කොට සාදන ලද යෝජනා කෙටුම්පත
III. රාජ්‍ය නිලධාරීන් සඳහා සුපිළිපන් බවේ අත්පොත
IV. අල්ලස් වත්කම්, බැරකම්, කොමිෂන් සභා, මැතිවරණ ප්‍රචාරණ සහ හඬ නඟන්නන්ට අදාළ නීති කෙටුම්පත් යෝජනා

c. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ මෙම ග්‍රන්ථ 4 ද්‍රවිඩ හා ඉංග්‍රීසි භාෂාවෙන්ද පරිවර්තන කටයුතු කර ඇත. ඒ අනුව ග්‍රන්ථ 15ක් එළිදක්වන ලදි.

d. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සහ ඒ සමඟ නිකුත් කරන ලද අත්පොත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.ciaboc.gov.lk) පළ කර ඇත.

### 06. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම


a. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සාමූහික වගකීම

a. අල්ලස දූෂණය තුරන් කිරීමේ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම මෙරටින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. ඒ සඳහා සියලුම පාර්ශ්වයන් සහ රජයේ සියලුම ආයතන දැඩි කැප වීමකින් යුතුව කටයුතු කළ යුතුය.


a. අල්ලස දූෂණය තුරන් කිරීම සමස්ත දේශයේම සාමූහික උත්සාහයක ප්‍රතිඵලයක් මිස එය හුදෙක් එක් ආයතනයක් සතු කාර්ය භාරය පමණක් නොවේ. ඉදිරි වසර 5 ක කාලය තුළ අපගේ ඉලක්කය විය යුත්තේ මේ රටේ අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා සාමූහික හැඟීමෙන් යුතුව එකිනෙකාට පැවරී ඇති වගකීම හා කාර්ය භාරය ඉටු කිරීමයි.

b. සමස්තයක් ලෙස මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විශේෂඥ කමිටුවකට පවරා ඇති අතර එය ජාතික සුපිළිපන් කවුන්සිලය ලෙස නම් කර ඇත.

## ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළ දළ සැලැස්ම



## අල්ලස් හා දූෂණ තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම හා දූෂණ වැළැක්වීමේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීමේ දළ සටහන




ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය ආයතන තුළ ක්‍රියාවට නැංවීම සහ ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් වෙත පැවරී ඇති වගකීම

I. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන, මණ්ඩල, සංස්ථා ඇතුළු සියලු ආයතන තුළ ක්‍රියාත්මක කළ යුතු බවට ජනාධිපති ලේකම්තුමා විසින් නිකුත් කරන ලද ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/ACD/01/2019 දරන හා 2019.07.04 දිනැති චක්‍රලේඛය මගින් දන්වා ඇත.

II මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන වශයෙන්ම පළමුවන උපායමාර්ගය වන නිවාරණ ක්‍රමවේද සහ දෙවන උපාය මාර්ගය වන යහපත් ආකල්ප ප්‍රවර්ධනය කිරීම යන උපාය මාර්ග 02 යටතේ විශේෂයෙන්ම රාජ්‍ය ආයතන වෙත පැවරුණු වගකීමක් ඇත.

III පළමුවන උපාය මාර්ගය වන නිවාරණ ක්‍රමවේදය යටතේ රාජ්‍ය අංශය තුළ අල්ලස හා දූෂණය නිවාරණය කිරීම සඳහා නිවාරණ ක්‍රමවේද ගණනාවක් හඳුන්වා දී ඇත. ඒවා රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

IV විශේෂයෙන්ම පහත පරිදි එම අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක කළ යුතු අංගයන් පහත පරිදි දැක්විය හැක.

- රාජ්‍ය ආයතන තුළ සුපිළිපන් නිලධාරියෙකු පත් කිරීම
- ආයතන තුළ දූෂණ නිවාරණ කමිටුවක් පත් කිරීම
- ආයතනික දූෂණ නිවාරණ සැලැස්මක් සකස් කර ගැනීම
- පහසුකම් සපයන නිලධාරියෙකු පත් කිරීම
- පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම

යන ක්‍රියාකාරකම් රාජ්‍ය ආයතන තුළ අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක කළ යුතු අතර ඒ බව ඉහත චක්‍රලේඛයෙන්ද දක්වා ඇත. ඉහත ක්‍රියාකාරකම් පිළිබඳව වඩාත් පුළුල් අවබෝධයක් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමග නිකුත් කර ඇති සුපිළිපන් අත්පොත තුළ අන්තර්ගත බැවින් එය පරිශීලිනය කිරීමෙන් ලබා ගත හැකිය.

ඉහත ප්‍රධාන අයිතමයන්ට අමතරව පහත ක්‍රියාකාරකම්ද ඉටු කිරීමේ වගකීම රාජ්‍ය ආයතන ප්‍රධානීන් හා ඉහත ක්‍රියාකාරකම් යටතේ පත් කරන සුපිළිපන් නිලධාරියාට පැවරී ඇත.

- මහජන සේවා හැකිතාක් ඉ-රාජ්‍ය ක්‍රමයට සැපයීම
- රාජ්‍ය නිලධාරීන් සුපිළිපන් ප්‍රතිඥාවකට යටත් කිරීම
- බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
- තෑගි රීති පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
- ආයතන සංග්‍රහය ඇතුළු ආචාරධර්ම පද්ධති පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම
- රාජ්‍ය නිලධාරියා සුපිළිපන්භාවය වර්ධනය කිරීම සහ යහපත් ආකල්ප වර්ධනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම.

## C) ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ එහි ඇතුළත් නිවාරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම

i. අල්ලස දූෂණය තුරන් කිරීමේ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම මෙරටින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. ඒ සඳහා අප රටේ පහළොස් ලක්ෂයක් පමණ වන රජයේ නිලධාරීන් හා රජයේ සියලුම ආයතන දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ යුතුය. එසේ ක්‍රියාත්මක වීම සඳහා රජයේ නිලධාරීන් ඇතුළු සියලු රජයේ ආයතන මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳවත්, ඊට අදාළ චක්‍රලේඛ පිළිබඳවත්, නිවාරණ වැඩපිළිවෙළ පිළිබඳවත් දැනුවත්ව සිටීම ඉතාමත් අත්‍යවශ්‍ය වේ. එසේ නිලධාරීන් දැනුවත් කළ යුතු බව ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහිම ක්‍රියාකාරී අයිතමයක් ලෙස හඳුනාගෙන ඇත. එම දැනුවත් කිරීම ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන් හෝ අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන් හෝ වෙනත් ආයතනයක නිලධාරීන් කිහිප දෙනෙකුට තනිවම කළ නොහැකි කාර්යයකි.

ii. ඒ අනුව රජයේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණුකරුවන් සිටිය යුතුමය. ඒ අනුව සමස්ත රට පුරා පුහුණුකරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් පිරිසක් තෝරා ගැනීමටත්, ඉන් පසු එම තෝරා ගත් නිලධාරීන් පුහුණු කිරීමටත්, එම පුහුණුකරුවන් ලෙස කටයුතු කිරීමට පුහුණු කරන ලද නිලධාරීන්ට අනිකුත් රජයේ නිලධාරීන් පුහුණු කිරීමේ වගකීම පැවරීමටත් බලාපොරොත්තු වේ.

iii. මෙම වැඩසටහන් මාලාවේ පළමු අදියර පළාත් මට්ටමෙන් සිදු කිරීම සඳහා තෙදින පුහුණු වැඩසටහන් 09කින් හා රේඛීය අමාත්‍යාංශ හා ස්වාධීන කොමිෂන් සභා අරමුණු කර ගත් වැඩසටහනකින් සමන්විත වේ.

# 15. සුපිළිපන්නභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජිත ජාතික සුපිළිපන්න සැලැස්ම හා යෝජිත ක්‍රියාකාරකම්

## 1. මහජන නියෝජිතයන්ගේ සුපිළිපන්භාවය වැඩි දියුණු කිරීම

### A. සුපිළිපන් ගිවිසුම/ප්‍රතිඥාව (Integrity Pledge)

i. අග්‍රාමාත්‍යතුමා, අමාත්‍යවරුන් සහ ආණ්ඩුකාරවරුන් ගරු ජනාධිපතිතුමා සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

ii. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගරු කථානායකතුමා සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

iii. පළාත් සභා මන්ත්‍රීවරුන් ගරු ආණ්ඩුකාරතුමා සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

iv. පළාත් පාලන ආයතනවල ප්‍රධානින් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සමග සුපිළිපන්න ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

v. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු සිය පළාත් පාලන ආයතන ප්‍රධානියා සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

vi. අමාත්‍යවරුන් අදාළ ලේකම්වරුන් සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

vii. එම ලේකම්වරුන් දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

viii රාජ්‍ය සේවයේ අනිකුත් සියලු නිලධාරීන් සිය දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් සමග සුපිළිපන් ගිවිසුමකට සහ ප්‍රතිඥාවකට එළඹීම.

එම ගිවිසුම/ප්‍රතිඥාව තුළ අනිකුත් කරුණු අතර පහත සඳහන් දෑ අන්තර්ගත කිරීමට විශේෂයෙන් පියවර ගැනීම සුදුසු වේ.

- අපේක්ෂිත සාර්ථක ඵලදායිතා ඉලක්කයන් කවරේද යන්න
- සුපිළිපන්භාවයට අදාළ මූලික සිද්ධාන්ත
- බැඳියාවන් අතර ගැටුමට අදාළ ආචාරධර්ම
- තෑගි ගැනීමට එරෙහි වූ සිද්ධාන්ත
- තමාගේ සියලු වත්කම්, ආදායම් හා බැරකම්වලට අදාළ විස්තර හෙළිදරව් කිරීමට ඇති බැඳීම

**B. මහජන නියෝජිතයන් සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම**

මහජන නියෝජිතයන් සඳහා වූ ආචාරධර්ම පද්ධතියක් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සකස් කිරීම, යාවත්කාලින කිරීම හා ක්‍රියාත්මක කිරීම.

එහිදී පහත සඳහන් මහජන නියෝජිතයන් කෙරෙහි වෙන් වෙන්ව අවධානය යොමු කළ යුතුය.

i. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු
ii. පළාත් සභා මන්ත්‍රීවරු
iii. පළාත් පාලන ආයතනවල නියෝජිතයන්

## 2. රාජ්‍ය සේවය සඳහා වන සුපිළිපන් වැඩපිළිවෙළ

මෙහි පහත සඳහන් රාජ්‍ය අංශය සඳහා වන සුපිළිපන් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ/ගැසට් පත්‍රයක් මගින් සිදු කළ යුතුය.

**A. සුපිළිපන් නිලධාරියකු (Integrity Officer) සියලු රාජ්‍ය ආයතන සඳහා පත් කිරීම**

### පත් කිරීම

i. රාජ්‍ය ආයතනයේ මාණ්ඩලික  නිලධාරින් අතරින් තෝරාගත් අයෙකු සුපිළිපන්
ii. නිලධාරියකු ලෙස පත් කළ යුතුය.

iii. ආයතන ප්‍රධානියා විසින් තම ආයතනයට සුපිළිපන් නිලධාරියා පත් කර ගැනීමට වග බලා ගත යුතුය.

### කාර්යභාරය

i. සුපිළිපන් නිලධාරියා සිය රාජ්‍ය ආයතනයේ එදිනෙදා ක්‍රියාවලි අධීක්ෂණය කළ යුතු අතර යම් අල්ලසක් හෝ දූෂණයක් සිදු වීමට ඉඩ ඇති බව නිරීක්ෂණය කරන විට ඒ පිළිබඳව ආයතන ප්‍රධානියා දැනුවත් කළ යුතුය.

ii. සිය රාජ්‍ය ආයතනය තුළ ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් හා චක්‍රලේඛ පරීක්ෂාවට ලක් කිරීම හා එම ක්‍රමවේදයන් හා චක්‍රලේඛ අපැහැදිලි හා සංකීර්ණ ස්වභාවයෙන් යුක්ත වේ නම් ඒවා පැහැදිලි හා සරල ලෙස නැවත සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

iii. සිය රාජ්‍ය ආයතනය තුළ ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් හා චක්‍රලේඛ පිළිබඳව ආයතනයේ සියලු සේවකයන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

iv. අවශ්‍ය අවස්ථාවලදී මහජනතාවට මග පෙන්වීම හා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පහසුකම් සපයන්නෙකු (Facilitating Officer) ආයතන ප්‍රධානියාගේ මග පෙන්වීම මත ආයතනය තුළින් තෝරා පත් කිරීමට සුපිළිපන් නිලධාරියා වග බලා ගත යුතුය.

v. එම පහසුකම් සපයන්නා මගින් සිය ආයතනයෙන් සේවාවක් ලබා ගැනීමට පැමිණෙන ජනතාව වෙත ආයතනයේ එදිනෙදා ක්‍රියාවලිය හා ආයතනයෙන් ලබා දෙන සේවාවන් පිළිබඳ අවශ්‍ය අවස්ථාවලදී දැනුවත් කිරීම, උපදෙස් ලබා දීම හා මග පෙන්වීම කළ යුතුය.

vi. සිය රාජ්‍ය ආයතනයෙන් ලබා දෙන සේවාවන් පිළිබඳව පුරවැසි ප්‍රඥප්තීන් සකස් කිරීමට අදාළව මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

vii. එසේ සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තීන් ආයතනය තුළ පැහැදිලිව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

viii. පුරවැසි ප්‍රඥප්තීන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

ix. ආයතනය තුළ නිසි ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

x. දූෂණ වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් නියම කරනු ලබන තෑගි පිළිබඳ රීතිවලට සියලු සේවකයන් අනුගතවීමට අදාළ පියවර ගැනීම.

xi. දූෂණ වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් නියම කරනු ලබන බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රීති පිළිබඳව සියලු සේවකයන් අනුගතවීමට අදාළ පියවර ගැනීම.

xii. වත්කම් බැරකම් ප්‍රකාශ- වත්කම් බැරකම් නීතියට අදාළ ආයතනයේ සියලු සේවකයන් එයට අනුගත කිරීමට අදාළ පියවර ගැනීම.

### B. රාජ්‍ය ආයතන මට්ටමින් දූෂණ නිවාරණ කමිටු ඇති කිරීම (Corruption Prevention Committees) පිහිටුවීම

i. මෙම කමිටු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ මගින් නිරන්තර සුපරීක්ෂණය කළ යුතුය. අන් අමාත්‍යාංශවල ඒ සඳහා සුපරීක්ෂණ යාන්ත්‍රණ සකස් කළ යුතුය.

ii. ආයතනයේ සියලු අංශ නියෝජනය වන පරිදි මෙම කමිටුවට සාමාජිකයන් ආයතන ප්‍රධානීන් විසින් පත් කළ යුතුය.

**කාර්යභාරය**

i සිය ආයතනය තුළ සිදු වන හා සිදු විය හැකි අල්ලස් හා දූෂණ අවස්ථා අවම කිරීම.

ii සිය ආයතනය තුළ සිදු වන හා සිදු විය හැකි අල්ලස් හා දූෂණ අවස්ථා වැළැක්වීම.

iii සිය ආයතනය සඳහා අනන්‍ය වූ දූෂණ වැළැක්වීමේ සැලැස්මක් සකස් කිරීම.

iv කමිටුව විසින් තම ආයතනයේ දූෂණ විරෝධී සැලැස්ම ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

v දූෂණ වැළැක්වීම අරමුණු කොට ගනිමින් විවිධාකාරයෙන් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

vi අවශ්‍ය අවස්ථාවලදී සුපිළිපන් නිලධාරියාට අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය.

## C. දූෂණ විරෝධී සැලැස්මක් සකස් කිරීමට

සියලු රාජ්‍ය ආයතන සඳහා සිය ආයතනයට අනන්‍ය වූ දූෂණ විරෝධී සැලැස්මක් සකස් කිරීමට නියම කිරීම.

i අදාළ දූෂණ විරෝධී සැලැස්ම ආයතන මට්ටමින් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිවාරණ ඒකකයෙන් උපදෙස් ලබා දිය යුතුය.

ii එක් එක් අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල දූෂණ විරෝධී සැලැස්ම ක්‍රියාත්මක වීම පිළිබඳව අදාළ අමාත්‍යංශය නිරන්තර නිරීක්ෂණයට ලක් කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය සුපරීක්ෂණ යාන්ත්‍රණක් සකස් කළ යුතුය.

iii රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය/පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ මගින් සමස්ත අධීක්ෂණය සිදු කිරීමට වග බලා ගත යුතුය.

iv ආයතනය තුළ පිහිටුවා ඇති දූෂණ නිවාරණ කමිටුව විසින් තම ආයතනයේ දූෂණ විරෝධී සැලැස්ම ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

## D. පුරවැසි ප්‍රඥප්ති

රාජ්‍ය ආයතන විසින් ජනතාව වෙත සපයනු ලබන සේවා පිළිබඳව ජනතාව සතු නොදැනුවත්කම සහ අපැහැදිලිකම ඉහළ යන විට අක්‍රමිකතාවලට ඇති ඉඩකඩ වැඩි වේ. සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් තම ආයතනය තුළ අල්ලස හෝ දූෂණය සිදු වීමට වැඩියෙන්ම අවදානමක් තිබෙන ඒකක කවරක්ද යන්න සොයා බලා ඒ සඳහා හේතු පාදක වන දුර්වල චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමටත් මහජනතාවට කාර්යක්ෂමව හා ඉතාමත්ම පහසුවෙන් සේවය ලබා දීමටත් පියවර ගැනීමට කටයුතු කළ යුතුය. අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා;

- i සේවා සැපයීමේ දී මහජනතාව සමග ඍජුව සම්බන්ධ වන රාජ්‍ය ආයතන තම සේවාවන් ලබාදීමේ දී මහජනතාව අනුගමනය කළ යුතු පියවර, ඉදිරිපත් කළ යුතු ලේඛන, සුදුසුකම්, ඒ සඳහා ගත වන කාලය සහ එක් එක් පියවර සඳහා අය කරන ගාස්තු සරලව හා පැහැදිලිව සටහන් කොට ප්‍රදර්ශනය කිරීම හා මුද්‍රිතව ප්‍රසිද්ධියට පත් කිරීම.

- ii අදාළ කාල සීමාව ඉක්ම ගිය විටදී රාජ්‍ය නිලධාරියා අදාළ සේවාව ලබා දීමට නොහැකි නම් ඊට හේතු පැහැදිලි කර දින තුනක් ඇතුළත ලිඛිතව දැනුම් දීමට කටයුතු කිරීම.

- iii එවැනි තීරණයක් මගින් අගතියට පත් පාර්ශ්වයට අභියාචනා මණ්ඩලයකට/ බලධාරියෙකුට (ඒ සඳහා පත් කරන ලද) අභියාචනා කිරීමේ අයිතිය හිමි වීම.

- iv එම මණ්ඩලය විසින් එකී රාජ්‍ය නිලධාරියාගේ තීරණය විශ්ලේෂණයට ලක්කොට එය වැරදි සහගත වේ නම් හෝ ස්වභාවික යුක්ති මූලධර්මවලට අනුකූල නොවේ නම් අදාළ ආයතනයේ ප්‍රධානියාට වාර්තා කොට සුදුසු පියවර ගැනීම.

## E. රජයේ සේවකයන් සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම

රාජ්‍ය සේවකයන් සඳහා වූ අචාරධර්ම පද්ධතියක් සකස් කිරීම හා ආයතන සංග්‍රහය ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව යාවත්කාලින කිරීම. එහිදී පහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම,

- i සුපිළිපන්භාවයට අදාළ මූලික සිද්ධාන්ත
- ii බැඳියාවන් අතර ගැටුමට අදාළ සාරධර්ම
- iii තෑගි ගැනීමට එරෙහි වූ සිද්ධාන්ත
- iv තමාගේ සියලු වත්කම්, ආදායම් හා බැරකම්වලට අදාළ විස්තර හෙළිදරව් කිරීමට ඇති බැඳීම

**F. සුපිළිපන් ප්‍රතිඥාව ඇතුළත් ලාංඡනයක් හඳුන්වා දීම.**

i තමා අල්ලස හා දූෂණයට එරෙහි බවත් අන් අය අල්ලස හා දූෂණය සිදු කරනු තමා ඉවසන්නේ නැති බවත් දැක්වෙන ප්‍රතිඥාවක් ඇතුළත් ලාංඡනයක් මේ සඳහා භාවිත කළ යුතුය.

ii එය සියලු මහජන නියෝජිතයින් හා රාජ්‍ය සේවකයන්ට පැලඳ සිටීමට අදාළ විධාන නිකුත් කිරීම.

**G. අල්ලසින් දූෂණයෙන් තොර කලාප ලෙස තෝරා ගත් ආයතන නම් කිරීම.**

i මෙහිදී මහජනතාව නිරන්තරයෙන් ගැවසෙන ස්ථාන ඉලක්ක කර ගනිමින් "අල්ලසින් හා දූෂණයෙන් තොර කලාපයකි" යනුවෙන් වැකි දැක්වෙන ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කළ යුතුය.

ii තවද මෙම ප්‍රදර්ශන පුවරු ලංකාව තුළට ඇතුලු වන සියලු තොටුපළවල ප්‍රදර්ශනය කළ යුතුය. (උදා- ගුවන් තොටුපළ)

iii සියලු රාජ්‍ය නිලධාරීන් විසින් සිය නිවෙස් ඉදිරියේද මෙය ප්‍රදර්ශනය කළ යුතුය.

**H. අල්ලස් හා දූෂණ වැරදි වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම.**

රාජ්‍ය ආයතන තුළ අල්ලස හා ෂණයට අදාළව සිදු වන වැරදි ඉහළ නිලධාරින්ට හෝ සුදුසු ආයතනවලට වාර්තා කිරීමට අදාළ ක්‍රමවේදයක් සකස් කිරීම.

i සුපිළිපන් ගිවිසුමක් ඇති කිරිම.
සුපිළිපන් ගිවිසුම/ප්‍රතිඥාවකට සියලු රාජ්‍ය සේවකයන් බැඳී සිටීමට ක්‍රියා කිරීම.

### 3. විනිසුරුවරුන්ගේ හා අධිකරණ නිලධාරීන්ගේ සුපිළිපන්භාවය වැඩිදියුණු කිරීම.

i. ආචාරධර්ම හා රීති හඳුන්වා දීම.

ii. බැඳියාවන් අතර ගැටුම පිළිබඳ රීති හඳුන්වා දීම.

iii. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

iv. අන්තර්ජාතික සම්මුතීන්, අන්තර්ජාතික ප්‍රකාශන, සාධනීය හා පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට දිරිමත් කිරීම.

### 4. සමස්ත සමාජයේ, තරුණයන්ගේ හා ළමුන්ගේ සුපිළිපන්භාවය වැඩිදියුණු කිරීම.

අල්ලසට හා දූෂණයට එරෙහි වඩාත්ම කාර්යක්ෂම බලවේගය වන්නේ සමාජයයි. අනාගතයේදී අල්ලස හෝ දූෂණය සහමුලින් පිටුදකින සමාජයක් ගොඩනැගීමේදී අවංක බව හා සුපිළිපන්භාවය පිළිබඳව සාරධර්ම ළමයින් සහ තරුණයින් තුළ වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. විවිධ වයස් කණ්ඩායම් වලට අයත් ළමයින් සහ තරුණයින් අරමුණු කර ගත් වැඩසටහන් දියත් කිරීම කළ යුතුය. පාසල් / සරසවි අධ්‍යාපනය තුළින් සුපිළිපන්භාවය ප්‍රචලිත කිරීමට පියවර ගත යුතුය.

### 5. පෞද්ගලික අංශයේ සුපිළිපන්භාවය වැඩිදියුණු කිරීම.

i ආචාරධර්ම හා රීති හඳුන්වා දීම.

ii දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

iii පෞද්ගලික අංශයේ දූෂණයට එරෙහි වන පරිදි නීති සම්පාදනයට රජය බැඳී සිටීම.

### 6. දැනුවත් කිරීමේ හා අදහස් යෝජනා ලබා ගැනීමේ වැඩමුළු

වර්තමාන නීතිය, යහපත් පුරුදු හා ක්‍රමවේද සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු නිරන්තරයෙන් පැවැත්වීම හා කාලයෙන් කාලයට අලුත් වන හා සාධනීය ක්‍රමවේදයන්ට අනුව අපගේ නීතියේ හා ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීමට අදාළව සියලු අංශවල සහභාගිත්වයෙන් යුතු අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කළ යුතුය.

i පාර්ලිමේන්තු හා මන්ත්‍රීන් හා ආණ්ඩුකාරවරුන් සඳහා

ii පළාත් පාලන ආයතනවල සාමාජිකයන් සඳහා

iii රාජ්‍ය නිලධාරීන් සඳහා

iv විනිසුරුවරු හා අධිකරණ නිලධාරීන් සඳහා

v මහජනතාව සඳහා
vi පුද්ගලික අංශය සඳහා
vii තරුණයන් හා ළමුන් උදෙසා
viii පාසල් හා විශ්ව විද්‍යාල උදෙසා
ix මාධ්‍ය හා සිවිල් සමාජය උදෙසා

### 7. ප්‍රගතිය ඇගයීම පිළිබඳ විශේෂඥ කමිටුවක් පත් කිරීම

මෙම ජාතික සුපිළිපන් සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක වීම පිළිබඳව ප්‍රගතිය ඇගයීම හා ඒ හා සම්බන්ධ කටයුතු සිදු කිරීම සඳහා ජනාධිපතිතුමා විසින් විශේෂඥ කමිටුවක් අවශ්‍ය පරිදි පත් කිරීම.

## 16. ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම පිළිබඳ ජනාධිපති ලේකම් චක්‍රලේඛය

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : PS/ACD/01/2019

2019 ජූලි මස 07 වන දින

10 JUN 2019 1762

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,

<u>ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 ක්‍රියාත්මක කිරීම සහ ජාතික සුපිළිපන්න ඒකාබද්ධතා රාමුවක් සකස් කිරීම හා රාජ්‍ය සුපිළිපන්නභාවය ඉහළ නැංවීමේ අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවට නැංවීම</u>

**01.** ජාතික ක්‍රියාකාරී සැලැස්ම

1.1. "ශ්‍රී ලංකාව තුළ දූෂණය මැඩලීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්මත කිරීම මගින් යහපාලනය වැඩිදියුණු කිරීම, 2019-2023" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2019.01.22 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සන්දේශය, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/19/0323/101/015 යටතේ 2019 පෙබරවාරි 05 වන දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. එමගින් ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරි පස් වසරක කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට තීරණය වී ඇත.

**02.** ජාතික ක්‍රියාකාරී සැලැස්ම දියත් කිරීම

2.1. ඉහත පරිදි අනුමත වී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2019 මාර්තු මස 18 වන දින උත්සවාකාරයෙන් දියත් කරන ලද ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන, මණ්ඩල, සංස්ථා ඇතුළු සියලු ආයතන තුළ ක්‍රියාත්මක කළ යුතු බවට මෙයින් උපදෙස් දෙමි.

2.2. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය නිවාරණය සඳහා ප්‍රධාන උපායමාර්ග 04 ක් හඳුනාගෙන ඇත. ඒවා නම්, නිවාරණ කටයුතු, සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වය, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම සහ නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමයි. නිවාරණ කටයුතු යටතේ දක්වා ඇති ප්‍රධාන ක්‍රියාකාරී අයිතමයක් වන්නේ සුපිළිපන්න ක්‍රමෝපායන් ඇති කිරීම ය.

**03.** ජාතික සුපිළිපන්න සැලැස්ම

3.1. "ජාතික සුපිළිපන්න ඒකාබද්ධතා රාමුවක් සකස් කිරීම හා රාජ්‍ය සේවයේ සුපිළිපන්නභාවය ඉහළ නැංවීම" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019.02.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/19/0667/101/033 යටතේ 2019 මාර්තු 06 වන දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. එමගින් සුපිළිපන්නභාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

3.2. ඒ අනුව දූෂණය වැළැක්වීම සඳහා රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, සිවිල් සංවිධාන, ප්‍රජා මූල සංවිධාන ඒකරාශී කර ගනිමින් කටයුතු කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් ජාතික සුපිළිපන්න සැලැස්ම බලාත්මක කර ඇත. ඒ අනුව රාජ්‍ය ආයතන මගින් ද දූෂණය වැළැක්වීම සඳහා පියවර ගත යුතුය.

3.3. රාජ්‍ය ආයතන තුළ නිවාරණ කටයුතු සිදු කිරීම හා සුපිළිපන්න නිලධාරීන්ගේ කාර්ය භාරය අළලා සුපිළිපන්න අත්පොත නිකුත් කර ඇත.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

4. **ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරී අයිතමයන් කඩිනමින් ඉටු කරන ලෙස මෙයින් දන්වමි.**

i. සියලු ආයතනයන් තම ආයතනයට පැවරී ඇති ක්‍රියාකාරී අයිතමයන් ක්‍රියාවට නැංවීම
ii. ආයතන තුළ දූෂණ නිවාරණ කමිටු පිහිටුවීම
iii. ආයතන තුළ දූෂණ නිවාරණ නිලධාරීන් නම් කිරීම
iv. ආයතන තුළ පහසුකාරක නිලධාරියෙකු නම් කිරීම
v. ආයතන තුළ පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම

4.1. මේ පිළිබඳ වැඩිදුර විස්තර ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සහ ඒ සමඟ නිකුත් කරන ලද සුපිළිපන්න අත්පොතෙහි දක්වා ඇත. එම ලේඛන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් (www.ciaboc.gov.lk) බාගත කර ගත හැකි බව දන්වමි.

05. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමඟ නිකුත් කර ඇති හැගි රීති අත්පොත හා බැඳියාවන් අතර ගැටුම් රීති අත්පොත කෙරෙහි සියලු නිලධාරීන්ගේ අවධානය යොමු කර ඒ පිළිබඳව දැනුවත්භාවය වැඩි කරන ලෙස සියලු ආයතන ප්‍රධානීන්ට මෙයින් උපදෙස් දෙමි. එම රීති පොත් මගින් දක්වා ඇති කරුණු ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

06. තවද, ආයතන තුළ ඉහත ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කලින් කලට ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති බවත් ඒ අනුව, ආයතන ඇගයීමකට ලක් කරන බවත් දන්වා සිටිමි.

07. ඉහත සියලු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධව ආයතන ප්‍රධානියා මගින් ජනාධිපති ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති "ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්යාංශය" වෙත මෙදින සිට මාස තුනක් ඇතුළත යොමු කරන මෙන් මෙයින් උපදෙස් දෙමි.

උදය ආර්.සෙනෙවිරත්න

ජනාධිපති ලේකම්

පිටපත් :

01. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
03. විගණකාධිපති - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
05. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
06. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා
07. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස. සහ පියවර ගැනීම සඳහා

# හයවන පරිච්ඡේදය

## ඔබේ දැනුමට තවදුරටත්

### 17- නිතර අසනු ලබන ප්‍රශ්න

**අල්ලස යනු කුමක්ද ?**

අල්ලස යනු නිල රාජකාරී කටයුතු ඉටු කිරීමේදී රජයේ නිලධාරියෙකු වෙත ලබා දෙන හෝ රජයේ නිලධාරියෙකු ඉල්ලනු ලබන ඕනෑම ආකාරයක තුටු පඬුරකි.

**තුටු පඬුරක් යනු කුමක්ද ?**

චංචල හෝ නිශ්චල දේපළ, මානසික සන්තර්පනය, යම් ධුරයක්, රැකියාවක්, කොන්ත්‍රාත්තුවක්, ඕනෑම ආකාරයේ ගෙවීමක්, සේවාවක්, ලිංගික ප්‍රතිලාභයක් තුටු පඬුර යන්නට ඇතුළත් වේ.

**රජයේ නිලධාරියා යනු කවරෙක්ද ?**

වැටුපක් ලබමින් හෝ නොලබමින්, රජයේ තනතුරක් දරමින්, රජයේ කාර්යයන් ඉටුකරනු ලබන තැනැත්තකු මින් අදහස් වේ.

**අල්ලසක් ලබා ගැනීමට උත්සාහ දැරීම වරදක්ද ?**

ඔව්.

**අතරමැදියෙකු මාර්ගයෙන් සන්තොෂමක් ඉල්ලා සිටීම හෝ පිළිගැනීම වරදක්ද ?**

ඔව්, යම් තැනැත්තකු, තම දැනුවත්භාවයෙන් හෝ කැමැත්ත සහිතව, ඍජුව හෝ වක්‍රව වෙනත් අයෙකු තමා වෙනුවෙන් කටයුතු කරමින් තුටු පඬුරක් ඉල්ලා සිටීම හෝ ලබා ගැනීම වරදකි.

**දූෂණයක් යනු කුමක්ද?**

රජයේ නිලධාරියෙකුව සිටිමින් සිතාමතාම හෝ දැනුවත්භාවයෙන් යුතුව රජයට හෝ වෙනත් තැනැත්තකුට වැරදිසහගත හා නීත්‍යානුකූල නොවන අයුරින් පාඩු සිදු කිරීම හෝ තමන්ට හෝ වෙනත් තැනැත්තකුට වැරදිසහගත හෝ නීත්‍යානුකූල නොවන ප්‍රතිලාභයන් ලබා ගැනීම මින් අදහස් වේ.

## දඬුවම් මොනවාද?

රජයේ නිලධාරියෙකුව සිටිමින් සිතාමතාම හෝ දැනුවත්භාවයෙන් යුතුව රජයට හෝ වෙනත් තැනැත්තකුට වැරදිසහගත හා නීත්‍යානුකූල නොවන අයුරින් පාඩු සිදුකිරීම හෝ තමන්ට හෝ වෙනත් තැනැත්තකුට වැරදිසහගත හෝ නීත්‍යානුකූල නොවන ප්‍රතිලාභයන් ලබා ගැනීම මින් අදහස් වේ.

**අල්ලස සඳහා**

- වසර 7 කට නොවැඩි බරපතළ වැඩ සහිත සිර දඬුවම්
- රු. 5,000/-ට වැඩි නොවන දඩයක්
- තුටු පඬුරෙහි වටිනාකම

**වත්කම් සඳහා**

- ඉහත දඬුවමට අමතරව අල්ලස් මාර්ගයෙන් ලබා ගත් මුදලට අඩු නොවන දඩයක් හා එම මුදල මෙන් තුන් ගුණයකට වැඩි නොවන දඩ මුදලක්.
- අත්පත් කරගත් දේපළ රාජසන්තක කිරීම.

**දූෂණ සඳහා**

- වසර 10කට වැඩි නොවන බන්ධනාගාරගත කිරීමක් හෝ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩමුදලක් හෝ අදාළ දඬුවම් දෙකම

**වෙනත් විපාක තිබේද?**

- රාජ්‍ය සේවයෙන් පහ කිරීම
- රාජ්‍ය සේවයේ තනතුරකට නුසුදුසු වීම
- වසර 7කට පාර්ලිමේන්තු මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වීමට නුසුදුසු වීම
- වසර 5කට පළාත් පාලන මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ සභිකයෙකු ලෙස පත් වීමට නුසුදුසු වීම

## රාජ්‍ය නිලධාරීන් සිය වත්කම් හෙළිකිරීමට නීතියෙන් බැඳී සිටීද?

ඔව්. රජයේ නිශ්චිත සේවාවන්හි නිලධාරීන් සෑම වසරකම ජූනි 30වන දින වන විට එම වසරේ මාර්තු 31වන දිනට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

## 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් නීතියෙහි ප්‍රකාශිත වැරදි මොනවාද?

යම් පුද්ගලයෙකු,

- ප්‍රකාශ ඉදිරිපත් නොකරන්නේ නම්
- වැරදි තොරතුරු සපයන්නේ නම්
- සිතාමතා තොරතුරු මගහරින්නේ නම්

- අල්ලස් කොමිෂන් සභාව වෙත ඉල්ලා සිටින තොරතුරු සැපයීමට අපොහොසත් වන්නේ නම්,

මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වන නඩු විභාගයකින් වරදකරු කළ විට රු. 1,000/-කට නොවැඩි දඩ මුදලකට හෝ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඬුවම් දෙකටම හෝ යටත් කළ හැක.

උපුටා ගැනීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන්
https://sinhala.ciaboc.gov.lk/contact/faqs

# 18- පුහුණුකරුවන්ගේ පරිශීලනයට අදාළ සම්පත් ලැයිස්තුව

## නීතිරීති

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1954 අංක 11 දරන අල්ලස් පනත
3. 1994 අංක 19 දන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත
4. දණ්ඩ නීති සංග්‍රහය (15 වන අධිකාරය)
5. 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත
6. 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත
7. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
8. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත
9. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත
10. 2018 අංක 19 දරන ජාතික විගණන කොමිෂන් සභා පනත
11. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත
12. 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත
13. 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත (393 වන අධිකාරය )
14. 1978 අංක 7 විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නීතිය
15. ආයතන සංග්‍රහය
16. මූල්‍ය රෙගුලාසි
17. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

## චක්‍රලේඛන

1. ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ ජනාධිපති ලේකම් චක්‍රලේඛනය

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රකාශන-

1. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම
2. සුපිළිපන් අත්පොත
3. තෑගි රීති
4. බැඳියාවන් අතර ගැටුම
5. නෛතික සංශෝධන සඳහා වන යෝජිත ප්‍රතිපත්ති
6. අල්ලස හා දූෂණයෙන් තොර සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවකට

### වාර්තා

1. CIABOC Annual Report -2018
2. CORRUPTION PERCEPTIONS INDEX 2019
3. GLOBAL CORRUPTION BAROMETER 2019-SRI LANKA

### ජාත්‍යන්තර සම්මුති

1. UNITED NATIONS CONVENTION AGAINST CORRUPTION
2. Jakarta Statement on Principles for Anti-Corruption Agencies

### දේශීය ලේඛන

1. විවෘත රාජ්‍ය හවුල්කාරීත්වය ශ්‍රී ලංකාවේ දෙවන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2021

2. ජාතික සුපිළිපන් සැලැස්ම

### කෙටි වීඩියෝ දර්ශන

1. අල්ලස ඔබට ඔබම කරගන්නා අපහාසයකි
2. ගෙදර යමු සුපිළිපන් හදවතින් (ගීතය)
3. හා හා හොඳයි හොඳයි (ගීතය)
4. අල්ලසට යට නොවූ රාජ්‍ය සේවකයා
5. අල්ලස් නොදෙන ඔබ

6. අල්ලස් ගන්නා අත ගිනිගනියි
7. ජරාව පණුවන්ගේ තෝතැන්නයි
8. අල්ලස් ගන්නෝ පරම්පරා ගණනකට නිගාදෙන මිලේච්ඡයෝය
9. දූෂණයේ දම්වැල බිඳ දමමු
10. සුපිළිපන් දේශයක් කරා

## අතිරේක තොරතුරු සඳහා සබඳතා

1. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව-
   https://www.ciaboc.gov.lk/
2. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය -
   https://www.unodc.org/
3. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පනත් හා ගැසට්පත්‍ර සඳහා)-
   http://www.documents.gov.lk/
4. පනත් /නඩු තීන්දු /ජාත්‍යන්තර සම්මුති සඳහා-
   https://www.lawnet.gov.lk/
5. Transparency International - www.transparency.org
6. Government Accountability Project-
   www.whistleblower.org
7. Hong Kong Independent Commission against Corruption -
   https://www.icac.org.hk/en
8. Anti-Corruption resource center - www.u4.no

'. . . . . . . මෙහි නොමිලයේ කර්මයක් නොකොට යුතුයැයි ද දැන්වූයේය. එක එක දොර දොළොස් ලක්ෂය බැගින් කහවණුද ඉතා බොහෝ වූ වස්ත්‍රයන්ද තැබ්බවූයේය. නානාප්‍රකාර ආභරණද පාන වර්ගද සහිත වූ ඛාද්‍ය භෝජ්‍යයන්ද සුවඳ මල් උක් සකුරු ආදියද මුව සුවඳ කරන්නා වූ තකුල් කපුරු ආදී වූ භෛෂජ්‍ය පංචකය ද " රිසි වූ පරිද්දෙන් කර්මාන්තය කොට ඒ දෙය රිසි සේ ගනිත්වා" යි කියා තැබ්බ වූයේය. රජහුගේ කම්කරුවෝ එසේම බලා දුන්හ. . . . . . ." (මහා වංශයේ තිස්වෙනි පරිච්ජේදය)

දුටුගැමුණු මහරජතුමා විසින් ස්වර්ණමාලි සෑයට ශ්‍රමදායකත්වය සැපයූ කම්කරුවන්ට ගාස්තු ගෙවා ඇති ආකාරය ඉහත ජේදයෙන් විස්තර වේ. ඒ අනුව කම්කරුවන් තමන් කළ කාර්යයට අදාළ වටිනාකම තමන්ම තීරණය කර ඇත. තමා විසින් තීරණය කළ වටිනාකමට අදාළව රජතුමා විසින් විහාර බිම අසල තැන තැන තබා තිබූ මුදල් හා අනෙකුත් භාණ්ඩ ලබාගැනීම ඔවුන් විසින්ම සිදුකර ඇත. චෛත්‍යය ඉදිකිරීම නිමවන තෙක්ම මෙම ස්වේච්ඡා තක්සේරුව හා ගාස්තු ලබාගැනීම සිදුවී ඇත.

එවැනි ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වාගෙන යාමට තරම් එකල ලාංකිකයා සුපිළිපන්නව කටයුතු කර ඇති බව මෙයින් පැහැදිලිවේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව විසින් ඉතා පුළුල් සංවාදයක් මගින් "ශ්‍රී ලංකාවතුලින් අල්ලස සහ දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023" සකස් කරන ලද්දේඑවැනි අතීත සුපිළිපන් මිනිසුන්ගෙන් පන්නරය ලබමිණි.

ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අංගයක් වන "**සාරධර්ම පදනම් කරගත් අධ්‍යාපනය හා ප්‍රජාව සම්බන්ධකර ගැනීම**" ට අදාළ සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව උදෙසා ප්‍රකාශන තුනක් එළිදක්වා තිබේ. එනම්,

1- **තෙදින වැඩමුළු මාර්ගෝපදේශ සංග්‍රහය** - සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළු මාලාවේ පුහුණුකරුවන්, සම්පත්දායකයින් හා සංවිධායකයින් සඳහා මගපෙන්වීම.

2- **සම්පත් අත්පොත** - සුපිළිපන් පුහුණුකරුවන්ගේ විෂය දැනුම වර්ධනය කිරීම සඳහා වන විෂය කරුණු.

3- **එක්දින වැඩමුළු මාර්ගෝපදේශ සංග්‍රහය** - එක් දින පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අදාළ මගපෙන්වීම්, අත් පත්‍රිකා සහ පුහුණු මෙවලම්.

CIABOC

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

9 786245 040193